අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

වාර්ෂික වාර්තාව

2016

මුද්‍රණය : තරුණ සේවා මුද්‍රණාලය

පටුන

			පිටුව
1.	හැඳින්වීම		03
2.	දැක්ම සහ මෙහෙවර		04
3.	මණ්ඩලයේ බලතල		05
4.	මණ්ඩලයේ තොරතුරු සැකැස්ම		06
5.	සංවිධානාත්මක ව්‍යුහය		10
6.	මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ වර්තමාන ස්වභාවය		12
7.	සංස්ථා පාලනය		16
8.	ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය		17
9.	ආදායම් ප්‍රකාශය		80
10.	ශේෂ පත්‍රය		81
11.	විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්		82
12.	විගණකාධිපති වාර්තාව		85
13.	විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ		100
ඇමුණුම	i.	මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	113
	ii.	නීතිය බලාත්මක කිරීමේ අනු කමිටු සාමාජිකයෝ	116
	iii.	නීති සම්පාදක අනු කමිටු සාමාජිකයෝ	118
	iv.	ගිණුම්කරණ සටහන්	120

1. හැඳින්වීම



අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන අන්තරාදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර 1984 අප්‍රේල් මස නව වැනි දින සිට ක්‍රියාත්මක වේ. මෙම මණ්ඩලය නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතී.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම, අනිසි මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම හා පාලනය කිරීමට විවිධ ආයතන හා දෙපාර්තමේන්තුවලට සහාය දක්වමින් මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාමාර්ගවල නිරත වීම, ප්‍රතිකාර ක්‍රම හා පුනරුත්ථාපන කටයුතු ප්‍රවර්ධනය කිරීම, ක්ෂේත්‍ර පර්යේෂණ, අධ්‍යයනයන් පැවැත්වීම හා දත්ත සංචිතයන් පවත්වාගෙන යාම සිදු කරනු ලැබේ. තවද, රජය විසින් අනුමත කරන ලද එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සාක් සංවිධානය යටතේ පවතින ගිවිසුම් වල වගකීම ඉටු කිරීමට අදාල ආයතන අධීක්ෂණය හා ඒවාට සහාය දැක්වීමද මෙම මණ්ඩලය මගින් සිදු වේ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් එකී කර්තව්‍යයන් ඉටු කර ගැනීම සඳහා තාක්ෂණික සහ වෙනත් ආධාර සැපයීම, රජය හා අන්තර්ජාතික මාදක ඖෂධ පාලක මණ්ඩලය සමඟ සහයෝගීව කටයුතු කිරීම සහ මාදක ඖෂධ පිළිබඳ කොමිෂන් සභාවේ නියෝජිතත්වය දැරීම සිදු කරනු ලැබේ.

රජයේ නියමයන්ට අනුව මණ්ඩලය මගින් එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්ෂික වාර්තාවක් පිළියෙල කළ යුතු වේ.

2. දැක්ම හා මෙහෙවර

දැක්ම

මත්ද්‍රව්‍ය ආශ්‍රිත අනිසි බලපෑම් කළමනාකරණය කිරීමෙහි දකුණු ආසියාවේ පුරෝගාමීයා බවට ශ්‍රී ලංකාව රැගෙන යාම.

මෙහෙවර

මත්ද්‍රව්‍ය උවදුර සහ ආශ්‍රිත සියළු ගැටළු ඉවත් කිරීම සඳහා සියළුම සමාජ තලයන් සහ පොදු ජනතාව, අදාල ආයතන සමඟ ක්‍රියාශීලීව වැඩකරන පරිසරයක් ගොඩනැගීම.

මත්ද්‍රව්‍ය භාවිතය හා වෙළඳාම අධෛර්යමත් කරන සමාජ වාතාවරණයක් බිහිකිරීම.

මතින් තොර සමාජයක් බිහිකිරීම සඳහා ජාතික දේශපාලන සහ අන්තර්ජාතික සහයෝගය ගොඩ නැඟීම.

ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා නායකත්වය දීම අවශ්‍ය අවස්ථාවල ජාතික ප්‍රතිපත්තිය විමර්ශනය කිරීමටත් ඇගයීමටත් එය කාර්යක්ෂමව ක්‍රියා කරවීමටත් අවශ්‍ය තොරතුරු සහ දත්ත සංචිතයක් ගොඩනැගීම.

මාධක ඖෂධ පිලිබඳ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලක මණ්ඩලය සමඟ සහයෝගීව කටයුතු කිරීම

3. මණ්ඩලයේ බලතල

1984 අංක 11 දරණ පනත මගින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට පැවරී ඇති බලතලයන්

අ. අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් ගොඩ නැංවීම හා සමාලෝචනය කිරීම සහ එකී ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

ආ. මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස සාධාරණව අවශ්‍ය විය හැකි තොරතුරු සහ විස්තර පුද්ගලයන්ගෙන් සංවිධාන වලින් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වලින් සහ රාජ්‍ය සංස්ථාවලින් ඉල්ලා සිටීම

ඇ. මණ්ඩලයේ බලතල ක්‍රියාවට නැංවීම සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍ර වලින් ආධාර හා ප්‍රතිපාදන ලබා ගැනීම.

ඈ. අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැලැක්වීමේ හා පාලනය කිරීමෙහි නිරත වී සිටින ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ඉ. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම හා දරුවන් හා වැඩිහිටියන් සඳහා අන්තරායකර ඖෂධ අයුතු ලෙස භාවිතය වැළැක්වීමේ ජාතික අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.

ඊ. අන්තරායකර ඖෂධ දුර්භාවිතයේ ව්‍යාප්තිය, හේතු සාධක හා ඒ හා බැඳුණු නෛතික, වෛද්‍ය , විද්‍යාත්මක, සමාජයීය, සංස්කෘතික හා ආර්ථික කරුණු පිළිබඳ වූ පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම හා අධීක්ෂණය කිරීම.

උ. මත්ද්‍රව්‍ය පාලන කටයුතු වල නිරත වී සිටින ජාතික, ප්‍රාදේශීය හා අන්තර් ජාතික ආයතන සමග සම්බන්ධතාවයන් පවත්වාගෙන යාම.

ඌ. චංචල හෝ නිශ්චල දේපල කිසිවක් අත්කර ගැනීම, බද්දට හෝ කුළියට දීම හෝ ගැනීම, උකස් කිරීම, කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම

4. මණ්ඩලයේ තොරතුරු සැකැස්ම

සංවිධානයේ නම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

නෛතික ව්‍යුහය

1986 අංක 41 හා 1990 අංක 21 දරන පනත්වලින් සංශෝධිත 1984 අංක 11 දරන පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

මණ්ඩලයේ සංයුතිය

වර්තමානයේ මෙම මණ්ඩලය,

(අ.) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකුගෙන්ද වෙනත් සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද
(ආ.) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද
(ඇ.) පොලිස්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද
(ඈ.) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද
(ඉ.) රේගු අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද
(ඊ.) රජයේ රස පරීක්ෂක හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද
(උ.) ආයුර්වේද කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද
(ඌ.) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිතයෙකුගෙන්ද සමන්විත වේ.

මාණ්ඩලීය සාමාජිකයින් 2016

1. මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
   සභාපති
   අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

2. පූජ්‍ය තීනියාවල පාලිත හිමි
   විහාරාධිපති,
   නාලන්දාරාමය,
   නුගේගොඩ.

3. පුජ්‍ය කුප්පියාවත්තේ බෝදානන්ද හිමි,
   අධ්‍යක්ෂ
   මිතුරු මිතුරෝ සෙවණ,
   පැල්මඩුල්ල.

4. නීතීඥ වර්ණකුලසුරිය ජෝන් බොස්කෝ ශ්‍රී ලාල් ප්‍රනාන්දු මහතා
   නො. 991/21, අගරදගුරු නිකොලොස් මාර්ක්ස් මාවත,
   මීගමුව

5. සකුන්තලා තෙන්නකෝන් මහත්මිය
   රජයේ රස පරීක්ෂක
   රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
   නො.31, ඉසුරු මාවත
   පැලවත්ත
   බත්තරමුල්ල

6. නන්දන මුණසිංහ මහතා,
   නියෝජ්‍ය පොලිස්පති (අපරාධ),
   පොලිස් මූලස්ථානය,
   කොළඹ 01.

7. වෛද්‍ය කමල් ජයසිංහ මහතා
   අධ්‍යක්ෂ (රසායනාගාර සේවා),
   සෞඛ්‍ය අමාත්‍යාංශය,
   ජාතික ඖෂධ නියාමන අධිකාරිය,
   කොළඹ 10

8. එල්.එච්. තිලකරත්න මහතා
   ආයුර්වේද කොමසාරිස්
   ආයුර්වේද දෙපාර්තමේන්තුව
   පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.

9. එච්. යූ. ප්‍රේමතිලක මහතා
   අතිරේක ලේකම්
   අධ්‍යාපන අමාත්‍යාංශය
   "ඉසුරුපාය"
   බත්තරමුල්ල

10. එම්. පාස්කරන් මහතා
    අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ ඒකකය)
    ශ්‍රී ලංකා රේගුව
    නො. 40, කෙලින් වීදිය,
    කොළඹ 01

11. ප්‍රසන්න කිරිවත්තුඩුව මහතා
    සහකාර අධ්‍යක්ෂ
    රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
    මහා භාණ්ඩාගාරය
    කොළඹ 01

කාර්ය මණ්ඩලය

මණ්ඩලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව කාර්ය මණ්ඩල සාමාජිකයන් 216 කින් සමන්විත වේ.

ලිපිනය / තොරතුරු ලබා ගැනීම සඳහා

383, කෝට්ටේ පාර, රාජගිරිය.
දුරකථන අංකය 0112868794 - 6 ෆැක්ස් 0112868791 - 2, 2869805
විද්‍යුත් තැපෑල mail@nddcb.gov.lk
වෙබ් අඩවිය www.nddcb.gov.lk
මුහුණු පොත facebooknddcb.gov.lk


විගණනය

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,

නිල බැංකුව

ලංකා බැංකුව

5. සංවිධානාත්මක ව්‍යුහය



CHAIRMAN - සභාපති

HM 2-1

DG(ED) - අධ්‍යක්ෂ ජනරාල් (විධායක අධ්‍යක්ෂ)

HM 1 – 1

D (A & F) - අධ්‍යක්ෂ - පරිපාලන හා මූල්‍ය **(01)**

D (T, R & O) - අධ්‍යක්ෂ - ප්‍රතිකාර, පුනරුත්ථාපන හා බාහිරසේවා **(01)**

D (R) - අධ්‍යක්ෂ - පර්යේෂණ **(01)**

D (PE & T) - අධ්‍යක්ෂ - නිවාරක අධ්‍යපන හා පුහුණු **(01)**

MM 1-1

AD (A) - සහකාර අධ්‍යක්ෂ පරිපාලන **(01)**

AD (F) - සහකාර අධ්‍යක්ෂ මූල්‍ය **(01)**

AD (T&R) - සහකාර අධ්‍යක්ෂ ප්‍රතිකාර හා පුනරුත්ථාපන **(01)**

AD (O) - සහකාර අධ්‍යක්ෂ බාහිරසේවා **(01)**

AD (P&DTC) - සහකාර අධ්‍යක්ෂ නමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන **(01)**

AD(R) - සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ **(01)**

AD(SR) - සහකාර අධ්‍යක්ෂ විද්‍යාත්මක පර්යේෂණ **(01)**

AD(PE &T) - සහකාර අධ්‍යක්ෂ නිවාරක අධ්‍යපන හා පුහුණු **(01)**

BS/LO - මණ්ඩලයේ ලේකම් හා නීති නිලධාරී **(01)**

IA - අභ්‍යන්තර විගණක **(01)**

JM 1-1

AO - පරිපාලන නිලධාරී **(01)**

LB - පුස්තකාලයාධිපති **(01)**

FO - මූල්‍ය නිලධාරී **(01)**

M - කළමනාකරු **(06)**

C - උපදේශන නිලධාරී **(07)**

T&IO - ප්‍රතිකාර හා විමර්ශන නිලධාරී **- (03)**

RO - පර්යේෂණ නිලධාරී **(03)**

SO - විද්‍යාත්මක නිලධාරී **(04)**

DE&IO- මන්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරී (03)

MA 5 -2

CA/P - **පද්ධති විශ්ලේෂක හා වැඩසටහන් සම්පාදක (01)**

AC - සහකාර උපදේශක **(20)**

AOO - සහකාර බාහිර සේවා නිලධාරී **(05)**

ARO - සහකාර පර්යේෂණ නිලධාරී **(03)**

ASO - සහකාර විද්‍යාත්මක නිලධාරී **(01)**

AE&IO - සහකාර මන්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරී **(06)**

MA 2 – 1

ITA - තොරතුරු තාක්ෂණික සහකාර **(02)**

BK - පොත් තබන්නා **(01)**

N - හෙද නිලධාරී **(05)**

CA - උපදේශණ සහකාර **(72)**

LT - රසායනාගාර තාක්ෂණ ශිල්පී **(04)**

DE&IA - මන්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු සහකාර **(06)**

MA 1-1

MA - කළමනාකරණ සහකාර **(28)**

PL - 3

DR - රියදුරු **(14)**

PL – 2

LA - පුස්තකාල සහකාර **(01)**

PL - 1

OA - කාර්යාල සහායක **(15)**

2016.12.31ට කාර්ය මණ්ඩලය 216යි

6. මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ වර්තමාන ස්වභාවය

2016 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 79,378 කි. එය 2015 වර්ෂය හා සසඳන කල 4%ක අඩුවීමකි. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙන් හෙරොයින් වැරදි සඳහා 35%ක් ද, ගංජා ආශ්‍රිත වැරදි සඳහා 60%ක් ද වේ. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙන් බහුතරයක් බස්නාහිර පළාතෙන් ද (60%) දකුණු පළාතෙන් 9%ක් ද මධ්‍යම පළාතෙන් 10%ක් ද වාර්තා විය. අත්අඩංගුවට පත් මුළු සංඛ්‍යාවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ 43%ක් ද ගම්පහ දිස්ත්‍රික්කයේ 13%ක් ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ 4%ක් ද වේ. 2016 වර්ෂයේ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙහි ප්‍රවණතාවය ජනගහනයෙන් පුද්ගලයින් ලක්ෂයකට පුද්ගලයන් 390 දෙනෙකි.

ගංජා

ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන් වියළි කලාපයේ නැගෙනහිර, උඟව හා දකුණු පළාත් සීමාවේ ද නීත්‍යානුකූල නොවන ආකාරයට ගංජා වගාකරනු ලබයි. ගංජා වගාකර ඇතැයි සැළකෙන ඇස්තමේන්තුගත ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 500ක් පමණ වේ. අනෙකුත් වගාවන් හා සසඳා බලන කල අඩු ශ්‍රමයකින් හා අඩු වියදමකින් වගා කළ හැකි ගංජා ස්වභාවික ව්‍යවසනයන්ට ගොදුරුවන්නේ අවම වශයෙනි. ගංජා වගා කිරීම සඳහා නවතම තාක්ෂණික ක්‍රමවේදයන් භාවිත කරනු ලබයි. වර්තමානයේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් අතර දේශීය හා ඉන්දියාවෙන් නීත්‍යානුකූල නොවන ආකාරයට මෙරටට රැගෙන එන කේරළ යන ගංජා ප්‍රභේදයන් වල ඉහළ ප්‍රවණතාවයක් ඇත.

2016 වර්ෂයේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම්වලින් වැඩි ප්‍රමාණයක් (47,787) ගංජා ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට ගෙන තිබුණි. මුළු අත්අඩංගුවට ගත් ප්‍රමාණයෙන් ගංජා වැටලීම් වැඩි වශයෙන් වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි (35%). ගම්පහ දිස්ත්‍රික්කයේ 12%ක් සහ මාතර දිස්ත්‍රික්කයෙන් 3%ක් ගංජා වැටලීම් වාර්තා වේ. ගංජා සම්බන්ධ වැටලීම් බහුතරයක් ශ්‍රී ලංකා පොලිසිය විසින් සිදුකර ඇති අතර සුරාබදු දෙපාර්තමේන්තුව සහ විශේෂ කාර්ය බලකාය මඟින් ද වැටලීම් වැඩි වශයෙන් සිදුකර ඇත. ගංජා ග්‍රාමීය පළාත්වල සිට කොළඹ හා අනෙකුත් ප්‍රාදේශීය නගර සඳහා බෙදා හැරීම තුළින් ජාවාරම්කරුවන් වඩා වැඩි ලාභයක් උපයා ගනු ලබයි. වැටලීම්වලින් මඟහැරීම සඳහා ගංජා ප්‍රවාහනයට පොදු ප්‍රවාහන සේවා මෙන්ම ත්‍රීරෝද රථ, පුද්ගලික වාහන භාවිත කරනු ලබයි. මෑත කාලයේදී මත්ද්‍රව්‍ය භාවිත කර අත්අඩංගුවට පත්වූවන් අතුරින් ගංජා සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් වැඩි වී ඇති බව පැහැදිලිව පෙනේ. 2016 වර්ෂයේ දිවයින පුරා ගංජා සම්බන්ධ වැටලීම් වල මුළු ප්‍රමාණය කිලෝග්‍රෑම් 4174 ක් වේ. බස්නාහිර පළාතෙන් ගංජා වැරදි සඳහා අත්අඩංගුවට ගැනීම් 51%ක් වන අතර දකුණු පළාතෙන් 10%ක් ද, මධ්‍යම පළාතෙන් 9%ක් ද, වයඹ පළාතෙන් 8%ක් ද වේ. 2016 වර්ෂයේ ගංජා වැරදි සඳහා අත්අඩංගුවට පත්වීමේ ප්‍රවණතාවය ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයන් 235 දෙනෙකි. වර්තමානයේ ගංජා භාවිතය ශ්‍රී ලංකා සමාජය තුළ ව්‍යසනකාරී ගැටලුවක් බවට පත්ව තිබේ. මෙම ප්‍රවණතාවයත් සමඟ රට තුළ ගංජා භාවිත කරන්නන්ගේ වර්ධනයක් දැකිය හැකිය.

ගංජාවල අඩංගු විෂ ඉවත් කොට ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සඳහා යොදා ගැනේ. ආයුර්වේද වෛද්‍යවරුන් හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සමාගම් මෙහි ප්‍රධාන නීත්‍යානුකූල පරිභෝජකයෝ වෙති. 2016 වර්ෂයේ ආයුර්වේද ඖෂධ සඳහා ගංජා කිලෝ ග්‍රෑම් 332.54 ක් භාවිත කර තිබේ. 2015 වර්ෂයේ ආයුර්වේද ඖෂධ සංස්ථාව පමණක් මදන මෝදකය හා කාමේෂ්වරී මෝදකය නිෂ්පාදනය කිරීමට ගංජා කිලෝග්‍රෑම් 129.8ක් පරිභෝජනය කර ඇත.

හෙරොයින්

1970 දශකයට පෙර ශ්‍රී ලංකාවේ හෙරොයින් භාවිත කරන්නන් පිළිබඳ වාර්තාවී නොමැති අතර මෙරට හෙරොයින් භාවිතයේ ව්‍යාප්තිය සංචාරක ව්‍යාපාරයේ වර්ධනයත් සමග බැඳී පවතියි. විදේශීය ජාතිකයින් විසින් ශ්‍රී ලංකාවට හෙරොයින් හඳුන්වාදුන් බවට විශ්වාස කෙරෙන අතර 80 දශකයෙන් පසුව හෙරොයින් ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයන් හි ව්‍යාප්ත වන්නට විය. ඉන්පසුව ව්‍යවසනකාරී තත්ත්වයක් උද්ගත වූ අතර හෙරොයින් භාවිත කරන්නන් අත්අඩංගුවට ගන්නා ලදී. මූලිකවම එය භාවිත කරනු ලැබුවේ කොළඹ නගරයේ සහ පළාත් කිහිපයක නගරබදව වුවත් එය වඩාත්ම බරපතල වූයේ අනෙකුත් නාගරික හා ගම්බද ප්‍රදේශවල ව්‍යාප්ත වීමත් සමඟය. එය වර්තමානයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන සෞඛ්‍ය හා සමාජ ගැටලුවක් බවට ද පත්ව ඇත.

මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගෙන් අත්අඩංගුවට පත් බහුතරයක් තම භාවිතයට ඉතා සුළු වශයෙන් මත්ද්‍රව්‍ය ළඟ තබාගත් පුද්ගලයින් ය. ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත හෙරොයින් භාවිතා කරන්නන් 45,000ක් උදෙසා වාර්ෂිකව වීථි මට්ටමේ හෙරොයින් කිලෝග්‍රෑම් 1478 ක් අවශ්‍ය බව ඇස්තමේන්තුගත කර ඇත. එය දිනකට කිලෝග්‍රෑම් 4 ක් වේ. වැඩි වශයෙන් හෙරොයින් ලංකාවට ගෙන එනු ලබන්නේ ඉන්දියාවෙන් හෝ පකිස්ථානයෙනි. ප්‍රධාන වශයෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා දකුණු ඉන්දියාව හරහා බටහිර වෙරළ තීරයට මාළු බෝට්ටු ආධාරයෙන් සහ වෙනත් ක්‍රම මඟින් හෙරොයින් ප්‍රවාහනය කෙරේ. 2016 වර්ෂයේ කිලෝග්‍රෑම් 206ක් නීතියේ රැහැනට හසුවූ අතර පුද්ගලයින් 27,462 ක් අත්අඩංගුවට පත්විය. හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් 2015 වර්ෂය හා සසඳන කල 2016 වර්ෂයේදී 3%කින් වැඩිවී ඇත. 2016 වර්ෂයේ හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්වල ප්‍රවණතාවය ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයන් 135 දෙනෙකි.

අබිං

ශ්‍රී ලංකාවේ අබිං දුර්භාවිතයක් මේ වන විට දක්නට නොමැති අතර ප්‍රධාන වශයෙන් අබිං භාවිත වන්නේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා වන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ආයුර්වේද වෛද්‍යවරුන්ට රජයේ රෝහල් හරහා අවශ්‍ය අබිං ප්‍රමාණයන් ලබා දෙනු ලබයි. 2016 වර්ෂයේ අබිං සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයන් හතරදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

වීථි මට්ටමේ අලෙවි වන මත්ද්‍රව්‍යවල සාමාන්‍ය මිල ගණන්

2016 වර්ෂයේ හෙරොයින්වල වීථි මිලෙ හි සාමාන්‍ය අගය රුපියල් මිලියන 9 (ඇමරිකානු ඩොලර් 58,705) කි. 2015 වර්ෂය හා සසඳන කල වීථි මිල 13%කින් ඉහළ ගොස් ඇත. එනම් 2015 වර්ෂය හා සසඳා බලන කල හෙරොයින්වල වීථි මිල රුපියල් මිලියන 8 සිට මිලියන 9 දක්වා වැඩිවී ඇත. ගංජා කිලෝග්‍රෑම් 1ක වීථි මිලෙහි සාමාන්‍ය අගය රුපියල් 22,000ක් (ඇමරිකානු ඩොලර් 143.5) ක් වේ. 2016 වර්ෂයේදී අබිං කිලෝග්‍රෑම් එකක මිල රුපියල් මිලියන 1.5 ක් වේ (ඇමරිකානු ඩොලර් 9784).

හෙරොයින්වල ශුද්ධතා අගයෙහි සාමාන්‍ය (ඩයි ඇසිටයිල් මෝර්ෆීන් ප්‍රතිශතය)

2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වීථි හෙරොයින්වල ඩයි ඇසිටයිල් මෝර්ෆීන් ප්‍රමාණයෙ හි සාමාන්‍ය අගය 17.87%ක් විය. 2015 වර්ෂය හා සසඳන කල එය 16%කින් ඉහළ ගොස් ඇත. හෙරොයින් වලට මිශ්‍රකාරක වශයෙන් සාමාන්‍යයෙන් ඩයිසිෆෑම්, ඇසිටමිනෝෆීන් (පැරසිටමෝල්) සහ කැෆේන් භාවිත කරනු ලබයි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ජාතික මාදක රසායනාගාරය වීථි මට්ටමේ විකිණීමට ඇති මත්ද්‍රව්‍ය සාම්පල පරීක්ෂා කරන අතර එම සාම්පලවල අන්තර්ගතයන් හඳුනාගැනීම පිළිබඳ විශ්ලේෂණ සිදුකරනු ලබයි.

මනෝවර්තක ඖෂධ/ද්‍රව්‍ය අවභාවිතය

මනෝවර්තක ගණයේ ඖෂධ/ද්‍රව්‍ය අවභාවිත කිරීම ශ්‍රී ලංකාව තුළ සැළකිය යුතු ගැටලුවක් බවට පත්වෙමින් තිබේ. වෛද්‍යමය හේතූන් මත හෝ හෙරොයින් වෙළඳපොළේ නොමැති විට විරමණ ලක්ෂණ මඟහරවා ගැනීම සඳහා මෙම මනෝවර්තක ද්‍රව්‍ය හෙරොයින් භාවිත කරන්නන් විසින් භාවිත කරයි. කෙසේ වෙතත් මෙම මනෝවර්තක ඖෂධ වෛද්‍ය නිර්දේශයක් නොමැතිව නිකුත් කිරීම තහනම් වුවත් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මේවා වෙළඳපොළෙ හි ලබා ගැනීමේ පහසුව ඇත. 2016 වසර තුළ මනෝවර්තක ද්‍රව්‍ය හා වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඇතැම් ඖෂධ වර්ග තරුණයින් විසින් දුර්භාවිත කිරීමේ යම් ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය. වාර්තා වන සිද්ධීන් සහ දත්ත වලට අනුව බස්නාහිර පළාත තුළ මේ සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවයක් පවත්නා බව හඳුනා ගත හැකිය. 2016 වර්ෂය තුළ ඖෂධ වර්ග දුර්භාවිතය සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද වැටලීම් වලට අනුව නීත්‍යානුකූල නොවන ආකාරයට ට්‍රැමඩෝල් නැමති වේදනා නාශක පෙති (Tramadol) ළඟ තබා ගැනීමේ සහ බෙදා හැරීමේ සිද්ධීන් රැසක් වාර්තා වී ඇත. අත්අඩංගුවට පත්ව ඇති පුද්ගලයින් අතර විදේශීය ජාතිකයින් ද සිටින අතර බහුතරයක් සිද්ධීන් කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වී ඇත.

මත්ද්‍රව්‍ය ප්‍රවාහනය

නීතිය බලාත්මක කිරීමේ ආයතන මඟින් අත්අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය ප්‍රමාණයන් නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ මට්ටම නිර්ණය කරනු ලබන එක් දර්ශකයකි. ශ්‍රී ලංකාව මත්ද්‍රව්‍ය ප්‍රවාහනයේ කේන්ද්‍රස්ථානයක් වන අතර පකිස්ථානය හා ඉන්දියාවෙන් රැගෙන එන මත්ද්‍රව්‍ය යුරෝපීය හා බටහිර රටවල්වලට ප්‍රවාහනය කරනු ලබයි.

පසුගිය අවුරුදු පහ සළකා බලන කල, හෙරොයින් අත්අඩංගුවට ගැනීම් හා සම්බන්ධ තොරතුරුවලට අනුව නිරීත දිග ආසියානු හෙරොයින් (දුඹුරුහෙරොයින්) ප්‍රධාන වශයෙන් ජාවාරම් කෙරෙනුයේ ඉන්දියාවෙන් හා පකිස්ථානයෙන් බව අනාවරණය වේ. පසුගිය අවුරුදු පහේදී විදේශීය ජාතිකයින් 186 ක් ශ්‍රී ලංකාවේදී අත්අඩංගුවට ගන්නා ලදී. මේ අතර ඉන්දියානු ජාතිකයන් 58 ක් විය. 2016 වර්ෂයේදී ශ්‍රී ලාංකිකයන් 5 දෙනෙකු විදේශීය රටවලදී අත්අඩංගුවට පත්විය. ඔවුන් අත්අඩංගුවට ගන්නා ලද්දේ ඉන්දියාව හා මලයාසියාව වැනි රටවලදී ය.

ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවය

ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූවන් සඳහා නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ශ්‍රී ලංකාවේ 2007 අංක 54 දරන ප්‍රතිකාර හා පුනරුත්ථාපන පනත යටතේ මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් සඳහා අනිවාර්ය ප්‍රතිකාර පහසුකම් හඳුන්වා දී ඇත. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා නේවාසික ප්‍රතිකාර මධ්‍යස්ථාන 4ක් ක්‍රියාත්මක කරන අතර මෙම මධ්‍යස්ථාන කොළඹ, නුවර, ගාල්ල, නිට්ටඹුව යන ස්ථානවල පිහිටා ඇත. මීට අමතරව බාහිර සේවා වැඩසටහන් ද ක්‍රියාත්මක වේ.

මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානයන් හි මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. මෙම ප්‍රතිකාර වැඩසටහන් වල පුද්ගලික හා පවුල් උපදේශනය ද විෂ හරණ ප්‍රතිකාර, ශාරීරික ක්‍රියාකාරකම්, මානසික සුවතා, ගෘහස්ථ හා බාහිර ක්‍රියාකාරකම්, මනෝ චිකිත්සක ප්‍රතිකාර, අධ්‍යාපනික, වෘත්තිය පුහුණු, කුසලතා සංවර්ධන වැඩසටහන් ද අන්තර්ගත වේ.

2016 වර්ෂයේ මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ සේවාලාභීන් 2355 දෙනෙකුට ප්‍රතිකාර සේවාවන් ලබාගෙන ඇත. එම සේවාලාභීන්ගෙන් 826 (35%) දෙනෙක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන් ද, 684 (29%) බන්ධනාගාර ප්‍රතිකාර වැඩසටහනින් ද, 474 (20%) රාජ්‍ය නොවන සංවිධානවලින් ද, 371 (16%) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන් ද ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබාගෙන ඇති අතර එම සේවාලාභීන්ගෙන් බහුතරයක් (51%) ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් ආයතනගත වූවන් ය. ප්‍රතිකාර ලබාගත් පුද්ගලයන්ගෙන් 62% ක් අවුරුදු 30 හෝ ඊට වැඩි පුද්ගලයින් වෙති. 2015 වර්ෂය හා සැසඳීමේදී 2016 වර්ෂය තුළ ප්‍රතිකාර සඳහා යොමු වූ සේවාලාභීන් සංඛ්‍යාව 59% කින් වැඩි වී ඇත.

බන්ධනාගාර ගතවීම්

2016 වර්ෂයේදී මත්ද්‍රව්‍ය හේතුවෙන් බන්ධනාගාර ගතවූ මුළු පුද්ගලයන් සංඛ්‍යාව 24060 කි. ඔවුන් අතුරින් විෂ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා පුද්ගලයින් 10535 දෙනෙක් බන්ධනාගාර ගත වී ඇත. එය මුළු බන්ධනාගාර ගතවීම් වලින් 44% ක් වේ. 2016 වර්ෂය තුළ ගංජා සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයින් 2739 (26%) ක් ද හෙරොයින් සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයන් 7783 (74%)ක් ද බන්ධනාගාර ගතවී ඇත. 2015 වර්ෂය හා සැසඳීමේදී 2016 වර්ෂයේදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා බන්ධනාගාර ගතවීම් 6%කින් අඩු වී ඇත.

එච්-අයි-වී- /ඒඩ්ස්

මත්ද්‍රව්‍ය එන්නත් කරගැනීම තුළින් එච්.අයි.වී ආසාදනය වීමේ අවදානමක් පවතී. එන්නත් කරගන්නා උපකරණ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් අතර හුවමාරු කරගැනීම තුළින් ලේ හුවමාරුවීමෙන් යම් පුද්ගලයෙකුට එච්.අයි.වී. / ඒඩ්ස් වැළඳිය හැකිය. ලංකාවේ පළමු වරට එච්.අයි.වී. ආසාදිත පුද්ගලයෙකු වාර්තා වූයේ 1987දී ය. නිල වාර්තාවලට අනුව 2016 වසර වන විට එච්.අයි.වී. ආසාදිත පුද්ගලයන් 2557 ක් වාර්තා වී ඇති අතර මෙයට පිරිමි 1640ක් සහ ගැහැණු 917ක් ඇතුළත් ය. පසුගිය වසරේ වාර්තාවීම් අනුව බලන විට 2016 වසරේදී වාර්තා වූ ගැහැණු සංඛ්‍යාව 6%කින් ද, පිරිමි සංඛ්‍යාව 10%කින් ද වැඩිවී ඇත. 2015 වන විට ඒඩ්ස් වැළඳුන පුද්ගලයින්ගේ සංඛ්‍යාව 656 කි. ඒ අතර පිරිමි 456 ක් හා ගැහැණු 200 දෙනෙක් වූහ. 2016 වන විට ඒඩ්ස් වැළඳී මියගිය මුළු පුද්ගල සංඛ්‍යාව 414 ක් වන අතර 2016 වර්ෂය තුළදී පමණක් 47 දෙනෙකු මිය ගොස් තිබුණි.

නීතිය ක්‍රියාත්මක වීම

ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශය, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාරය, ශ්‍රී ලංකා රේගුව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ත්‍රිවිධ හමුදාව වැනි නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් 2016 වර්ෂය තුළදී මත්ද්‍රව්‍ය වැරදි සඳහා නීතිය ක්‍රියාත්මක කරන ලදී. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මත්ද්‍රව්‍ය නීති ක්‍රියාත්මක කිරීමේ කමිටුව මඟින් නීති සම්බන්ධීකරණ කටයුතු කරන අතර නව නීති සැකසීම, ප්‍රතිපත්ති සැලසුම් කිරීම දිවයින පුරා නීතිය ක්‍රියාත්මක කිරීම බලගැන්වීමෙ හි නිරතව සිටී. මීට අමතරව මණ්ඩලය බන්ධනාගාර දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන මෙන්ම වෙනත් රාජ්‍ය නොවන ආයතන සමග සම්බන්ධීකරණය කරමින් මත්ද්‍රව්‍ය ප්‍රතිකාර පුනරුත්ථාපන කාර්යභාරය ක්‍රියාත්මක කරනු ලැබේ.

මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ

මත්ද්‍රව්‍ය භාවිතය සමාජ හා සෞඛ්‍ය ගැටලු ඇති කරවන සමාජ ප්‍රපංචයක් වන අතර කාලීනව වාර්තා වන සුළු හා මහාපරිමාණ අපරාධ සිද්ධීන් පිළිබඳව විමර්ශනය කිරීමේදී පැහැදිලි වන කරුණක් නම් මත්ද්‍රව්‍ය භාවිතය හා අපරාධ අතර අන්තර් සම්බන්ධතාවයක් හඳුනා ගත හැකි බවයි. කොළඹ අපරාධ කොට්ඨාශයේ අපරාධ පිළිබඳ වාර්ෂික දත්ත වලට අනුව 2016 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ සුළු හා මහාපරිමාණ අපරාධ සිද්ධීන් 1762 ක් වාර්තා වී ඇත. ඒ අතුරින් බස්නාහිර පළාතෙන් මත්ද්‍රව්‍ය හා සම්බන්ධ අපරාධ සිද්ධීන් 1140 (65%) ක් මධ්‍යම පළාතෙන් අපරාධ සිද්ධීන් 168 (10%) ක් සහ දකුණු පළාතෙන් අපරාධ සිද්ධීන් 81 (5%) ක් වාර්තා වී ඇත.

07. සංස්ථා පාලනය

මණ්ඩලයේ යහපාලනය සඳහා අයවැය දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද උපදෙස් මාලාව යටතේ කළමණාකරණය වේ. මෙයට අමතරව මණ්ඩලය විසින් සම්පාදනය කරන විශේෂිත උපදෙස් මාලාවක් හා ආයතනික සංග්‍රහය අදාළ කර ගනී.

මණ්ඩලය

මණ්ඩලයේ සභාපති ඇතුළු පත් කරන ලද සාමාජිකයන් 04 දෙනෙකුගෙන් සහ නිල බලයෙන් පත්වන සාමාජිකයන් 06 දෙනෙකුගෙන් සමන්විත වේ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනතට අනුව මණ්ඩලය මාසිකව රැස්වේ.

අනු කමිටු

යහපාලනය සඳහා පොදු ව්‍යවසාය උපදෙස් මාලාවට අනුව මණ්ඩලය විසින් පත්කරන ලද විගණන හා කළමණාකරණ කමිටුවක් වේ.

මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතන වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වන නීතිය බලාත්මක කිරීමේ අනුකමිටුව ශ්‍රී ලංකාවෙන් මත්ද්‍රව්‍ය උවදුර දුරු කිරීමට සහ හැකිතාක් දුරට මත්ද්‍රව්‍ය සැපයීම සහ දුර්භාවිතය අවම කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට සහ ශක්තිමත් කිරීමට අවශ්‍ය වැදගත් තීන්දු තීරණ ගනිමින් ඉතා කාර්යක්ෂම කමිටුවක් ලෙස කටයුතු කරනු ලැබේ.

මණ්ඩලයේ නීති සම්පාදක අනුකමිටුව කලින් කලට මත්ද්‍රව්‍ය සැපයුම් සහ දුර්භාවිතාව පිළිබඳව ලෝකයේ ඇති වන ප්‍රවණතාවයන්ට මුහුණ දීමට උචිත ලෙස ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය වඩාත් ශක්තිමත් කිරීම සඳහා පවතින නීති හා රෙගුලාසි සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම මෙන්ම නව නීති රෙගුලාසි ගෙන ඒම සඳහා ද කටයුතු කරනු ලැබේ.

08. ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය

8.1 මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන සහ පුහුණු අංශය

මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය යනු ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ප්‍රමුඛතම සහ සක්‍රීයම මැදිහත් වීම ලබා දෙන අංශයයි.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිය සහ ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව මත්ද්‍රව්‍ය දුර්භාවිතාවේ ව්‍යාප්තිය අවම කිරීම සහ මත්ද්‍රව්‍ය මඟින් ඇති වන හානිය අවම කිරීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම ඉටු කරලීම සඳහා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය තම සක්‍රීය දායකත්වය ලබා දෙයි.

මත්ද්‍රව්‍ය දුර්භාවිත චර්යා නිවාරණය සඳහා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, යෞවන යෞවනියන් , විශ්ව විද්‍යාල සිසු සිසුවියන් ,රාජ්‍ය හා රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතනවල සේවය කරනු ලබන වෘත්තිකයින් සහ මහජනතාව, මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු වීමට බලපාන අවදානම් සාධක වෙත සුවිශේෂී අවධානයක් යොමු කරමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීමේ අවශ්‍යතාව නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය හඳුනාගෙන ඇත.

මහජනතාව තුළ පවතින මත්ද්‍රව්‍ය කෙරෙහි ඇති ඉල්ලුම අවම කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් යාවත්කාලීන වැඩසටහන් මාලාවක් සැළසුම් කර ඇති අතර අප අංශයේ කාර්ය මණ්ඩලය විෂය හා වෘත්තීය නිපුණතාවයන්ගෙන් යුතුව ගුණාත්මක වැඩසටහන් ප්‍රජාවට ඉදිරිපත් කිරීමට බැඳී සිටී.

2016 වසර තුළ සුවිශේෂී ප්‍රගතියක් සනිටුහන් කරමින් දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩය සමාජ ගත කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට හැකියාව ලැබී ඇත.

පාසල් සිසුන් සඳහා නිවාරක අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

පාසල් සිසුන් සඳහා වන ඵලදායී මත්ද්‍රව්‍ය නිවාරන වැඩසටහන් මඟින් එම සිසුන්ගේ මත්ද්‍රව්‍ය වලින් සිදු වන හානිය පිළිබඳ දැනුම වර්ධනය සහ මත්ද්‍රව්‍යය සඳහා ඇති ඉල්ලුම අවම කිරීමේ හැකියාව පවතින බව පර්යේෂණයන් මඟින් සනාථ කරන ලද කරුණකි.

මෙම අවබෝධයෙන් යුතුව නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය වැඩි අවධානයක් පාසල් සිසුන් වෙත යොමු කරයි.

පාසැල් සිසුන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අධ්‍යාපන න්‍යායන් මත පදනම්ව සංස්කෘතික සංවේදීතාවයකින් යුතුව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිතව සංවිධානය කරනු ලබයි.

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් මඟින් අවධානය යොමු කරනුයේ ජීවන කුසලතා සංවර්ධනය තුළින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ මත්ද්‍රව්‍ය ප්‍රතික්ෂේප කිරීමේ කුසලතාවය වැඩි දියුණු කිරීම හරහා මත්ද්‍රව්‍ය නිවාරණය සිදු කිරීමයි.

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය පාසල් සිසුන් වෙනුවෙන් පවත්වන ලද නිවාරණ වැඩසටහන් මඟින් අත් කර දුන් ප්‍රගතිය සංඛ්‍යාත්මකව පහත දැක්වේ.

2016 වසර ආරම්භයේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය පාසල් සිසුන් සඳහා වැඩසටහන් 500 ක් පැවැත්වීමට ඇස්තමේන්තු කරන ලද අතර 2017 වසර අවසානයේ වැඩසටහන් 607 ක් පැවැත්වීමට සමත්ව ඇත. එය අපේක්ෂිත වැඩසටහන් වලට සාපේක්ෂව වැඩසටහන් 107 ක වර්ධනයකි. ප්‍රතිශතයක් ලෙස එය 121.4% වර්ධනයක් පෙන්නුම් කරයි. 2016 වසර සඳහා වැඩසටහන් තුළින් ආවරණය කිරීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවේ ඉලක්කය 130 000 වූ අතර, වසර අවසානයේදී ආවරණය කරන ලද සිසුන් සංඛ්‍යාව 120,876කි. එය ප්‍රතිශතයක් ලෙස 92.98%කින් ඉලක්කය කරා ලඟා වීමක් ලෙස දැක්විය හැකිය.

2015 වසර තුළ පාසල් සිසුන් සඳහා වැඩසටහන් 564ක් පවත්වා ඇති අතර ආවරණය කරන ලද සිසුන සංඛ්‍යාව 99,956කි. 2016 වසරේ පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව වන 607 හා සැසඳීමේදී එය 2015 වසරට සාපේක්ෂව 107.6% ප්‍රගතියක් පෙන්නුම් කරයි. 2016 වසරේ ආවරණය කරන ලද සිසුන් සංඛ්‍යාව 2015 වසරට සාපෙක්ෂව 120.92% ක ප්‍රගතියක් සනිටුහන් කරයි.

ජාත්‍යන්තර පාසල් සිසුන් සඳහා නිවාරණ හා පුහුණු වැඩසටහන්

රජයේ පාසල් වලට අමතරව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් වල සැලකිය යුතු වර්ධනීය තත්වයක් වර්තමානය වන විට දක්නට ලැබේ. මෙම තත්වය අවබෝධ කරගනිමින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් කාලීන අවශ්‍යතාවයන්ට ආමන්ත්‍රණය කිරීමට සමත් නිවාරණ වැඩසටහන් මාලාවක් ජාත්‍යන්තර පාසල් තුල අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉලක්ක කරමින් ක්‍රියාත්මක කරන ලදී.

තම දරුවන්ට ගෝලීය අවශ්‍යතාවයන්ට සරිලන අධ්‍යාපනික අවස්ථා උදා කර දීමේ අරමුණින් බොහෝ දෙමාපියන් මෙම පාසල් වෙත දරුවන් යොමු කිරීමට වැඩි නැඹුරුවක් දක්වයි.

මෙම අවශ්‍යතාවයන් අවබෝධ කර ගනිමින් නිවාරක අධ්‍යාපන පුහුණු අංශය මඟින් අධ්‍යාපන න්‍යායන් මත පදනම් වූ ක්‍රියාකාරී අධ්‍යාපන වැඩසටහන් මාලාවක් ජාත්‍යන්තර පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉලක්ක කොට ගනිමින් ක්‍රියාත්මක කරන ලදී.

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2016 වසර තුළ ජාත්‍යන්තර පාසල් සඳහා පැවැත්වීමට අපේක්ෂා කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 10 ක් වූ අතර වසර අවසන් වන විට වැඩසටහන් 17 ක් පැවැත්වීමට සමත්ව ඇත. එය 170% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

ජාත්‍යන්තර පාසල්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2760 ක් 2016 වසර තුළ ආවරණය කර ඇති අතර එය අපේක්ෂිත සිසුන් සංඛ්‍යාව වූ 2000 ට සාපේක්ෂව 138% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා තෘතීයික අධ්‍යාපන ආයතනයන්හි මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

1995 වසරේදී ආරම්භ වන තෘතියික පුහුණු අධිකාරිය මඟින් ශ්‍රී ලංකාවේ රැකියා වෙළඳ පොලට සරිලන පුහුණු ශ්‍රමිකයන් හා වෘත්තිකයන් බිහි කිරීමේ අරමුණින්, පාසැල් අධ්‍යාපනය නිම කළ දරුවන් උදෙසා ග්‍රාමීය ප්‍රදේශ වල දරුවන්ට පහසුවෙන් ලඟා විය හැකි පරිදි වෘත්තීය පුහුණු පාඨමාලාවන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනු ලබයි. පාසැල් අධ්‍යාපනය නිම කර විශ්ව විද්‍යාල අධ්‍යාපන වරම් නොලබන දරුවන් සඳහා කුසලතා වර්ධනය තුළින් උපාධි මට්ටම කරා ළඟා වීමට අවශ්‍ය පහසුකම් සැලසීම මෙහි අරමුණයි. මෙහිදී ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වෘත්තීය හා තෘතියික අධ්‍යාපන ආයතනවලට ඇතුළත් වන දරුවන් තුළ ජීවන කුසලතාවන් සංවර්ධනය කරමින් නිවාරණ අධ්‍යාපනය තුලින් බලගැන්වීම අරමුණු කොට වැඩසටහන් මාලාවක් පසුගිය වසර තුල ක්‍රියාවට නැංවීය.

මෙම වැඩසටහන් මාලාව මඟින් 2016 වසර තුළදී සියළුම ප්‍රදේශ වල වෘත්තීය හා තෘතියික අධ්‍යාපන ආයතන වල පුහුණුව ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩය ගෙන යාමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් විය.

මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් 2016 වසර ආරම්භයේදී වෘත්තීය හා තෘතියික අධ්‍යාපන ආයතන සඳහා පැවැත්වීමට අපේක්ෂිත වැඩසටහන් සංඛ්‍යාව 150 ක් වූ අතර ආවරණය කිරීමට අපේක්ෂිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව 22 000 ක් විය. 2016 වසර අවසන් වන විට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් වැඩසටහන් 125 ක් පවත්වා ඇති අතර සිසුන් 12 722ක් එම වැඩසටහන් මඟින් ආවරණය කර ඇත. අපේක්ෂිත ඉලක්කය සහ ළඟා වූ ඉලක්කය සැසඳමේදී ප්‍රතිශතය ලෙස වැඩසටහන් සඳහා 83.33% ක්ද ආවරණය කරන ලද සිසුන් සංඛ්‍යාව 58.05% ක්ද ලෙසද දැක්විය හැකිය.

2015 වසර හා 2016 වසර සැසඳීමේදී 2015 වසර තුළ වෘත්තීය හා තෘතියික අධ්‍යාපන ආයතන සඳහා වැඩසටහන් 87ක් පවත්වා ඇති අතර 2016 වසර තුළ එය සංඛ්‍යාව 125 ක් දක්වා වර්ධනය කර ගැනීමට සමත්ව ඇත. එය 2015 වසරට සාපේක්ෂව 143.675% ක වර්ධනයකි. 2015 වසර තුළ ආවරණය කරන ලද සිසුන් සංඛ්‍යාව 8170ක් වන විට 2016 වසරේ සිසුන් 12772 ක් ආවරණය කර ඇත. ඒ අනුව 2016 වසර තුල 2015 වසරට වඩා සිසුන් 4602ක් ආවරණය කර ඇත.

මුල් ළමා විය සංවර්ධනය සහ මත්ද්‍රව්‍ය නිවාරණ උදෙසා දෙමාපිය දැනුවත් කිරීමේ වැඩසටහන්

නව යෞවනයන් තුළ ප්‍රකට වන මත්ද්‍රව්‍ය භාවිතය සහ අනෙකුත් ගැටළු සහගත පුද්ගල චර්යාවන්හි මූලයන් බොහෝවිට පූර්ව ප්‍රසව අවදිය තුළ සිදු වූ වර්ධනයන්හි දුර්වලතා දක්වා දිව යන බව පර්යේෂකයින් හඳුනා ගෙන ඇත. මේ අනුව මත්ද්‍රව්‍ය නිවාරණය ඕනෑම වයස් මට්ටමකදී යොදා ගත හැකි වුවද, මුල් ළමා වියේදී එනම් පුද්ගල සංවර්ධනය වේගවත්ව සිදු වන හා ඉතා පහසුවෙන් ධනාත්මක චර්යාවන් නිර්මාණය කිරීම කළ හැකි අවධියේදී මෙම ප්‍රවේශයන් දෙමාපියන් වෙත හඳුන්වා දීම දීර්ඝකාලීන ප්‍රතිඵල ජනනය කරයි.

මුල් ළමා වියේදී ආරක්ෂක සාධක වර්ධනය කිරීමට හා අවධානම් සාධක අඩු කිරීමට අවශ්‍ය මැදිහත්වීම වැඩි දියුණු කිරීම මෙම වැඩසටහන් මාලාවේ අරමුණයි. මෙම වැඩසටහන් මඟින් පහත වර්ධනීය වෙනස්කම් ඇති වන බව පර්යේෂකයින් විසින් තහවුරු කර ඇත.

- මුල් ළමා විය තුලදී මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග දීර්ඝ කාලීන ධනාත්මක ප්‍රතිඵල ජනනය කිරීම. එමෙන්ම එමඟින් පුළුල් චර්යාත්මක වෙනස්කම් ඇති කරනු ලැබීම

- මුල් ළමා විය තුළ කරනු ලබන මැදිහත් වීම් මඟින් දරුවන්ගේ ජීව විද්‍යාත්මක ක්‍රියාකාරීත්වය කෙරෙහි ධනාත්මක ලෙස බලපානු ලැබීම

මෙම කරුණු පාදක කොට ගෙන මුල් ළමා විය යටතට සලකනු ලබන පූර්ව ප්‍රසව අවධිය, බිළිඳු අවධිය හා සිඟිති අවධිය (උපතේ සිට අවු.3 දක්වා) , පෙර පාසැල් අවධිය (අවු 3-5) හා පාසැල කරා යොමු වන අවධිය අවු. 6-9) තුළ අවු. 8,9 දරුවන්ගේ පෞර්ෂ සංවර්ධනයට අවශ්‍ය සාධක සම්පාදනය කිරීම සඳහා දෙමාපියන් බල ගැන්වීම මෙම වැඩසටහන මඟින් සිදු කරන ලදී.

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් 2016 වසර සඳහා ඉලක්ක ගත මුල් ළමාවිය සංවර්ධන සහ මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා දෙමාපිය දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 10ක් වූ අතර වසර අවසන් වන විට වැඩසටහන් 17ක් නිම කිරීමට අංශය සමත්ව ඇත. එය 178%ක ප්‍රගතියක් කරනු ලබයි.

2016 වසරේ ආවරණය කිරීමට බලාපොරොත්තු වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2000ක් වූ අතර වසර අවසානයේ වැඩසටහන් වලින් ප්‍රතිලාභ ලද සංඛ්‍යාව 2760කි. අපේක්ෂිත ඉලක්කය සහ ලඟා වූ ස්ථානය සැලකීමේදී 138% වර්ධනයක් මුල් ළමාවිය සංවර්ධනය සහ මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 108ක් පවත්වා ඇති අතර 10 634 ක් ආවරණය කර ඇත. එම සංඛ්‍යාව 2016 වසර හා සැසඳීමේදී වැඩසටහන්හි 15.7%ක ප්‍රතිශතයක්ද ආවරණය කරන ලද ප්‍රමාණය 25.9%ප්‍රතිශතයක්ද පෙන්නුම් කරයි.

විශ්ව විද්‍යාල සිසුන්ගේ මත්ද්‍රව්‍ය අධ්‍යාපනය ඉහළ නැංවීමේ වැඩසටහන්

විශ්ව විද්‍යාලයට පිවිසෙන නවකයන් බොහෝ දෙනෙකු නිවසින් හා දෙමාපියන්ගෙන් ඈත් වීම, නව පරිසරයකට සහ පුද්ගලයින්ට හැඩ ගැසීමේ අවශ්‍යතාවය, විශ්ව විද්‍යාල පරිසරය තුළ නවකයන් හට මුහුණ දීමට සිදු වන නව්‍යකරණ වැඩසටහන් වලට නතු වීම හා මෙන්ම නව සමාජ කණ්ඩායම් ගොඩනඟා ගැනීම විවිධ මානසික ගැටළු වලට යොමු වීමේ අවධානමක් ඇත. මෙම තත්වය තුළ බොහෝ විශ්ව විද්‍යාල සිසුන් මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට මෙන්ම මත්ද්‍රව්‍ය භාවිත කිරීමට යොමු වීමේ ප්‍රවණතාවයක් නිර්මාණය වී තිබේ.

මෙම අවදානම අවබෝධ කර ගනිමින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් තාරුණ්‍යයේ අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කිරීමට සමත් න්‍යායාත්මක කරුණු මත පදනම්ව සකස් කරන ලද නිවාරණ අධ්‍යාපන වැඩසටහන් මොරටුව විශ්ව විද්‍යාලය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, කොළඹ විශ්ව විද්‍යාලය හා කැළණිය විශ්ව විද්‍යාලය ඇතුළු දිවයින පුරා විසිරුනු විශ්ව විද්‍යාල තුළ ක්‍රියාත්මක කරන ලදී.

2016 වසර ආරම්භයේ ඉලක්ක කරන ලද විශ්ව විද්‍යාල සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සංඛ්‍යාව 10ක් වූ අතර වසර අවසන් වන විට වැඩසටහන් 15ක් පැවැත්වීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇත. එය ඉලක්ක සාක්ශාත් කිරීමේදී 150%ක වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි.

වසර තුළ ආවරණය කිරීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව 3000ක් වූ අතර,වසර අවසන් වන විට සිසුන් 3740ක් ආවරණය කරමින් 124.66% ප්‍රගතියක් ලබා ගැනීමට සමත්ව ඇත.

2015 වසර තුල විශ්ව විද්‍යාල සඳහා පවත්වා ඇති වැඩසටහන් සංඛ්‍යාව 8ක්වන අතර ආවරණය කර ඇති සිසුන් සංඛ්‍යාව 2315කි. ඒ හා සැසඳීමේදී 2016 වසර තුළ වැඩසටහන්හි වර්ධනය 137.5%ක් වන අතර ආවරණය කරන ලද විශ්ව විද්‍යාලය සිසුන් සංඛ්‍යාව සැසඳීමේදී මෙම වසර තුළ 161.55% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

දහම් පාසැල් දරුවන් හා ගුරුවරුන් සඳහා වන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

සාරධර්ම වලින් සපිරි අනාගත දරු පරපුරක් පෙරදැරි කර ගෙන නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් 2016 වසර තුළ බුද්ධ ශාසන හා බෞද්ධ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය තුළ ලියාපදිංචි වී ඇති සෑම ආගමකටම අයත් පූජනීය ස්ථාන කේන්ද්‍ර කර ගත් නිවාරණ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී.

මෙම වැඩසටහන් තුළදී පන්සල්, පල්ලි හා කෝවිල් ආශ්‍රිතව ක්‍රියාත්මක වන දහම් පාසැල් තුල අධ්‍යාපනය ලබන සිසුන් සහ ආචාර්ය මණ්ඩලය මත්ද්‍රව්‍ය මඟින් ඇති කරන හානි පිළිබඳව දැනුවත් කරන ලදී.

මෙම පරමාර්ථ කරා ලඟා වීම සඳහා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් 2016 වසර තුළ දිවයිනේ දහම් පාසැල් විශාල ප්‍රමාණයක් ආවරණය කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

2016 වසර සඳහා දහම් පාසැල් ආවරණය කරමින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශ්‍ය මඟින් පැවැත්වීමට අපේක්ෂා කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 30කි. වසර අවසන් වන විට වැඩසටහන් 38ක් පැවැත්වීමට නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය සමත් වී ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 128.66% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි.

දහම් පාසැල් වැඩසටහන් තුළින් ආවරණය කිරීමට බලාපොරොත්තු වුණු සිසුන් සංඛ්‍යාව 600ක් වන විට 2016 වසර තුළ ආවරණය කිරීමට හැකි වී ඇති සිසුන් 579ක සංඛ්‍යාවකි. එය 96.5%කින් අපේක්ෂිත ඉලක්කය කරා ලඟා වීමක් ලෙස හැඳින්විය හැකිය.

2016 වසරේ මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන සහ පුහුණු අංශය දහම් පාසැල් සඳහා ඉලක්ක ගත කර ඇති වැඩසටහන් සංඛ්‍යාව පැවැත්වීම හේතුවෙන් 2015 වසරට සාපේක්ෂව නිම කර ඇති වැඩසටහන් සංඛ්‍යාව අඩු අගයක් ගනී.

රාජ්‍ය නිළධාරීන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

රාජ්‍ය සේවයේ නියතුවන්නන්ගේ කාර්යක්ෂමතාව හා ජීවන යහපැවැත්මේ ගුණාත්මක බව වර්ධනය කිරීමේ අරමුණින් මත්ද්‍රව්‍යට යොමු වීම සඳහා බලපාන අවදානම් සාධක අවම කර ගැනීමට අවශ්‍ය මත්ද්‍රව්‍ය අධ්‍යාපනය ලබා දීම උදෙසා මෙම වැඩසටහන් මාලාව ක්‍රියාවට නැංවීය. රාජ්‍ය සේවයේ නියතුවූවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමත් සමඟ සෞඛ්‍ය ගැටළු, මූල්‍ය අර්බුද, රැකියා අතෘප්තිය, මානසික සෞඛ්‍ය බිඳ වැටීම, කාර්යක්ෂමතාව අඩු වීම හා පෞද්ගලික ජීවිතයේ බිඳ වැටීම් ඇති වීම වැනි කායික, මානසික, සමාජීය හා ආර්ථික අර්බුද ගණනාවකට මුහුණ දීමට සිදුවේ. මෙම ගැටළු මඟ හරවා ගනිමින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්වීම උදෙසා මෙන්ම මත්ද්‍රව්‍යයට යොමු නොවීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම කෙරෙහි මෙම වැඩසටහන් මාලාව තුළින් අවධානය යොමු කරන ලදී.

මීට අමතරව මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය දායකත්වය රාජ්‍ය අංශය තුළ රාජකාරි කටයුතු වල නිරත වන ක්ෂේත්‍ර නිළධාරීන් තුළින් ලබා ගැනීම සඳහා අවශ්‍ය න්‍යායාත්මක දැනුම ඔවුන් වෙත ලබා දීම වෙනුවෙන් මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු වැඩසටහන් මාලාවක් 2016 වසර තුළ දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදී. මෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ පුහුණුව ලද රාජ්‍ය නිළධාරීන් මඟින් මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩය බිම් මට්ටම කරා ගෙන යාමයි. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය අධ්‍යාපන මැනුවල පදනම් කරගෙන කාලීන අවශ්‍යතාවයන්ට සරිලන අධ්‍යාපන වැඩමුළු ගණනාවක් දිවයින පුරා සාර්ථක අන්දමින් ක්‍රියාවට නැංවිය.

2016 වසර ආරම්භයේ නිවාරක අධ්‍යාපන සහ පුහුණු අංශය ග්‍රාම නිළධාරීන්,සමෘද්ධි නිළධාරීන් සහ බඳවාගත් නවක උපාධිධාරීන් ඇතුලත් රාජ්‍ය නිළධාරීන් සඳහා නිවාරණ වැඩසටහන් 150ක් පවැත්වීමට ඉලක්ක කරන ලද අතර වසර අවසන් වන විට වැඩසටහන් 127ක් පවත්වා ඇත. එය 24.66% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි. 2016 වසර තුළ වැඩසටහන් මඟින් ආවරණය කිරීමට අපේක්ෂිත වූ සංඛ්‍යාව 1200ක් වූ අතර ආවරණය කරන ලද සංඛ්‍යාව 10 334කි. එය අපේක්ෂිත ඉලක්කය 35.26%කින් ලඟා කර ගැනීමක් ලෙස දැක්විය හැකිය.

2015 වසර තුල රාජ්‍ය නිළධාරීන් සඳහා වැඩසටහන්149ක් පවත්වා ඇති අතර 10734ක නිළධාරීන් ප්‍රමාණයක් ආවරණය කර ඇත.

2015 හා 2016 වසර සැසඳීමේදී 2016 වසර තුළ වැඩසටහන්හි ප්‍රගතිය 2015 වසරට සාපේක්ෂව 85.23%කි. ආවරණය කරන ලද සංඛ්‍යාව 96.22% වර්ධනයක් පෙන්නුම් කරයි.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිළධාරීන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සේවාවන් ඒකාබද්ධ වැඩසටහනක් බවට පත්කිරීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව තිබෙනවා මෙන්ම ඒ පිළිබඳව බොහෝ ආයතන වල අවධානය යොමු වී තිබේ. මෙම කාර්ය සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රය සෘජුවම දායකත්වය සපයයි.

මෙතෙක් මත්ද්‍රව්‍යට යොමු නොවූ පුද්ගලයින් එම තත්වයේම තව දුරටත් පවත්වා ගැනීමටත්, මත්ද්‍රව්‍යට ඇබ්බැහි වූ පුද්ගලයින් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් තුළදීත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මැදිහත්වීම අත්‍යාවශ්‍ය වේ. මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා ඵලදායි දායකත්වයක් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළින් ලබා ගැනීමේ අරමුණින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් වෛද්‍ය නිළධාරීන් , මනෝ වෛද්‍යවරුන්, හෙද නිළධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් දියත් කරමින් සාර්ථක ප්‍රතිඵල අත්පත් කරගෙන ඇත.

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා 2016 වසර සඳහා සම්පූර්ණ කිරීමට අපේක්ෂිත ඉලක්කය වැඩසටහන් 20ක් වූ අතර, ආවරණය කිරීමට අපේක්ෂිත නිළධාරීන් සංඛ්‍යාව 2000ක් විය.

2016 වසර අවසන් වන විට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය ඉලක්ක ගත වැඩසටහන් සංඛ්‍යාව ඉක්මවා යමින් වැඩසටහන් 29ක් පවත්වා ඇත. එය ඉලක්කය කරා ලඟා වීමේදී 145%ක ප්‍රගතියක් පෙන්නුම් කරයි.

2016 වසරේ ආවරණය කිරීමට අපේක්ෂිත නිළධාරීන් සංඛ්‍යාව 2000ක් වන විට ආවරණය කරන ලද නිළධාරීන් සංඛ්‍යාව 1839කි. එය 91.95% ප්‍රගතියක් පෙන්නුම් කරයි.

2015 වසර තුල සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා පවත්වා ඇති වැඩසටහන් සංඛ්‍යාව 19කි. එය 2016 වසරේ සම්පූර්ණ කර ඇති වැඩසටහන් සංඛ්‍යාව වන 29 හා සැසඳීමේ දී 2016 වසර තුළ 152.63% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2015 වසරේ ආමන්ත්‍රණය කරන ලද නිළධාරීන් 732ට සාපේක්ෂව 2016 වසරේ ආමන්ත්‍රණය කරන ලද 1839 ක ප්‍රමාණය 251.22%ක වර්ධනයක් පෙන්නුම් කරයි

වතු ආශ්‍රිත ජනතාව උදෙසා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

මත්ද්‍රව්‍ය ගැටළුව වතු ආශ්‍රිත ජනතාව අතරද අර්බුදකාරී තත්වයන් ඇති කරවන හේතුවක් බවට පසුගිය වසර කිහිපය තුළ පරිවර්ථනය වී ඇති බවට විවිධ පර්යේෂණයන් තුළින් හඳුනා ගත හැකිය.

වතු ආශ්‍රිත ජනතාවගේ මත්ද්‍රව්‍ය කෙරෙහි යොමු වීම තුළ සෞඛ්‍ය, සමාජීය, හා ආර්ථික ගැටළු රාශියක් එම සමාජයේ ඇති වීමට ඉඩ පරිසරය සලසා දෙයි.

වතු ජනතාව දිළිඳුකමේ ප්‍රපාතයට තවදුරටත් ඇද වැටීම මෙම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ ඇති වන තත්වයකි. මෙම පසුබිම පිළිබඳ අවබෝධයක් සහිතව 2016 වසර තුළ වතු ජනතාව ඉලක්ක කරගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් රාශියක් සාර්ථකව නිම කර ඇත.

2016 වසර ආරම්භයේ වතු ආශ්‍රිත ජනතාව සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 20ක් පැවැත්වීමට අපේක්ෂා කරන ලද අතර, ආවරණය කිරීමට අපේක්ෂිත පුද්ගලයින් සංඛ්‍යාව 2000ක් විය. 2016 වසර අවසාන වන විටදී වැඩසටහන් 34ක් පැවැත්වීමට මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් විය. එය අපේක්ෂිත ඉලක්කයට සාපේක්ෂව 170%ක වර්ධනයක් ලඟා කර ගැනීමකි.

2015 වසර තුළ වතු ආශ්‍රිත ජනතාව සඳහා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය වැඩසටහන් 31ක් පවත්වා ඇති අතර, පුද්ගයින් 2 368ක් ආවරණය කර ඇත.

2015 වසර හා සැසඳීමේදී වතු ආශ්‍රිත වැඩසටහන්හි 109.67%ක වර්ධනයක 2016 වසර තුළ පෙන්නුම් කරන අතර ප්‍රතිලාභීන්ගේ 113.8% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

නීතිය බලාත්මක කිරීමේ නිළධාරීන් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

මත්ද්‍රව්‍ය නිවාරණයේදී සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගැනීම උදෙසා මත්ද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම අවම කිරීම පිළිබඳ මෙන්ම මත්ද්‍රව්‍ය සුලභතාවය අඩු කරලීම සඳහා සැපයුම අවම කිරීමේ ක්‍රියාමාර්ගය ද එක සේ කාලීන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි වර්ධනය කිරීමට නිළධාරීන් සඳහා නව ප්‍රවණතා පිළිබඳව මනා අවබෝධයක් ලබා දිය හැකි පුහුණු වැඩසටහන් අත්‍යාවශ්‍ය වේ.

එමෙන්ම ආරක්ෂක අංශ තුළ රාජකාරී කටයුතු වල නිරත සොල්දාදුවන් හට 30 වසරක් පැවති යුද්ධයේ ප්‍රතිඵල වශයෙන් මුහුණ දීමට සිදු වූ පශ්චාත් ව්‍යසන ක්ලමත අක්‍රමතා ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු කිරීමට ප්‍රබල බලපෑමක් ඇති කරයි. එමෙන්ම සේවා ස්ථාන තුළ පවතින දැඩි ආතතියද මෙයට සෘජු බලපෑමක් ඇති කරනු ලබයි. මෙම කරුණු අවබෝධ කරගනිමින් නිවාරක අධ්‍යාපන පුහුණු අංශය මඟින් 2016 වසර තුළ ත්‍රිවිධ හමුදාව, පොලිසිය හා අනෙකුත් නීතිය බලාත්මක කිරීමේ නිළධාරීන් වෙනුවෙන් නිවාරක අධ්‍යාපන පුහුණු වැඩසටහන් මාලාවක් 2016 වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.

මෙම පුහුණු වැඩසටහන් පැවැත්වීමේදී මත්ද්‍රව්‍ය නීතිය බලාත්මක කිරීමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම මෙන්ම මත්ද්‍රව්‍යට යොමු වීමට බලපාන අවධානම් සාධක වලින් වැලකී සිටීමට අවශ්‍ය කුසලතාවයන් වර්ධනය කිරීම කෙරෙහිද අවධානය යොමු කරන ලදී.

2016 වසර තුළ ශ්‍රී ලංකා පොලිසිය , යුධ හමුදාව, නාවික හමුදාව ඇතුළු නීතිය බලාත්මක කරන ආයතන සඳහා පැවැත්වීමට ඉලක්ක ගත කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 55කි. එනමුත් වසර අවසන් වන විට වැඩසටහන් 68ක් පැවැත්වීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇත. එය 127.63% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි. එම වැඩසටහන් තුළින් ආවරණය කිරීම අපේක්ෂිත සංඛ්‍යාව 11000 ක් වූ අතර, 2016 වසර අවසන් වන විට 10614 ක් ආවරණය කර ඇත. එය අපේක්ෂිත ඉලක්කය 96.495% කින් ලඟාකර ගැනීමකි.

පසුගිය වසර හා සැසඳීමේ දී 2016 වසර තුළ පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව 2015 වසරේ වැඩසටහන් සංඛ්‍යාව 11කින් අතික්‍රමණය කර ඇත. එය 2016 වසර 2015 ට සාපේක්ෂව 119.29%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

2015 වසර තුළ නීතිය හා බලාත්මක කරන නිළධාරීන් 9068ක් ආවරණය කර ඇති අතර, එය 2016 ආවරණය කරන ලද 10614 හා සැසඳීමේ දී 2016 වසර තුළ 117.04% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි.

ප්‍රජාව ඉලක්ක කර ගනිමින් පවත්වන ලද නිවාරණ වැඩසටහන්

ප්‍රජාව පාදක කොට ගනිමින් මත්ද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම අවම කර ගනිමින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් වාර්ෂිකව දීප ව්‍යාප්ත වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලබයි. බිම් මට්ටමේ ප්‍රජාව වෙනුවෙන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මත්ද්‍රව්‍ය ආශ්‍රිත ගැටළු අවම කිරීම කෙරෙහි ඵලදායී ප්‍රතිඵල ජනනය කරන බව පර්යේෂණ මඟින් සනාථ කර තිබේ. යම් ප්‍රජාවක් තුළ ජීවත් වන සාමාජිකයන් හට තම ප්‍රජාව පිළිබඳ ඉහළ අවබෝධයක් ඇති අතර යම්කිසි වෙනසක් ඇති කිරීම සඳහා ප්‍රබල දායකත්වයක් දැක්වීමේ ශක්‍යතාවයක් ඔවුන් තුළ පවතී.

මෙහිදී යම්කිසි පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය වෙත යොමු වීමට බලපාන පාරිසරික සාධක අවම කිරීමට අපේක්ෂා කරන අතර මේ සඳහා ඇති සමාජීය බලපෑම අඩු කිරීම ප්‍රධාන අරමුණ වේ. එමෙන්ම එක් එක් පුද්ගලයින් හුදකලාව කටයුතු කරන පරිසරයක් වෙනුවට සාමූහිකව මත්ද්‍රව්‍යට එරෙහිව ප්‍රතිඵල දායක ශක්තිමත් වැඩපිළිවෙලක් ක්‍රියාවට නංවන ප්‍රජාවක් නිර්මාණය කිරීම තුළින් තමන් සහ සමීපතමයන් මත්ද්‍රව්‍ය තුළින් සිදු වන හානි වලින් ආරක්ෂා කර ගැනීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන චර්යාවන් සඳහා පුරුදු පුහුණු කරමින්, එම කාර්යයන් සඳහා බිම් මට්ටමේ ප්‍රජාව සූදානම් කරන ලදී.

2016 වසර ආරම්භයේ ප්‍රජාව පාදක කොටගත් වැඩසටහන් 300ක් පැවැත්වීමට ඉලක්ක ගත කොට සැලසුම් කරන ලද අතර, වසර අවසානයේ ආවරණය කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 268කි. එය අපේක්ෂිත ඉලක්කය 89.33%කින් ලඟා වීමකි.

වසර තුළ ප්‍රජා පාදක කොටගත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 243ක් පවත්වා ඇති අතර, ආවරණය කර ඇති පුද්ගලයින් සංඛ්‍යාව 40595 කි. 2016 සහ 2015 වසර සැසඳීමේදී 2016 වැඩසටහන් වල වර්ධනයක් 90.61% ක් ලෙස දැන්විය හැකි අතර ආවරණය කරන ලද පුද්ගල සංඛ්‍යාවක ප්‍රතිශතයක් 75.31% ක් ලෙස දැක්විය හැකිය.

මහජන ප්‍රදර්ශන

එකවර විශාල ජනතාවක් ආමන්ත්‍රණය කිරීමට හැකි එක් ක්‍රමයක් වන්නේ මහජන ප්‍රදර්ශනයි. මහජන ප්‍රදර්ශන හරහා වඩා විශාල ජනතාවකට අඩු පිරිවැයක් හා අඩු කාලයක් තුළ මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩය ඵලදායිව ගෙන යා හැකිය. මෙහිදී ප්‍රධාන වශයෙන් පෝස්ටර් හා බැනර් ආදිය මෙන්ම ජනතාව අතර බෙදාහරින අත් පත්‍රිකා හරහා මත්ද්‍රව්‍ය භාවිතයේ හානිය පිළිබඳව ජනතාවට සන්නිවේදනය කරනු ලබයි.

එම ආකාරයටම 2016 වසර තුළ මහජන ප්‍රදර්ශන සංවිධානය තුළින් විශාල ජනතාවක් වෙත මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩය රැගෙන යාමට කටයුතු කර ඇත.

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් 2016 වසර තුළ පැවැත්වීමට අපේක්ෂිත වූ මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රදර්ශන සංඛ්‍යාව 20ක් වූ අතර ආවරණය කිරීමට අපේක්ෂිත පුද්ගල සංඛ්‍යාව 20000ක් විය.

2016 වසර අවසන් වන විට වැඩසටහන් 14ක් පවත්වමින් 70% වෙතින් අපේක්ෂිත ඉලක්කයට ලඟා වී ඇති අතර පුද්ගලයින් 17545ක් ආවරණය කරමින් 87.72% පුද්ගල ඉලක්කයට ලඟා වී ඇත.

2015 වසර හා සැසඳීමේ දී 2016 වසර තුළ වැඩසටහන් 3ක් වැඩිපුර ද පුද්ගලයන් 4000ක ප්‍රමාණයක් වැඩිපුරද ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇත.

තරුණ නායකයින් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්

ඕනෑම සමාජයක් වෙනස් කිරීමේ ගාමක බලවේගයක් වශයෙන් සමාජයේ තරුණ පරපුර කටයුතු කරයි. සමාජය තුළ තීරණාත්මක සවිඥානික බවක් ඇති කිරීම කෙරෙහි තාරුණ්‍යයේ නිර්මාණශීලීත්වය හා ජවය වඩාත් ඵලදායි ලෙස භාවිතා කළ හැකිය. තරුණ නායකයින් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහනක් මඟින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ව්‍යාප්ත කිරීම උදෙසා තරුණ නායකයින් ශක්තිමත් කිරීම සිදු කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යංශය දක්වන ආකාරයට ප්‍රජාව තුළ මෙන්ම ලෝකයේ මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා තරුණයින් ශක්තිමත් බලවේගයක් ලෙස ක්‍රියා කරයි. බොහෝ විද්‍යාඥයන්ට වඩා තාරුණ්‍ය පිළිබඳ පුළුල් අවබෝධයක් ඔවුන් සතුව පවතින අතර මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩ ධනාත්මක හා අවමානයට ලක් නොවන ආකාරයෙන් සම වයස් කණ්ඩායම් වෙත ගෙන යාමේ හැකියාව ඔවුන් සතුය.

මෙම කරුණු සැලකිල්ලට ගනිමින්, දිවයිනේ සියලු ප්‍රදේශ තුලින් තෝරාගත් තරුණ නායකයින් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව පුහුණු කරුවන් වශයෙන් පුහුණු කරන ලදී. මෙලෙස පුහුණු කරන ලද තරුණ නායකයින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ අධීක්ෂණයෙන් යුතුව ප්‍රාදේශීය මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු වල සාර්ථක අන්දමින් නිරත වෙයි.

2016 වසර තුළ ප්‍රජා නායකයින් මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු කරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන් 15ක් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කිරීමේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇත. එම වැඩසටහන් මඟින් ප්‍රජා නායකයින් 799 දෙනෙකු මත්ද්‍රව්‍ය නිවාරණයේ පුහුණුකරුවන් ලෙස පුහුණුව ලබා සාර්ථකව වැඩමුළුව සම්පූර්ණ කිරීමට සමත්ව ඇත.

ගුරුවරුන් මත්ද්‍රව්‍ය නිවාරක පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්

මත්ද්‍රව්‍ය නිවාරණයේදී වැඩි අවධානයක් පාසැල් සිසුන් වෙත ලබා දීම තුළින් ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය භාවිතය අවම කරමින් මත්ද්‍රව්‍ය නිවාරණයේ සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැකි අතර , එම කාර්යය වඩාත් සාර්ථකව ඉටු කළ හැකි පාර්ශවයක් වන්නේ පාසැල් ගුරුවරුයි.

මෙම අවශ්‍යතාව හඳුනාගෙන ඇති මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය එම ගුරුවරුන් හට න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබාදෙමින් ඔවුන්ව මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම සඳහා වැඩසටහන් රාශියක් 2016 වසර තුළ ක්‍රියාත්මක කර ඇත.

පාසැල් සිසුන් වෙත මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව පුහුණු කරුවන් හරහා මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩය වඩාත් සක්‍රීයව සැළසුම් සහගතව ගෙන යාම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණයි.

මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණුකරුවන් ලෙස ගුරුවරුන් පුහුණු කිරීම් වැඩසටහන 29ක් 2016 වසර පුරාවට ක්‍රියාත්මක කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් වී ඇත. මෙම වැඩසටහන් අතරට එක් දින, දෙදින, තෙදින පුහුණු වැඩසටහන් අයත් වන අතර එම වැඩසටහන් තුළින් ලංකාව පුරා පාසැල් වල ගුරුවරුන් 1928 ආමන්ත්‍රණය කිරීමට මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශයට හැකියාව ලැබී ඇත.

මත්ද්‍රව්‍ය දුර්භාවිතාව සහ ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සංවිධානය කරන ලද මත්ද්‍රව්‍ය දුර්භාවිතාව සහ ජාවාරමට එරෙහිව ජාත්‍යන්තර දිනය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් 2016 ජුනි මස 26 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්විණ. එම අවස්ථාව මුල් කර ගනිමින් තැපැල් දෙපාර්තමේන්තුව සමරු මුද්දරයක් නිකුත් කරන ලද අතර එය ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීම සිදු කරන ලදී. පූජ්‍ය තීනියාවල පාලිත නායක ස්වාමීන් වහන්සේ, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය සාගල රත්නායක මැතිතුමා, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල් කේ.ගමගේ මහතා ඇතුළු සම්භාවනීය අමුත්තන් මෙම වැඩසටහන සඳහා සහභාගි විය.

විශාල වැඩබිම් තුළ සේවකයින් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපනය

විශාල වැඩබිම් තුළ සේවය කරන සේවකයින් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමු වීමේ වැඩි අවදානමක් පවතී. මෙයට බොහෝ විට හේතු වන්නේ මෙම සේවා ස්ථාන තුළ පවතින අධික කාර්ය බහුල බව නිසා එම සේවකයින් තම පවුලේ සාමාජිකයින් හා සමීපතමයින් සමඟ ධනාත්මක සබඳතා ගොඩනඟා ගැනීමේදී සහ ඒ සඳහා අවශ්‍ය කාල කළමණාකරණය කර ගැනීමේදී විවිධ ගැටළු වලට මුහුණ දීමයි. බොහෝ දුරට මෙවැනි කරුණු මඟින් ඇති කරනු ලබන අධික මානසික ආතතිය මත්ද්‍රව්‍ය භාවිතයට පුද්ගලයින් යොමු කිරීමට සාධක ගොඩනඟනු ලබයි.

මෙම අවශ්‍යතාවයන් සඳහා ඵලදායි ලෙස ආමන්ත්‍රණය කිරීම උදෙසා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් පසුගිය වසර තුළ විශාල වැඩබිම් ආවරණය කරමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. 2016 වසර තුළ විශාල වැඩබිම්හි සේවකයන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 39ක් පැවැත්වීමට නිවාරණ අධ්‍යාපන අංශය සමත්ව ඇත. එම වැඩසටන් මඟින්' ආවරණය කරන ලද සේවකයින් සංඛ්‍යාව 2 879කි.

2015 වසර තුළ පවත්වන ලද වැඩසටහන් 35ට සාපේක්ෂව 2016 වසර තුළ පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය 111.42% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

ආසියානු හා ශාන්තිකර කලාපීය මත්ද්‍රව්‍ය නීතිය බලාත්මක කිරීමේ ජාතික නායකයින් සඳහා වන සමුළුව කොළඹ දී

ශ්‍රී ලංකා රජයේ මූලිකත්වයෙන්, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ, නිවාරණ අධ්‍යාපන පුහුණු අංශයේ සහභාගීත්වයෙන් ආසියානු හා ශාන්තිකර කලාපීය මත්ද්‍රව්‍ය පිළිබඳ ජාතික ආයතනයන්හි ප්‍රධානීන්ගේ 40 වන සමුළුව හෙවත් **" HONLEA "** සමුළුව 2016 ඔක්තෝබර් මස 24 දින සිට 27 දින දක්වා කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණ. මේ සඳහා නීතිය බලාත්මක කිරීමේ, මහජන ආරක්ෂාව හා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආයතන 100 කට අධික නිළධාරීන් පිරිසක් කොළඹ දී එකට රැස් වී ආසියා හා ශාන්තිකර කලාපය තුළ වර්ධනය වෙමින් පවතින්නා වූ මත්ද්‍රව්‍ය ගැටළුව සම්බන්ධව සහ ඖෂධ දුර්භාවිතය පිළිබඳව වන ගැටළු සඳහා විසඳුම් සෙවීමේ සාකච්ඡාවෙහි නිරත විය.

මාදක ඖෂධ හා මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසමේ ඇරයුමකට අනුවඃ සමුළුව විසින් , ගෝලීය සාමාජික රටවල දායකත්වයෙන් ලෝක මත්ද්‍රව්‍ය ගැටළුවට ඒකාබද්ධ හා තුලනාත්මක වූ උපයාමාර්ග ඔස්සේ ජාත්‍යන්තර සහයෝගීතාවයෙන් යුතු දේශපාලනික සම්මුතින් සහ සැළසුම් ක්‍රියාත්මක කරන්නේ කෙසේද? යන කාරණය පිළිබඳ කලාපීය වශයෙන් වූ සාකච්ඡාවන් මෙහෙයවමින් මේ පිළිබඳව ප්‍රගතිය සමාලෝචන කරන ලදී.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ ලෝක මත්ද්‍රව්‍ය අර්බුදය පිළිබඳව 2016 අප්‍රේල් මස පවත්වන ලද විශේෂ සැසිවාරයේදී සාකච්ඡාවට බඳුන් වූ එකඟතාවයන්හි වූ ප්‍රතිඵල වලට අනුකූලව සහයෝගිතා විසඳුමක් සොයනු වස්, මෙම සමුළුවේ දී '' ලෝක මත්ද්‍රව්‍ය ගැටළුවට එරෙහිව ප්‍රතිඵල දායක ලෙස ආමන්ත්‍රණය කරනුයේ කෙසේද? යන ඒකාබද්ධ ප්‍රයත්නය '' පිළිබඳව තවදුරටත් අවධානය යොමු කරනු ලදී.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද පරිදි එනම්, මාදක ඖෂධ පිළිබඳ කොමිසමේ මඟ පෙන්වීම ඔස්සේ එහි උප ආයතනයන් අතර අඛණ්ඩව තොරතුරු හුවමාරු කර ගැනීම, එකිනෙකට වෙනස් ක්ෂේත්‍රයන් වල කටයුතු කරන ජාතික ආයතනයන්හි නිළධාරීන් අතර විෂයානුබද්ධ දැනුම හා උගත් පාඩම් ප්‍රයෝගික ලෙස යොදා ගැනීම, සියළුම ස්ථරයන්හි ඵලදායි ලෙස ඒකාබද්ධව කටයුතු කිරීම සහ, ලෝක මත්ද්‍රව්‍ය ප්‍රශ්නය සඳහා තුලනාත්මක ප්‍රවේශයක් අනුගමනය කිරීම මෙන්ම මෙකී ආයතනවල නිළධාරීන් අතර තවදුරටත් අර්ථාන්විත වූ සාකාච්ඡාවනට සහයෝගීතාව සලසවමින් අතිරේක අධීක්ෂණයන් පිළිබඳ සැළකිල්ලට ලක් කිරීම ශක්තිමත් කරලීමඃ යන කරුණ පිළිබඳව නිර්දේශ නිකුත්කිරීමද මෙම සමුළුවේදී සිදු විය.

40 වන ආසියා හා ශාන්තිකර කලාපීය **"HONLEA "** සමුළුව අවසානයේ , 2016 ඔක්තෝම්බර් 28 සහ 29 යන දෙදින තුළ ඉන්දියානු සාගර කලාපීය රටවල මත්ද්‍රව්‍ය නීතිය බලාත්මක කිරීමේ ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත වූ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යංශය යටතේ අධීක්ෂණය වන ගෝලීය නාවුක අපරාධ පිළිබඳ වැඩසටහනේ ප්‍රධානත්වයෙන් ඉන්දියානු සාගර කලාපීය නාවුක අපරාධ පිළිබඳ හමුවක් ද පැවැත්විණ. මෙකී සමුළුව සඳහා ඉන්දියානු සාගර කලාපීය රටවල් 22ක මත්ද්‍රව්‍ය නීතිය බලාත්මක කිරීමේ ඉහල මට්ටමේ නිළධාරීන් සම්බන්ධ වුණු අතර නාවුක මාර්ග ඔස්සේ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය පිළිබඳව ඇති වෙමින් පවත්නා තර්ජන පිළිබඳව සාකච්ඡාවට බඳුන් කෙරිණ.

8.2 පර්යේෂණ අංශයේ ප්‍රගතිය 2016

අන්තරායකර ඖෂධ දුර්භාවිත ව්‍යාප්තිය, ඒ සඳහා හේතු හා අන්තරායකර ඖෂධ භාවිතයෙන් ඇති වන නෛතික, වෛද්‍ය, සමාජීය, සංස්කෘතික හා ආර්ථික ගැටලු පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම, ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීම පර්යේෂණ අංශය විසින් සිදුකරනු ලබයි. මත්ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් සිදුකිරීමට ප්‍රතිපත්ති සකස් කරන්නන්ට, සේවා සපයන්නන්ට, සේවාලාභීන්ට හා පහසුකම් සපයන්නන්ට මත්ද්‍රව්‍ය ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම, වාර්තා සකස් කිරීම හා අදාළ තොරතුරු ලබා දීම ප්‍රධාන කාර්යයන් වේ.

මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත

සෑම වර්ෂයකම මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ තොරතුරු මෙන්ම ඊට පෙර වසර පහකට අදාළව තොරතුරු සංග්‍රහ ගත කිරීම සිදුකරනු ලබයි. ප්‍රධාන වශයෙන් සියලුම මත්ද්‍රව්‍ය සම්බන්ධව ලබාගත් තොරතුරු මෙම අත්පොතෙ හි සඳහන් කර ඇත.




2016 වර්ෂය තුළදී, මත්ද්‍රව්‍ය දුර්භාවිත අත්පොත 2015 මුද්‍රණය කර අදාළ ආයතන වෙත බෙදා හරින ලදි.




ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාරය වැනි නීතිය ක්‍රියාත්මක කරන අංශවලින්, සෞඛ්‍ය අමාත්‍යාංශය හා දේශීය ආයුර්වේද දෙපාර්තමේන්තුව ආදී ආයතන ගණනාවකින් අවශ්‍ය තොරතුරු ඒකරාශී කර මත්ද්‍රව්‍ය දුර්භාවිත අත්පොත 2016 මුද්‍රණය කර අදාල ආයතන වෙත බෙදා හරින ලදි.

2015 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 82,482 කි. අත්අඩංගුවට පත් වූ පුද්ගලයන් අතුරින් 32% ක් හෙරොයින් වැරදි සඳහා ද, 63% ක් ගංජා වැරදි සඳහා ද අත්අඩංගුවට පත් වී ඇත.

2015 වර්ෂය තුළ දී මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට පත් වූ බහුතරයක් බස්නාහිර පළාත තුළ දී අත්අඩංගුවට පත් වී ඇත. එම සංඛ්‍යාව 60% ක් වේ. මීළඟට දකුණු පළාතෙන් 10%ක් ද, මධ්‍යම පළාතෙන් 8%ක පමණ ප්‍රතිශතයක් අත්අඩංගුවට පත් වී ඇත. 2015 වර්ෂය තුළ දී මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට පත් වූ බහුතරයක් කොළඹ දිස්ත්‍රික්කය තුළ දී අත්අඩංගුවට පත් වී ඇති අතර එය 43%කි. ගම්පහ දිස්ත්‍රික්කයෙන් 14% ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 4%ක ප්‍රතිශතයක් ද අත්අඩංගුවට පත් වී ඇත. 2015 දී මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූවන් සංඛ්‍යාව මුළු ජනගහනයෙන් ලක්ෂයකට පුද්ගලයින් 397 දෙනෙකි.





මත්ද්‍රව්‍ය ආශ්‍රිත සංඛ්‍යාලේඛන වාර්තා (2015 - 2016)




නීතිය බලාත්මක කරන ආයතන මගින් මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් ලබාගත් දත්ත උපයෝගි කරගෙන වර්තමාන මත්ද්‍රව්‍ය භාවිත රටාවන් පිළිබඳ සකසන ලද සංඛ්‍යාලේඛන වාර්තාවකි. වර්ෂය තුළදී පහත වාර්තා ප්‍රකාශයට පත් කරන ලදි.

1. මත්ද්‍රව්‍ය ආශ්‍රිත සංඛ්‍යාලේඛන වාර්තාව (ජනවාරි සිට දෙසැම්බර් දක්වා 2015) ඉංග්‍රීසි සහ සිංහල බසින් සකස් කරන ලදී.

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය යනු පරිගණක ගත කරන ලද තොරතුරු විශ්ලේෂණ පද්ධතියකි. ඒ තුළ ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත්වන්නන්ගේ සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිකාර සඳහා ඇතුළත්වන්නන්ගේ තොරතුරු ඇතුළත් කරනු ලබයි. මෙම තොරතුරු මාසිකව සියලුම නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලින් ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන, බන්ධනාගාරවලින් ලබා ගැනේ. ප්‍රතිකාර ලබා ගන්නන් පිළිබඳ තොරතුරු සෑම කාර්තුවකට වරක්ම විශ්ලේෂණය කර වාර්තා කරනු ලබයි.



2016 වර්ෂය තුළ දී පහත සඳහන් වාර්තා ප්‍රකාශයට පත්කරන ලදි.

☐ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුලත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 98 වෙළුම


☐ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුලත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 99 වෙළුම

☐ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුලත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 100 වෙළුම

මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුලත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 100 වෙළුම (වාර්ෂික වාර්තාව සාරාංශය)

2015 වර්ෂයේ ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ පුද්ගලයින් 1,482 දෙනාගේ ප්‍රතිකාර ලබාගත් ස්ථානය විමසා බැලීමේදී ප්‍රතිකාර සඳහා රජයේ ආයතන වලට (අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට) ඇතුළත් වූ සංඛ්‍යාව 866 දෙනෙකි. එය ප්‍රතිශතයක් ලෙස 59 % කි. රාජ්‍ය නොවන සංවිධාන වලින් 2015 වර්ෂයේ ප්‍රතිකාර ලබාගෙන ඇති සංඛ්‍යාව 212 (14%) දෙනෙකි. බන්ධනාගාර ප්‍රතිකාර වැඩසටහනට ඇතුළත් වී ඇති පිරිස 317 (21%) දෙනෙක් වන අතර කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන් 87 (6%) දෙනෙක් ප්‍රතිකාර ලබාගෙන ඇත.

2015 ප්‍රතිකාර සඳහා ඇතුළත් වීමේ සංයුතිය



මූලාශ්‍රය: මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කළමනාකරණ පද්ධතියේ ප්‍රතිකාර දත්ත 2015

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හා එක්ව මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට 2016 ජූලි මස සිට අන්තර්ජාලය හරහා තොරතුරු ගෙන්වා ගැනීම සඳහා දිවයිනේ සියලුම පොලිස් ස්ථාන ආවරණය වන පරිදි පුහුණු වැඩමුළු 32 ක් පවත්වන ලදි. මෙමගින් පොලිස් නිලධාරීන් 1800 ක් පමණ දැනුවත් කිරීම සිදු කරන ලදි. වසර ඇතුළත දිවයිනේ සියලුම පොලිස් ස්ථාන වලින් අන්තර්ජාලය හරහා සමීක්ෂණ පත්‍රිකා 6891ක් පර්යේෂණ අංශය වෙත ලැබී ඇත.







2016 වර්ෂය තුළදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යා ලේඛන වාර්තා අදාළ ආයතනවලට බෙදාහරින ලදි. ප්‍රතිකාර මධ්‍යස්ථාන පෝරම හා පොලිස්/ සුරාබදු පෝරම අදාල ප්‍රතිකාර මධ්‍යස්ථානවලට හා පොලිස් ස්ථාන වලට බෙදා හරින ලදි.

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ ලිපි එකතුව IV

පර්යේෂණ අංශය විසින් පසුගිය වර්ෂවල සිදුකරනු ලැබූ පර්යේෂණ හා සමීක්ෂණ වාර්තා කිහිපයක් එකතුකර “ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ ලිපි එකතුව - IV” නැමැති ග්‍රන්ථය සම්පාදනය කරන ලදි. 2016 වසරේ මුද්‍රණය කළ මෙම ග්‍රන්ථයෙහි පහත සඳහන් සමීක්ෂණ/පර්යේෂණ ඇතුළත් වේ.



- යාපනය දිස්ත්‍රික්කය තුළ මත්ද්‍රව්‍ය ප්‍රවණතාවය හා ප්‍රචලිතභාවය පිළිබඳ සමීක්ෂණය
- ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලින් බැහැරවූ සේවාලාභීන් හා ප්‍රතිකාර ක්‍රියාවලිය පිළිබඳ තක්සේරු අධ්‍යයනය 2014/2015
- ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය, ජාවාරම් කිරීම සහ ජාවාරම්කරුවන් පිළිබඳ කඩිනම් සමීක්ෂණය (බන්ධනාගාර ඇසුරින්)

පර්යේෂණ/සමීක්ෂණ

1. මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය හා නූතන ප්‍රවණතා පිළිබඳ දීපව්‍යාප්ත සමීක්ෂණය

පර්යේෂණ අංශය විසින් මත්ද්‍රව්‍ය ප්‍රවණතාවය පිළිබඳ දීප ව්‍යාප්ත සමීක්ෂණයක් සිදු කරන ලදි. මෙහි මූලික අරමුණු වූයේ මත්ද්‍රව්‍ය සඳහා ඉහළ අවදානමක් ඇති ප්‍රදේශ හඳුනාගැනීමත්, මත්ද්‍රව්‍ය භාවිතයේ නව ප්‍රවණතා හඳුනාගැනීමත්ය. දිස්ත්‍රික්ක 18කින් පොලිස් බල ප්‍රදේශ 28ක් ආවරණය වන පරිදි නියැදිය තෝරාගෙන සමීක්ෂණය සිදු කරන ලදි. 2016 වර්ෂය තුළදී තෝරාගත් පොලිස් බලප්‍රදේශ 10ක මූලික තොරතුරු සපයන්නන්ගෙන් සම්මුඛ සාකච්ඡා පවත්වා එම ප්‍රදේශවල මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ කාලීන තොරතුරු රැස් කරන ලදි.

ප්‍රශ්නාවලි 1080ක් දත්ත පද්ධතියට ඇතුළත් කළ අතර 2016 තුළදී වාර්තාව සම්පූර්ණ කරන ලදි.





2. මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නන් පිළිබඳ සමීක්ෂණය


පර්යේෂණ අංශය විසින් මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නන් පිළිබඳ දීපව්‍යාප්ත සමීක්ෂණයක් ආරම්භ කරන ලදි. මෙහි මූලික අරමුණ වූයේ, මත්ද්‍රව්‍ය එන්නත් කරගනු ලබන්නන් හඳුනාගැනීම, හා ප්‍රවණතාවය මැනබැලීමත් ඒ තුළින් එන්නත් කරගන්නන් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමටත්, ඉහළ ප්‍රවණතාවක් සහිත ප්‍රදේශ හඳුනාගෙන එම පුද්ගලයින් ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු සඳහා යොමු කිරීමයි. පර්යේෂණ වාර්තාව සකස් කර අවසාන කරන ලදි.

වාර්තාවේ සාරාංශය

මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නන් 721 දෙනෙකු සමීක්ෂණයට භාජනය කරන ලදි. ඒ අතරින් 657 (91%) ක් බස්නාහිර පළාත තුළ ජීවත් වූවන් වූ අතර දකුණු පළාතේ 23 (3%) ක්ද, සබරගමුව පළාතෙන් 14 (2%) ක් ද නියැදියට අයත් විය. මත්ද්‍රව්‍ය එන්නත් කරන්නන් පිළිබඳ ඉහළ ම අගයක් වාර්තා වී ඇත්තේ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොම්පඤ්ඤවීදිය ග්‍රාම නිලධාරී වසම තුළිනි.

ලංකාවේ ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය එන්නත් කරන්නන්ගේ සංඛ්‍යාව 957 - 1209 ත් අතර සංඛ්‍යාවක් වන අතර අවම ඇස්තමේන්තුගත අගය 705කි. මේ අතරින් බහුතරයක් දෙනා පුරුෂයින් වේ. අනෙකුත් පළාත්වලට සාපේක්ෂව බස්නාහිර පළාත තුළ කාන්තාවන් සුළු ප්‍රමාණයක් වාර්තා වී තිබුණි. මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නන්ගේ මධ්‍යනය වයස 38ක් වූ අතර වයස අවුරුදු 17 සිට 73 දක්වා වයස් වලට අයත් පුද්ගලයන් නියැදියට ඇතුළත් විය. හඳුනාගත් මත්ද්‍රව්‍ය එන්නත් කරන්නන්ගෙන් 326 (45%) ක් පමණ අවුරුදු 36 - 50 ත් වයස් ඛාණ්ඩයට අයත් විය.

සිතියම 01 : දිස්ත්‍රික්ක අනුව මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නන්ගේ ප්‍රවණතාවය



(සමීක්ෂණ දත්ත 2015/2016)

3. පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය.

පර්යේෂණ අංශය විසින් පාසල් ළමුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදි. නියැදිය ලෙස දිස්ත්‍රික්ක 15ක් මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතා ආශ්‍රිත වාර්තා වලින් ලබා ගන්නා ලදි. ස්ථරායන නියැදි ක්‍රමය යොදා ගනිමින් පාසල් 100 කින් පාසල් ළමුන් 1000ක් යොදාගෙන මෙම සමීක්ෂණය සිදු කරන ලදි.

ක්ෂේත්‍ර සමීක්ෂකයන්, පර්යේෂණ අංශයේ කාර්ය මණ්ඩලය සහ බාහිර සේවා නිලධාරීන් වූහ. ඒ අනුව සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලි 5000ක් දෙසැම්බර් මස අවසන් වන විට දත්ත පද්ධතියට ඇතුළත් කරන ලදි. දත්ත විශ්ලේෂණය සිදු කෙරෙමින් පවතී.



4. කොළඹ සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිත රාත්‍රී සමාජශාලා සහ වෙරළ සාදයන් ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ අංශය විසින් කොළඹ සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිත රාත්‍රී සමාජශාලා සහ වෙරළසාදයන් ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය පිළබඳ අධ්‍යයනයක් ආරම්භ කරන ලදි. දැනට ලංකාවේ රාත්‍රී සමාජශාලාවල මත්ද්‍රව්‍ය භාවිතා කරන ජනගහනය සැඟවුණු උප සංස්කෘතික කණ්ඩායමකි. සමාජශාලාවල ඇම්පෙටමින් වර්ගයේ සහ මනෝවර්ථක ගණයේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතාවය, රටාවන් හා ඒ හා බැඳි උප සංස්කෘතිය හඳුනාගැනීම, ඔවුන්ගේ ප්‍රජා සහ සමාජ විද්‍යාත්මක පැතිකඩ නිර්ණය කිරීම සහ ඒ ආශ්‍රිත කෙටි හා දිගුකාලීන බලපෑම් අධ්‍යයනය කිරීම මෙහි අරමුණු බවට පත්විය.

කොළඹ සහ උප නගර ආශ්‍රිත රාත්‍රී සමාජශාලා වල මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් 50 දෙනෙක් හිමබෝල නියැදි භාවිතා කරමින් නියැදියට ඇතුළත් කරගත් අතර ඊට අමතරව රාත්‍රී සමාජශාලා, හිමිකරුවන්, සුළු සේවකයින් අදාළ ප්‍රදේශවල ඖෂධවේදීන් හා පොලිස් නිලධාරීන්ද ඇතුළත් කරගන්නා ලදි.

සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන හා ප්‍රශ්නාවලි 50ක් හා මූලික තොරතුරු සපයන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා 10ක් 2016 වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදි. දත්ත පරිගණකගත කිරීම සිදුකෙරෙමින් පවතී. භාවිත රටාවන් නිරීක්ෂණය, සඳහා සහභාගීත්ව නිරීක්ෂණ අවස්ථාවක් ද සිදු කරන ලදි.

5. කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතාවය හා භාවිත රටාවන් හඳුනාගැනීම

ලංකාවේ කාන්තා මත්ද්‍රව්‍ය භාවිතයේ වර්තමාන ප්‍රවණතාවයන් සහ රටාවන් හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කරන ලදි. කාන්තාවන් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීමට බලපාන සාධක හඳුනාගැනීම, මත්ද්‍රව්‍ය භාවිතය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කම් හඳුනාගැනීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවිය සාධක සඳහා උචිත වූ ප්‍රතිකාරාත්මක වැඩසටහන් යෝජනාකිරීම උක්ත පර්යේෂණයේ ප්‍රධාන අරමුණු විය. ප්‍රතිකාර මධ්‍යස්ථාන, බන්ධනාගාර, විශෝධන මධ්‍යස්ථාන සහ ප්‍රජාවන් තුළින් හිමබෝල නියැදිය භාවිතා කරමින් මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් 150 දෙනෙක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදි. දත්ත රැස්කිරීම සිදු කෙරෙමින් පවති.

කැළණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන් සඳහා පර්යේෂණ පුහුණු පැවැත්වීම

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව විශේෂේදී උපාධිය හදාරන විද්‍යාර්ථියෙකු 2016 සැප්තැම්බර් 04 දින සිට 2016 නොවැම්බර් 21 දක්වා පුහුණු කිරීම් සිදු කරන ලදි. පර්යේෂණ ක්‍රම වේද, දත්ත රැස්කිරීම, දත්ත පරිගණක ගතකිරීම සඳහා පුහුණු කරවන ලදි.

ශ්‍රී ලංකාවේ අබිං භාවිතය හා බෙදාහැරීම සම්බන්ධව විධිමත් වැඩපිළිවෙළක් සැකසීම සඳහා වූ විද්වත් කමිටු රැස්වීම

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා භාවිතා කරන අබිං බෙදා හැරීම හා භාවිතය පිළිබඳ වර්තමානයේ ගැටලු පවතින බැවින් පරිභෝජන තත්ත්වය අධීක්ෂණය කිරීම, ඒ සඳහා ක්‍රමවත් යාන්ත්‍රණයක් සැකසීම, නීත්‍යානුකූල නොවන අබිං හා ගංජා භාවිතය පිළිබඳ දත්ත රැස් කිරීම හා සංචිතයක් පවත්වාගෙන යාම, අවභාවිතය වැළැක්වීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම යන කරුණු සම්බන්ධයෙන් මූලික සාකච්ඡාවක් 2016.09.29 වන දින අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේදී පවත්වන ලදි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරීන්, ආයුර්වේද ඖෂධ සංස්ථාව, ආයුර්වේද දෙපාර්තමේන්තුව, වෛද්‍ය සැපයුම් අංශය, පොලිස් මත්ද්‍රව්‍යනාශක කාර්යාංශයේ නිලධාරීන් සහභාගී වූ අතර පහත කරුණු පිළිබඳ සාකච්ඡා කරන ලදි.

- ශ්‍රී ලංකාව තුළ අබිං බෙදා හැරීමේ වර්තමාන ස්වභාවය
- පරිභෝජන තත්ත්වය අධීක්ෂණය කිරීම
- නීත්‍යානුකූල නොවන අබිං හා ගංජා භාවිතය පිළිබඳ දත්ත රැස් කිරීම හා සංචිතයක් පවත්වාගෙන යාම
- අවභාවිතය වැළැක්වීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම

එම සාකච්ඡාවට අනුව පහත තීරණ වලට එළඹෙන ලදි.

- මෑතකාලීනව අබිං පරිභෝජනය කරන වෛද්‍යවරුන් පිළිබඳ අධීක්ෂණයක් සිදුකර නොමැති බැවින් ශ්‍රී ලංකාවේ දැනට අබිං භාවිතා කරමින් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කරනු ලබන ආයුර්වේද වෛද්‍යවරුන් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ නැවත ලියාපදිංචි කිරීම.

- ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා වාර්ෂිකව අවශ්‍ය අබිං හා ගංජා ප්‍රමාණය වාර්ෂිකව ඇස්තමේන්තුගත කර අදාළ ආයතන වලට ලබාදීම.

- ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය කිරීමට අබිං යොදා ගැනීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සැකසීම.

- ශ්‍රී ලංකාව තුළ අබිං බෙදා හැරීමේ වර්තමාන ස්වභාවය අධ්‍යයනය කිරීම සඳහා සමීක්ෂණයක් ආරම්භ කිරීම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ලෝක සෞඛ්‍ය සංවිධානය හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය එක්ව පහත ව්‍යාපෘතිය 2016 වසර තුළ ක්‍රියාත්මක කල අතර පර්යේෂණ අංශය මඟින් එම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කරවීම හා අධීක්ෂණය සිදුකරනු ලැබීය. එහි සාරාංශයක් පහත ඉදිරිපත් කර ඇත.

මත්ද්‍රව්‍ය භාවිත කරන කාන්තාවන් සඳහා වූ ප්‍රතිකාරමය වැඩසටහන **SESRL 1408462**
ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මත්ද්‍රව්‍ය භාවිත කරන කාන්තාවන් සඳහා වූ ගොඩවැදීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා අරමුදල් සැපයූ අතර සෞඛ්‍යය තත්ත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ඉහළ ප්‍රවණතාවක් ඇති ප්‍රදේශ තෝරා ගෙන මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම හා ප්‍රතිකාර ලබාදීමට මූලික වී ක්‍රියාකරනු ලැබීය.

ප්‍රජා වැඩසටහන් ලෙස පර්යේෂණ අංශය විසින් ක්ෂය රෝගය සම්බන්ධ වැඩසටහන් 03ක් පැවැත්වූ අතර, ක්ෂය රෝගය හා එච්. අයි. වී. ඒඩ්ස් පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන් දෙකක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ එච්. අයි. වී. ඒඩ්ස් වැඩසටහන හා එක්ව ක්‍රියාත්මක කරන ලදි.

2016 ජනවාරි 05 කොම්පඤ්ඤවීදියේ 175 වත්ත (එච්. අයි. වී. ඒඩ්ස් පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහනක් සහ රුධිර සාම්පල පරීක්ෂා කිරීම)

2016 ජනවාරි 06 කොම්පඤ්ඤවීදියේ 175 වත්ත (එච්. අයි. වී. ඒඩ්ස් පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහනක් සහ රුධිර සාම්පල පරීක්ෂා කිරීම)

2016 ජනවාරි 20 නවගම්පුර දෙවන අදියර (ක්ෂය රෝගය පිළිබඳ දැනුවත් කිරීම)

2016 ජනවාරි 28 කොම්පඤ්ඤවීදියේ 175 වත්ත (ක්ෂය රෝගය පිළිබඳ දැනුවත් කිරීම)

2016 ජනවාරි 29 කොම්පඤ්ඤවීදියේ 175 වත්ත (ක්ෂය රෝගය පිළිබඳ දැනුවත් කිරීම)





අන්තර් ජාතික මාදක පාලක මණ්ඩලය (INCB)

ශ්‍රී ලංකාව බැඳී සිටි අන්තර්ජාතික සම්මුතීන්ට සහාය දැක්වීමක් වශයෙන් සහ අවනතවීමක් වශයෙන් මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව අන්තර් ජාතික මාදක පාලක මණ්ඩලය (INCB) වෙත පහත වාර්තා සම්පාදනය කරන ලදි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය, අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය වෙත යවනු ලබන ශ්‍රී ලංකාවේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ හා ඒ ආශ්‍රිත පැන නගින කරුණු පිළිබඳ වගකීම් දරනු ලැබේ. එසේම වර්ෂය තුල දී පහත සඳහන් වාර්තා අදාළ ආයතන වෙත සපයන ලදි

අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය, වෛද්‍ය සැපයුම් අංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු ගෙන්වා ගැනීමට අදාලව ලිපි ලේඛන සකස් කරන ලදි. පහත පෝරම අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය වෙත යවන ලදි.

ත්‍රෛමාසිකව යවන ලද දත්ත

- මාදක ඖෂධ ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය A) 4 වන කාර්තුව 2015 සහ 1 කාර්තුව 2016, 2 කාර්තුව 2016, 3 කාර්තුව 2016

- 1971 සම්මුතීන් ලැයිස්තු 2 හි සඳහන් මනෝවර්තක ද්‍රව්‍ය ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය **A/P**) 4 වන කාර්තුව 2015 සහ 1 කාර්තුව 2016, 2 කාර්තුව 2016, 3 කාර්තුව 2016)

- මාදක ඖෂධ පිළිබඳ අවශ්‍යතා ඇස්තමේන්තු

- 1971 මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතීන් ලැයිස්තු 2 හි අඩංගු වෛද්‍යමය හා විද්‍යාත්මක අවශ්‍යතා සඳහා වන ඖෂධ වර්ග (පෝරමය B/P)

වාර්ෂිකව යවන ලද දත්ත

- මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍ය නිෂ්පාදනය, පරිභෝජනය, ගබඩා කිරීම හා වැටලීම් පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය C)
- මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධීව නිෂ්පාදනය සඳහා ඉවහල්වන රසායන ද්‍රව්‍ය පිළිබඳ වාර්ෂික තොරතුරු (පෝරමය D)
- මනෝවර්ථක ද්‍රව්‍ය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය P)
- වාර්ෂික වාර්තා ප්‍රශ්නාවලිය (පෝරමය E)
    1. නීතිමය හා ආයතනික රාමුව
    2. මත්ද්‍රව්‍ය ඉල්ලුම හා සැපයුම අවම කිරීම සඳහා වූ සූක්ෂම ඵළඹුම
    3. මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ රටාව හා ප්‍රවණතාවය හඳුනා ගැනීම.
    4. මත්ද්‍රව්‍ය වගාකිරීම්, නිෂ්පාදනය කිරීම් හා වැටලීම් සම්බන්ධයෙන් පවතින රටා හා ප්‍රවණතා හඳුනා ගැනීම

- සම්පූර්ණ කරන ලද N-Phenethy1-4-Piperidinone (NNP) and 4-anilino-N-Phenethylpiperidine (ANNP) ප්‍රශ්නාවලිය අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය වෙත යැවීම

- සම්පූර්ණ කරන ලද New Psychoactive substances ප්‍රශ්නාවලිය අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය වෙත යැවීම

මත්ද්‍රව්‍ය උපදේශන සහතික පත් පාඨමාලාව

මණ්ඩලයේ අධ්‍යාපන හා උපදේශන කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව පර්යේෂණ අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල උපදේශන සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල නියැලෙන්නන්ට, විශ්වවිද්‍යාල සිසුන්ට, මත්ද්‍රව්‍ය විෂය ක්ෂේත්‍රයට පිවිසීමට කැමති පුද්ගලයන්ට මත්ද්‍රව්‍ය උපදේශන සහතිකපත් පාඨමාලාවක් 2012 වර්ෂයේ මාර්තු මස ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ගැටළුව පිළිබඳ වෘත්තීමය වශයෙන් දැනුමක් ලබා දීමත් උපදේශන කටයුතු හරහා දැනුම වර්ධනය කර ගැනීමටත් අවකාශය ලබා දීම මෙහි මූලික පරමාර්ථය වේ. වර්ෂය තුළ කණ්ඩායම් 13ක් සඳහා සහතිකපත් පාඨමාලාව පවත්වනු ලැබූ අතර 2016 වර්ෂයේදී සිසුන් 455 ක් එම පාඨමාලා සඳහා සහභාගි විය.







අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ "Newsletter" කාර්තුමය සඟරාව



අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ තොරතුරු/ සේවාවන් අනෙක් ආයතන සමඟ හුවමාරු කර ගැනීමේ අරමුණින් ත්‍රෛමාසික පුවත් හසුනක් නිර්මාණය කර එලිදක්වන ලදි. මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ගේ අදහස් ලිපි ලේඛන ද කලා නිර්මාණ ද ඇතුළුව මත්ද්‍රව්‍ය පාලනය, නිවාරණය, ප්‍රතිකාර, පුනරුත්ථාපන සහ පර්යේෂණ තොරතුරු මෙහි ඇතුළත් වේ. 2016 වර්ෂය තුළ දොළොස්වන සඟරාව එළිදක්වනු ලැබූ අතර අදාළ ආයතන සඳහා බෙදා හරින ලදි.

ශ්‍රී ලංකාව තුළ වෛද්‍යමය ඖෂධ අවභාවිතය තක්සේරු කිරීම සඳහා වූ කමිටු රැස්වීම

මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෛද්‍යමය ඖෂධ අනිසි භාවිතය පිළිබඳ තක්සේරු කිරීමට විද්වත් කමිටු රැස්වීමක් 2016 මැයි 24 සහ 25 යන දිනයන්හිදී කොළඹ ගලදාරි හෝටලයේදී පවත්වන ලදි. වෛද්‍ය සැපයුම් අංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව, ආනයන අපනයන දෙපාර්තමේන්තුව සහ ඖෂධ සැපයීම් අංශයේ නිලධාරීන් මෙයට සහභාගී විය.

මෙහි මූලික අරමුණු වූයේ ලංකාව තුළ වෛද්‍යමය ඖෂධ අවභාවිතයේ ස්වභාවය සහ ප්‍රමාණය ගුණාත්මකව තක්සේරු කිරීම, ලංකාවේ බහුලව අවභාවිතාවන ඖෂධ වර්ග හඳුනාගැනීම සහ රටතුළ ඖෂධ අවභාවිතය සම්බන්ධ නෛතික හා ප්‍රතිපත්තිමය පාලන තත්වයන් තක්සේරු කිරීම, අදාල ආයතන කෙරෙහි සැලකිලිමත් වෙමින් සංවිධානාත්මක නීතිය බලාත්මක කිරීමේ ධාරිතාවක් තක්සේරු කිරීම, පවත්නා නෛතික තත්ත්වය හා සංවිධානාත්මක ධාරිතාව අතර පවත්නා පරතරය තක්සේරු කිරීමයි.





පාසල්වල මත්ද්‍රව්‍ය නිවාරණ පණිවුඩ ප්‍රදර්ශනය කිරීම

2012 වර්ෂයේ සිට පාසල් තාප්පවල මත්ද්‍රව්‍ය නිවාරණ පණිවුඩ ප්‍රදර්ශනය කිරීම පර්යේෂණ අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. 2016 වර්ෂය තුළදී පහත පාසල්වල දැන්වීම් ප්‍රදර්ශනය කරන ලදි.

✓කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලය පිටකෝට්ටේ

✓මහාබෝධී මහා විද්‍යාලය මරදාන

✓ගිරි/රතනාලංකාර මහා විද්‍යාලය අලව්ව







තොරතුරු තාක්ෂණ ඒකකය

තොරතුරු තාක්ෂණ ඒකකය විසින් 2016 වර්ෂය ඇතුළත ප්‍රතිකාර හා පොලිස් සුරාබදු සමීක්ෂණ පත්‍රිකා වල දත්ත ඇතුළත් කිරීම අවසන් කර ඇත. පහත සඳහන් වාර්තා එම දත්ත ඇසුරෙන් ප්‍රකාශයට පත් කරන ලදි.

- මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යා ලේඛන වාර්තාව 49 වෙළුම
- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 98 වෙළුම
- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 99 වෙළුම
- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 100 වෙළුම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය තුළ ඇති සියළුම අංශවල හා මධ්‍යස්ථානවල පවතින පරිගණක වල පවතින දෝෂ හඳුනා ගෙන ඒවා පිළිසකර කිරීමේ කාර්යයන් තොරතුරු තාක්ෂණ ඒකකය විසින් සිදු කරන ලදි.
සහතික පත්‍ර/ අත් පත්‍රිකා නිර්මාණය කරන ලදි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වෙබ් අඩවිය දිනපතා යාවත්කාලීන කරන ලදි.

ජංගම දුරකතන උපදේශන වැඩසටහන

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් මත්ද්‍රව්‍ය පාලනය, නිවාරණය, ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු සඳහා විවිධ ක්‍රියාකාරකම් දීප ව්‍යාප්තව සිදු කරනු ලබයි. ජංගම දුරකතන, නව තාක්ෂණ මෙවලම් හා ජංගම සන්නිවේදන උපකරණ බහුලව භාවිතා වන අවධියක ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් ආයතනය හා එක්ව 1984

ක්ෂණික දුරකතන ඇමතුම් මධ්‍යස්ථානයේ සේවාව වඩාත් තීව්‍ර කරමින් නවීකරණය කර මත්ද්‍රව්‍ය නිවාරණ පණිවුඩ හා උපදේශන සේවාවන් ජංගම දුරකතන තාක්ෂණය ඔස්සේ මහජනතාවට ලබා දීමට කටයුතු කරන ලදි.

ඇමතුම් මධ්‍යස්ථානය විවෘත කිරීම 2016 මැයි 31 වන දින අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපතිතුමාගේ සහ ටෙලිකොම් මොබිටෙල් ආයතනයේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.





මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය නවීකරණය කිරීම සහ අන්තර්ජාලය හරහා තොරතුරු ගෙන්වා ගැනීම

කොළඹ විශ්ව විද්‍යාලීය පරිගණක අධ්‍යාපන ආයතනය විසින් මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය සඳහා අන්තර්ජාලය හරහා ලංකාවේ සියලුම පොලිස් ස්ථානවලින් දත්ත ගෙන්වා ගැනීමට දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සිදු කරන ලදි. දත්ත පද්ධතිය නවීකරණය කිරීමෙන් පසු දත්ත ලබා ගැනීමේ දී මතුවන ගැටලු පිළිබඳ පුහුණු වැඩසටහන් හරහා දැනුවත් කිරීම සිදු කර දත්ත ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සලසන ලදි.

දත්ත පද්ධතියේ දෙවන අදියර ආරම්භ කිරීම

බාහිර සේවා අංශයේ දත්ත පද්ධතිය සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සකස් කරන ලදි.

ADSL අන්තර්ජාල සබඳතාවය SMART අන්තර්ජාල පහසුකම්වලට හැරවීම

මණ්ඩලය තුළ දැනට පවතින අන්තර්ජාල සම්බන්ධතාවය අධිවේගී ස්මාර්ට් අන්තර්ජාල පහසුකම් සහිත තාක්ෂණයෙන් බලගැන්වීම සිදු කරන ලදි.

8.3 ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය

මණ්ඩලයේ සේවාවන් අතර ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය මඟින් ලබා දෙන සේවාවන්ද සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනී. පෙර වර්ෂවල මෙන්ම මෙම වසරේද මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවුවන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය කිරිමෙහිලා ප්‍රතිකාර මධ්‍යස්ථාන මඟින් කැපීපෙනෙන සේවාවක් සිදුකරන ලදී. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම නිසා විවිධ ප්‍රශ්න වලට මුහුණ දුන් මත්ලෝලීන් එම ගැටළු වලින් මුදවා ගැනීම, ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වල සමාජිකයින්ට සහනයක් ලබා දීම, ඔවුන් ගේ හැකියාවන් ශක්තිමත් කිරීම, අධ්‍යාත්මික සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය ආදි ගුණාත්මක වෙනසක් මඟින් ප්‍රතිකාර ක්‍රියාවලිය පෝෂණය කරන ලදි.

ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට සේවාලාභින් ඇතුලත් කර ගැනිමේදී පසුගිය වසරේ අනුගමනය කල වර්ගීකරණයම මෙම වසරේදී අනුගමනය කරන ලදී. ඒ අනුව මෙම වසරේ මණ්ඩලයේ නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන ප්‍රතිකාර මධ්‍යස්ථාන 4 ක් මඟින් ක්‍රියාත්මක කලහ.

ඒ අනුව,

මධ්‍යම පළාත් යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය	මහනුවර
දකුණු පළාත් ප්‍රතිකාර මධ්‍යස්ථානය	ගාල්ල
බස්නාහිර පළාත් ප්‍රතිකාර මධ්‍යස්ථානය	තලංගම
නවදිගන්ත ප්‍රතිකාර මධ්‍යස්ථානය	නිට්ටඹුව

වයස අවුරුදු 21 ට අඩු සේවාලාභීන් යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය වූ මහනුවරටත්
මත්ද්‍රව්‍ය භාවිත කාලය 0 අවු: 6 අතර ගාල්ල පුනරුත්ථාපන මධ්‍යස්ථානයටත්
මත්ද්‍රව්‍ය භාවිත කාලය අවු: 6-12 අතර තලංගම මධ්‍යස්ථානයටත්
මත්ද්‍රව්‍ය භාවිත කාලය අවු: 12 වැඩි අය නවදිගන්ත මධ්‍යස්ථානයටත් වශයෙනි.

ප්‍රතිකාර වැඩසටහන සඳහා ඇතුළත් කරගැනිම

ඉහත වර්ගීකරණයට අනුව සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සේවාලාභීන් ඇතුලත් කර ගැනිම සිදුකල අතර සුපුරුදු පරිදි මෙම වසරේ ද සිය කැමැත්තෙන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත්වීම්, භාරකරුවන්ගේ ඉල්ලීම් මත ඇතුලත් කිරීම්, අධිකරණය සහ ප්‍රජාවිශෝධන ආයතන මඟින් ඇතුලත් කිරීම්, වෙනත් රජය ආයතන දැනුවත් කිරිම මඟින් ඇතුලත් කිරීම් බාහිරසේවා මඟින් අතුලත් කර ගැනීම් බහුලව දක්නට ලැබුනි. ඉහත සියළු ඇතුලත් කිරීම් අපගේ පලපුරුදු උපදේශක වරුන්ගේ මැදිහත්වීම් මත සිදුකල අතර පුර්ව උපදේශන සැසි උපයෝගිකර ගනිමින් සේවාලාභීන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත්කර ගන්නා ලදී.

ඊට අමතරව 2007 අංක 54 දරණ (ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත අනුව අධිකරණය මඟින් පුනරුත්ථාපන කාර්යාංශය වෙත යොමුකරන සේවාලාභීන් කන්දකාඩු ප්‍රදේශයේ පිහිටා ඇති පුනරුත්ථාපන මධ්‍යස්ථානයට යොමුකල අතර අවශ්‍ය අවස්ථාවලදී අපගේ සේවය ඔවුන් වෙත ලබාදෙන ලදී.

ප්‍රතිකාර වැඩසටහනෙහි කාලය

සමස්ථයක් වශයෙන් ගත්කල අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල නේවාසික ප්‍රතිකාර කාලය අවම මාස 3 කි. කිසියම් සේවාලාභියෙක් නේවාසික ප්‍රතිකාර වැඩ සටහන සාර්ථක අයුරින් නිමකලහොත් ඔහුට මාස 3 අවසානයේ නේවාසික ප්‍රතිකාර වැඩසටහනින් සමුගත හැක. එහෙත් උපදේශකවරයාගේ සහ අනෙකුත් කාර්යය මණ්ඩලයේ ප්‍රගති තක්සේරුව අනුව ඔහු තව දුරටත් පුද්ගල සංවර්ධනය කල අයෙකු නම් ඔහුගේ ප්‍රතිකාර කාලය දීර්ඝ කරන ලදී.

ප්‍රතිකාර වැඩසටහන

නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත් කර ගත් පසු සෑම මධ්‍යස්ථානයක්ම ඒ ඒ සේවාලාභියාට අනුරූප වන අයුරින් ප්‍රතිකාර සැලැස්මක් උපයෝගීකර ගනිමින් ප්‍රතිකාර සේවය ලබා දෙන ලදි. විශේෂයෙන්ම සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයක්ම මනෝචිකිත්සක ප්‍රතිකාර ක්‍රමය උපයෝගී කරගනිමින් ඔවුන්ට අදාල සේවාවන් සැපයූහ. මත්ලෝලියා ගේ ගැටළු හඳුනා ගැනීම, ගැටළු නිර්වචනය කරගැනීම, ගැටළු විශ්ලේෂණය තුලින් ඔවුන්ට ගැලපෙන ප්‍රතිකාර සැලැස්ම උපදේශක, සහකාර උපදේශක වරුන්ගේ මැදිහත්වීම යටතේ සකස්කර උපදේශන සහායක වරුන්ගේ ද සහය ඇතිව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙහීදී පුද්ගල උපදේශනය, කණ්ඩායම් උපදේශනය, පවුල් උපදේශන, වෘත්තීය මාර්ගෝපදේශනය, ආත්ම අභිමානය ඇති කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම්, අධ්‍යාත්මික සංවර්ධනය උදෙසාවූ උපදේශනයන්, පරිසර රසවින්දනය ආශ්‍රිත ක්‍රියාකාරකම්. විඳදනාත්මක ගුණාංග සංවර්ධනය වැනි සේවාලාභියා සතු වූ විවිධ හැකියාවන් දියුණු කර ලීමේ අරමුණෙන් වූ ප්‍රතිකාර සැලැස්මක් උපයෝගි කරගැනීම මඟින් අදාල සේවාවන් ලබා දෙන ලදී.

දෛනික වැඩසටහන

සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම නේවාසික සේවාලාභීන් සඳහා පොදු දෛනික වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදි. පෙ.ව. 5.30 සිට රාත්‍රී 10.00 දක්වා දිවෙන මෙම වැඩසටහන උදෑසන හමුව, භාවනා වැඩසටහන්, එළිමහන් හා ගෘහස්ථ ක්‍රීඩා වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, වෘත්තීය පුහුණු වැඩසටහන්, නිශ්ශබ්ද කාලය, විනෝදාත්මක වැඩසටහන්, පුද්ගල සහ කණ්ඩායම් උපදේශන සැසි, සැදෑ හමුව වැනි විවිධ ක්‍රියාකාරකම් මෙම වැඩසටහනෙහි අන්තර්ගතව ඇත. අපගේ සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සුවිශේෂී වැඩසටහන් නොමැති අවස්ථාවල ඉහත දෛනික වැඩ සටහන මධ්‍යස්ථාන තුල ක්‍රියාත්මක කළහ.

අධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන

මත්ලෝලීන් තුලින් ගිලිහී ගිය අධ්‍යාත්මික චර්යාවන් යලිත් පෝෂණය කිරීමේ අරමුණින් අප ගේ සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වේ. සෑම පුර පසලොස්වක පොහොය දිනකම සෑම මධ්‍යස්ථානයකම නේවාසික සේවාලාභීන් අටසිල් සමාදම් කරවීම, ඔවුන් ධර්ම දේශනා සඳහා සවන් දීමට යොමුකිරීම. ආගමික සිද්ධස්ථාන වලට රැගෙන යාම, ප්‍රතිකාර මධ්‍යස්ථාන මුලිකත්වයෙන් බෞද්ධාලෝක මාවත තුල වෙසක් කූඩු නිර්මාණ තරඟ, මධ්‍යස්ථානවල වෙසක් කාඩ් සහ වෙසක් කූඩු නිර්මාණය සේවාලාභීන් දානමය පිංකම් සඳහා යොමු කිරීම, පොසොන් උත්සවය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඒ අතර වේ. මෙම වසරේ බෞද්ධාලෝක මාවතෙහි පැවැත්වූ වෙසක් කූඩු නිර්මාණ තරඟයෙන් නවදිගන්ත ප්‍රතිකාර මධ්‍යස්ථානය දෙවැනි ස්ථානය ලබා ගැනීම සේවාලාභීන් සහ කාර්යය මණ්ඩලය ලත් සුවිශේෂී ජයග්‍රහණයක් වේ.





වෘත්තිය පුහුණු වැඩසටහන්

මෙම වසරේ ද සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සේවාලාභීන් සඳහා විවිධ වූ වෘත්තීය පුහුණු ක්‍රියාකරකම් සිදුකරන ලදි. දෛනික ප්‍රතිකාර වැඩසටහන ක්‍රියාත්මක වන අතරතුර සේවාලාභීන්ගේ දායකත්වය මත වසර පුරාම මෙම වැඩසටහන ක්‍රියාවට නංවන ලදි. සෑම මධ්‍යස්ථානයකම ප්‍රතිකාර ක්‍රියාකාරකමක් වශයෙන් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කලහ.

මධ්‍යස්ථානය	ක්‍රියාත්මක කල පුහුණු වැඩසටයන්
යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය	ලියුම් කවර සැකසිම, කඩදාසි කවර සැකසීම, කෘෂි කටයුතු, ඇන්තුරියම් වගාව, ඕකිඩ් වගාව, මෝටර් කාර්මික.
තලංගම මධ්‍යස්ථානය	පාපිසි සැකසීම, ලියුම් කවර සැකසීම, කඩදාසි මල් සැකසීම, ඕකිඩ් වගාව, කොට්ටා උර මැසීම, කෘෂිකටයුතු, මෝටර් කාර්මික, පරිගණක අලුත්වැඩියාව, රූපලාවන්‍ය.
නවදිගන්ත මධ්‍යස්ථානය	ඉදල් සැකසීම, මල් වගාව (ඕකිඩ්, ඇන්තුරියම්* හතු වගාව, කෘෂි කටයුතු, මල්පෝච්චි සැකසීම, මෝටර් කාර්මික.
ගාල්ල මධ්‍යස්ථානය	ලියුම් කවර සැකසීම, පාපිසි නිර්මාණය, කොට්ටා උර සැකසීම, කෘෂි කටයුතු, පොල්කටු ආශ්‍රිත නිර්මාණ, මල් පෝච්චි සැකසීම, ඕකිඩ්, මෝටර් කාර්මික, විදුලි කාර්මික.





විශේෂිත වැඩසටහන්

ප්‍රතිකාර සහ දෛනික වැඩසටහනට අමතරව සෑම මධ්‍යස්ථානයකම සේවාලාභීන්ගේ රසවින්දනය සඳහා වසර තුල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කලහ. රචනා තරඟ, චිත්‍ර තරඟ, විනෝද චාරිකා වලට සහභාගි කරවා ගැනීම. මසකට වරක් පැවැත්වෙන පැදුරු පාටිය වැනි සුවිශේෂි වැඩසටහන් මෙයට අයත්ය. ආගමික උත්සව ක්‍රීඩා තරඟ, බැති ගී ප්‍රසංග වසර අවසාන ප්‍රාසාංගික වැඩසටහන්, අභිප්‍රේරණ වැඩසටහන් ද ඒ අතර වේ.





ආදායම් උත්පාදනය

මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල 2015 වසරේ ද ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ග දෙකක් දක්නට ලැබිනි. පොල්වගාව තුලින් ලබා ගන්නා ලද අදායම සහ ගෙවීම් පදනම මත ප්‍රතිකාර සඳහා ඇතුලත් වූ සේවාලාභින්ගෙන් ලැබූ ආදායම් වශයෙනි.

උපදේශන සහ ප්‍රතිකාරසේවා සැපයීම

මෙම වසරේ මණ්ඩලය මඟින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවුවන් 2752 දනෙක් සඳහා ප්‍රතිකාර සේවා සැපයීම් සිදුකරන ලදී. මින් 1842 දෙනෙක් සඳහා අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් උපදේශන සේවා සපයා ඇති අතර නේවාසික ප්‍රතිකාරයට ඇතුලත් කර ගත් මුළු සංඛ්‍යාව 841 කි.

බස්නාහිර පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය තලංගම

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 50 කට නේවාසික ප්‍රතිකාරය ලබා දිය හැකිය. මධ්‍යස්ථාන ප්‍රතිකාර වැඩසටහන අංශ 3 කින් සමන්විත වේ. සමාන්‍ය අංශය, ගෙවීම් අංශය, කාන්තා අංශය වශයෙනි. මධ්‍යස්ථානය මඟින් 2016 වසරේ සේවාලාභීන් 753 දෙනෙක් සඳහා උපදේශන කටයුතු සිදුකර තිබු අතර සමාන්‍ය අංශය මඟින් සේවාලාභීන් 447 ක් සඳහා ද ගෙවීම් අංශය මඟින් සේවාලාභීන් 278 ක් සඳහා ද කාන්තා අංශය මඟින් සේවාලාභීන් 28 ක් සඳහා ද උපදේශන කටයුතු ලබා දී තිබුනි.

ඔවුන් අතරින් ප්‍රතිකාර සඳහා ඇතුලත් කරගත් මුළු සංඛ්‍යාව 181 කි. සාමාන්‍ය අංශය මඟින් සේවාලාභීන් 88 ක් ද ගෙවීම් අංශය මඟින් සේවාලාභීන් 13 ක්ද කාන්තා අංශය මඟින් සේවාලාභීන් 13 ක් සඳහා ද ප්‍රතිකාර කටයුතු ලබා දි තිබුනි.

මෙම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර වැඩසටහන මඟින් ක්‍රියාත්මක කල විශේෂිත වැඩසටහන්

- සෑම පුර පසලොස්වක පොහොය දිනකම සිල්සමාදන් වැඩසටහන් හා ධර්ම දේශනා සහ ධර්ම සාකච්ඡා පැවැත්වීම.
- මාසික දෙමාපිය හමුව සහ පසු රැකවරණ හමු පැවැත්වීම.
- සේවාලාභීන්ගේ රසවින්දනය සඳහා පැදුරු පාටි පැවැත්වීම. සංගීත වැඩසටහන් පැවැත්වීම.
- ක්ෂයරෝග මර්ධන වැඩසටහන් සඳහා කාර්යය මණ්ඩල සහ සේවා ලාභීන් දැනුවත් කිරීම. කාර්යය මණ්ඩල පුහුණු සැසි. H.I.V. හා ලිංගාශ්‍රිත රෝග පිළිබඳ විශේෂ දේශන හෙපටයිටිස් සී සඳහා දැනුවත් කිරීම සහ ප්‍රතිකාර කිරීම.
- වෙසක් උත්සවය ආශ්‍රිත ආගමික ක්‍රියාකාරකම්. භක්ති ගීත ගායනය, බෞද්ධාලෝක වෙසක්කූඩු තරඟයෙන් ත්‍යාග ගැනීම
- සිංහල අලුත් අවුරුදු උත්සවය.
- කාන්තාවන් සඳහා උපදේශන සහ ප්‍රතිකාර මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වා ගෙන යෑම.
- ඩෙංගු මර්ධන වැඩසටහන් සහ ශ්‍රමදාන.
- රූපලාවන්‍ය පිළිබඳ වැඩමුළුව පැවැත්වීම.
- කෘෂිකර්ම කටයුතු වගාව, මල් වගාව.
- කාර්යය මණ්ඩල පුහුණු සැසි
- ක්‍රීඩා කටයුතු
- වැඩිහිටි ඉංග්‍රීසි පංති,
- නත්තල් උත්සවය
- වසර අවසන් සාදය

මධ්‍යම පළාත් (යොවුන්) ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය මහනුවර

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 35 දෙනෙකුට එකවර සේවය ලබා දිය හැකිය. මෙම වසරේ මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 205 දෙනෙක් සඳහා උපදේශන කටයුතු ලබා දී තිබු අතර ඉන් 101 ක් සඳහා නේවාසික ප්‍රතිකාර සේවාවන් ලබා දෙන ලදී. 2012 සැප්තැම්බර් මස සිට මෙම මධ්‍යස්ථානය යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය ලෙස නම් කර කරන ලදී.
මධ්‍යම පළාත් යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය මඟින් පහත සඳහන් සුවිශේෂී වැඩසටහන් මෙම වසර තුල ක්‍රියාත්මක කරන ලදී.

- සේවාලාභීන්ගේ චින්තන හැකියාවන් සංවර්ධනය සඳහා මසකට දෙවතාවක් ක්ෂේමභූමි සමිතිය පැවැත්වීම හා ක්ෂේමභූමි සඟරාව එළිදැක්වීම.

- සේවාලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධන ක්‍රියාවලිය සඳහා මසකට වරක් සිල්සමාදන් වීමේ වැඩසටහන, හේන්දෙනිය රජමහා විහාරයේ ශ්‍රමදානය, මහාසංඝරත්තනය වැඩමවා ධර්ම දේශනා පැවැත්වීම,

- ඔවුන්ගේ දැනුම සහ කුසලතා සංවර්ධනය සඳහා විවාද තරඟාවලි, ඉංග්‍රීසි පංති පැවැත්වීම, ප්‍රශ්නවිචාරාත්මක වැඩසටහන්, නැටුම් පංති, රචනා තරඟ, චිත්‍ර තරඟ, අ.පොෂ (ස.පෙල) විභාගය සඳහා සුදානම් කරවීම, සංගීත පංති,

- පවුල් සබඳතා ගොඩනැගීම සඳහා සෑම සමසකට වරක් දෙමාපියහමු පැවැත්වීම. රසාස්වාදය දියුණු කිරීම උදෙසා චිත්‍රපටි නැරඹීම, පැදුරු සාද පැවැත්වීම, හැකි නම් අඳින්න වැනි කාණ්ඩායම් ක්‍රියාකාරකම්, සැදෑ හමු, විවිධ නාට්‍ය රඟ දැක්වීම්, කෙටි කථා, ගීත ගායනා, වැනි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

- ආගමික චාරිකා වශයෙන් ගඩලාදෙනිය, ඇම්බැක්කේ, ලංකා තිලක රජමහා විහාරස්ථාන වන්දනා කිරීම.

- සිංහල අළුත් අවුරුදු උත්සවය සැමරීම, ඒ සඳහා විවිධ ජන ක්‍රීඩා පැවැත්වීම, වෙසක් උත්සවය සඳහා භක්ති ගීත ගායනය සහ ආගමික වැඩසටහන් පැවැත්වීම, බෞද්ධාලෝක වෙසක් කුඩු තරඟයෙන් ත්‍යාග ලබා ගැනීම.

- වොලිබෝල්, ටේබල් ටෙනිස්, කැරම් ක්‍රිකට්, දාම්, චෙස්, බැඩ්මින්ටන් තරඟාවලි පැවැත්වීම.

- මාසික සහ සති පතා කාර්යය මණ්ඩල හා ප්‍රතිකාර හමු පැවැත්වීම.

- එස් පහ වැඩසටහන වසර පුරා ක්‍රියාත්මක කරන ලදී.

- පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සහ වෙනත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්.

- විවිධ සෞඛ්‍ය වැඩසටහන් දන්ත සායන, ඩෙංගු මර්ධන ශ්‍රමදාන, මනෝ වෛද්‍ය විශේෂඥ අරඹේපොල මිය විසින් මානසික සෞඛ්‍ය පිළිබඳ දේශන පැවැත්වීම.

- ලෝක ළමා දිනයට සමගාමී විශේෂිත ක්‍රියාකාරකම්.

- වෘත්තීය පුහුණුව වශයෙන්, ලියුම් කවර, ඕකිඩ් වගාව ආශ්‍රිත ක්‍රියාකාරකම්, කෘෂිකාර්මික කටයුතු, මෝටර් කාර්මික පුහුණුව.

- අබින වැඩසටහන

- වසර අවසානයේ නත්තල් උත්සවය සහ දෙසැම්බර් 31 දින වර්ණ රාත්‍රිය පැවැත්වීම

- හෙද පුහුණුව

- වෘත්තීය පුහුණු අධිකාරයේ දැනුවත් කිරීමේ වැඩසටහන

- යෝගා වැඩසටහන

දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ගාල්ල

මෙම මධ්‍යස්ථානය මගින් ද එකවර සේවාලාභීන් 40 කට සේවය සැපයිය හැකිය. 2014 වසරේ සිට ගෙවීම් අංශයක්ද ආරම්භ කරන ලදී. ඒ අනුව දෛනිකව මෙම වසර තුල සේවාලාභීන් 279 ක් සඳහා උපදේශන කටයුතු ද 131 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර කටයුතු සඳහා ද ඇතුලත් කරගෙන තිබුනි. මෙම මධ්‍යස්ථානය මගින් ද නේවාසික සේවාලාභීන් සඳහා පහත සඳහන් වැඩසටහන් වසර තුල ක්‍රියාත්මක කරන ලදී.

- ඩෙංගු මර්ධන වැඩසටහන්, දත්ත සායන, කායික හා මානසික සෞඛ්‍ය ආශ්‍රිත දේශන මධ්‍යස්ථානය තුල ශ්‍රමදාන කටයුතු.
- මාස්පතා සිල් සමාදන් වැඩසටහන, වෙසක් සහ පොසොන් උත්සව අශ්‍රිත ක්‍රියාකරකම්.
- බෞද්ධාලෝක වෙසක් කූඩු තරඟයෙන් ත්‍යාග ලබාගැනීම මාසික සහ සතිපතා කාර්ය මණ්ඩල සහ ප්‍රතිකාර හමු පැවැත්වීම.
- කෘෂිකාර්මික වැඩසටහන්, ඕකිඩ් වගාව බිම්මල් වගාව, රෝස වගාවන් පිළිබඳ ලබුදූව කෘෂිවිද්‍යාලයේ දේශනයන් සහ ක්‍රියාකාරකම්. විවිධ වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම, මොටර් කාර්මික, ඉලෙක්ට්‍රෝනික්.
- කාර්යය මණ්ඩල පුහුණු සැසි, සතිපතා සහ මාසික කාර්යය මණ්ඩල හමු.
- පවුල් හමු, පසුරුකවරණ හමු.
- යෝගා වැඩසටහන්.
- ලෝක ළමා දින ආශ්‍රිත විශේෂ වැඩසටහන්.
- එස් 5 වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සහ ඊට සමගාමී මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.
- අවුරුදු උළෙල, වෙසක් පොසොන් උත්සව, නත්තල් උත්සවය ආශ්‍රිත ආගමික ක්‍රියාකාරකම්.
- වොලිබෝල් ක්‍රිකට් කබඩි දාම් චෙස් කැරම් බැඩ්මින්ටන් වැනි ක්‍රීඩා
- කාය වර්ධන වැඩසටහන්
- වසර අවසන් වර්ණ රාත්‍රිය.
- රාජගිරිය ආරියඥාන හිමියන්ගේ ධර්මශ්‍රණය සඳහා දරුවන් සම්බන්ධ කරවීම
- කන්එළිය රක්ෂිතය නැරඹීම
- කොග්ගල මාර්ටින් වික්‍රමසිංහ කෞතුකාගාරය සහ රූමස්සල කන්ද නැරඹීම
- වාර්ෂික මහා කලා මංගල්‍යය පවත්වන ලදී.
- රාජගිරිය අරියඥ හිමියන්ගේ ධර්මදේශනයක් සඳහා දරුවන් සම්බන්ධ වීම

නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නිට්ටඹුව

සේවාලාභීන් 60 කට එකවර සේවය සැපයිය හැකිය. ගෙවීම් අංශයක්ද පවතින අතර 2016 වසරේ උපදේශන සැපයූ මුළු සේවාලාභීන් සංඛ්‍යාව 605 කි. ඉන් 401 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර ලබා දී තිබුනි.

නවදිගන්ත මධ්‍යස්ථානය මඟින් මෙම වසර තුල පුනරුත්ථාපන වැඩසටහනෙහි පහත ක්‍රියාකරකම් සිදු කරනලදී.

- මාසික සිල්සමාදන් වැසටහන
- සිංහල අලුත් අවුරුදු උත්සවය
- වෙසක්, පොසොන්, නත්තල් උත්සව ආශ්‍රීත ක්‍රියකාරකම්
- ඩෙංගු මර්ධන ආශ්‍රීත ක්‍රියාකාරකම් ශ්‍රමදාන
- බෝධි පුජා වැඩසටහන්
- කාර්ය මණ්ඩල පුහුණු සැසි
- සතිපතා ප්‍රතිකාර හමු
- මාසික කාර්යය මණ්ඩල සැසිය
- පවුල් හමුව
- දොමාපිය හමුව
- එස් පහ වැඩසටහන
- කායික සහ මානසික සෞඛ්‍ය පිළිබඳ දේශන
- විවාද තරඟ
- වෘත්තීය පුහුණු වැඩසටහන්
- ක්ෂරෝග මර්ධන වැඩසටහන
- කාය වර්ධන වැඩසටහන්
- යෝග වැඩසටහන්.
- පැදුරු පාටි
- ශ්‍රමදාන වැඩසටහන්
- නැටුම් හා නාට්‍ය වැඩසටහන්
- අධ්‍යාපන වැඩසටහන්
- නත්තල් වැඩසටහන්
- 31 වර්ණ රාත්‍රිය
- මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්
- විශ්ව විද්‍යාල සිසුන් සඳහා පුහුණු වැඩසටහන්, උපදේශන සහතික පත් පාඨමාලාවේ ප්‍රායෝගික පුහුණුවී හෙදි නිළධාරීන් රාජ්‍ය, නිළධාරින් සඳහා පුහුණු වැඩසටහන්





පසුරැකවරණ වැඩසටහන 2016

ඒ ඒ මධ්‍යස්ථාන මඟින් 2016 වර්ෂය තුල කරන ලද පසුරැකවරණ තොරතුරු පහතින් දක්වා ඇත. මෙහිදී සේවාලාභීන් මධ්‍යස්ථානයට ගෙන්වා ගැනීම දුරකථන මාර්ගයෙන් තොරතුරු ලබා ගැනීම, බාහිරසේවා වැනි ක්‍රම උපයෝගී කර ගෙන ඇත.





මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්

ඉහත සඳහන් තොරතුරු අනුව මෙම වසරේ ප්‍රතිකාර අංශය වෙත වාර්තා වූ මුළු පසු රැකවරණ තොරතුරු මත අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන මඟින් කරනු ලැබූ මුළු පසුරැකවරණ සේවාලාභීන් සංඛ්‍යාව 2741 කි.

පසුරැකවරණ කටයුතු කල සේවාලාභීන්ගෙන් තලංගම මධ්‍යස්ථානයේ සේවාලාභීන් 713 ක් ද, නුවර මධ්‍යස්ථානයේ 229 ක් ද, ගාල්ල මධ්‍යස්ථානයේ 456 දෙනෙක්ද, නවදිගන්ත මධ්‍යස්ථානයේ සේවාලාභීන් 569 ක් ද, පිලියන්දල මධ්‍යස්ථානයේ 81 ක් ද මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්ව සිටි බවට වාර්තා විය. මේ අනුව අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් පමණක් පුනරුත්ථාපනය වී නිදහස් වුවන්ගෙන් 1967 ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වී ඇත.

කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන

කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත අප මණ්ඩලය මඟින් මෙම වසරේ ද සුවිශේෂී සේවාවක් ලබා දෙන ලදී. අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල සේවාවන්හි නියැලෙන උපදේශන සහකාර නිලධාරි වරුන් ද අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල දීර්ඝ කාලයක් පුහුණුව ලැබූ දෛනික පදනම මත බඳවාගත් උපදේශන සහකාරවරුන් තිදෙනෙකුගේ ද සේවය පූර්ණ කාලීනව ලබා දෙන ලදි.

8.4 නමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය 2016

2007 අංක 54 දරණ ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පිළිබඳ පනතට අනුසාංගිකව 2010 වර්ෂයේ නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන 09 ක් නම් කර ඇත. එනම්,

1. පල්ලෙකැලේ
2. වටරැක
3. තල්දෙන
4. වීරවිල
5. අනුරාධපුර
6. පල්ලන්සේන
7. කන්දෙවත්ත
8. මීතිරිගල
9. අඹේපුස්ස

ඉහත සඳහන් සියලු නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් මෙම මධ්‍යස්ථානයන්ට උපදේශන නිළධාරීන් මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාකාරකම් සඳහා අනුයුක්ත කර ඇත.

පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන

- යෞවන කිතුමඟ ප්‍රතිකාර මධ්‍යස්ථානය
- පැතුම ප්‍රතිකාර මධ්‍යස්ථානය
- අල් අනෝ ක්ලබ් ප්‍රතිකාර මධ්‍යස්ථානය
- බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර මධ්‍යස්ථානය
- නේත්‍රා ප්‍රතිකාර මධ්‍යස්ථානය
- නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය
- යහපත් සමාරියයා ප්‍රතිකාර මධ්‍යස්ථානය
- පොරොන්දු දේශය ප්‍රතිකාර මධ්‍යස්ථානය
- මිත්‍ර ප්‍රතිකාර මධ්‍යස්ථානය
- යෞවන සහන සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය
- මිතුරු මිතුරෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය
- නිදහස ප්‍රතිකාර මධ්‍යස්ථානය
- සෙනෙහස ප්‍රතිකාර මධ්‍යස්ථානය
- අඳුරින් ආලෝකය ප්‍රතිකාර මධ්‍යස්ථානය
- කරුණාවේ නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය
- මිදුම ප්‍රතිකාර මධ්‍යස්ථානය
- බලය නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය
- සුමිත්‍රයෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය
- ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය
- සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය

- විමෝචන ප්‍රතිකාර මධ්‍යස්ථානය
- බොස්කෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය
- නිසංසල ප්‍රතිකාර මධ්‍යස්ථානය
- මිතුරු සෙවන ප්‍රතිකාර මධ්‍යස්ථානය

ඉහත සඳහන් කළ පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අතුරින් ගැසට් පත්‍රයේ සඳහන් අවම ප්‍රමිතීන් සම්පූර්ණ කර මණ්ඩලයේ බලපත්‍රය ලබාගත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයන් දොළහක් ඇත.

2016 වර්ෂයේ නම් කරන ලද ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයන් තුළ සිදු කළ උපදේශන වැඩසටහන්

	වීරවිල	පල්ලෙකැලේ	ගාල්ල	බූස්ස	අනුරාධපුර	මහර	කන්දෙවත්ත	මීතිරිගල	අඹේපුස්ස
මුලු ලියාපදිංචි සංඛ්‍යාව	119	181	797	250	28	36	38	20	93
මුලු උපදේශන සංඛ්‍යාව	251	250	1005	565	96	48	12	27	516
නව සේවාලාභීන් සංඛ්‍යාව	44	–	743	250	62	28	32	18	72
මුදාහරිනු ලැබූ සංඛ්‍යාව	18	77	278	149	81	10	15	05	47
පසු රැකවරණ සංඛ්‍යාව	19	77	19	05	73	14	16	10	58

8.5 බාහිර සේවා 2016

බාහිර සේවා ඒකකය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ හි ප්‍රධාන කොටස් වලින් එකකි. බාහිර සේවා වැඩ සටහන් මඟින් විශේෂ අවධානය යොමු කරනුයේ මහජනතාවගේ අවබෝධය වර්ධනය කිරීම, ඉල්ලුම් අවම කිරීම සහ සැපයුම අවම කිරීම යන අංශ දෙක පිළිබඳව අවධානය යොමු කරන්නෙමු. නිවාරණය, ප්‍රතිකාර කිරීම, පුනරුප්තාපනය කිරීම, සහ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට ඇබ්බැහියෙන් නිදහස් වීම සඳහා අප ඔවුන්ට උපදෙස් ලබා දෙන්නෙමු. එසේම ඔවුන්ගේ පවුල් වල උදව්යද බලගන්වන්නෙමු. අප බාහිර සේවා ඒකකය පළාත් 08 ක සියළුම දිස්ත්‍රික්ක ආවරණය කරමින් වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ.




මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් අනුව හඳුනාගැනීම 2016

වගුව 01

පළාත	හෙරොයින්	ගංජා	මධ්‍යසාර	වෙනත්
බස්නාහිර	1449	838	434	318
මධ්‍යම	150	120	371	65
උතුරු මැද	177	139	117	12
වයඹ	156	141	311	28
දකුණ	169	145	81	11
උතුර	178	263	317	147
සබරගමු	233	118	471	28
නැගෙනහිර	46	34	35	1
එකතුව	**2558**	**1798**	**2137**	**610**

බාහිර සේවා නිලධාරීන් විසින් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් 7103 ක් හඳුනා ගෙන ඇති අතර ඉන් 2558 ක් හෙරොයින් භාවිත කරන්නන්ය.

ප්‍රස්තාරය 01



මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් 1320 ප්‍රතිකාර සඳහා රෝහල් සහ අපගේ මධ්‍යස්ථාන වෙත යොමු කරන ලද අතර මධ්‍යස්ථානගතව සිටි හා කේෂත්‍රයේ සිටියදීම මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වූ සංඛ්‍යාව 2050 කි.

වගුව 02

පළාත	යොමු කිරීම	භාවිතයෙන් නිදහස්වීම
බස්නාහිර	754	741
මධ්‍යම	67	182
උතුරු මැද	39	380
වයඹ	197	
දකුණ	197	649
උතුර	5	
සබරගමු	30	48
නැගෙනහිර	31	50
එකතුව	**1320**	**2050**

වගුව 03

පසු රැකවරණ

පළාත	ප්‍රජා	මධ්‍යස්ථානය පවුල් උපදේශණය	මධ්‍යස්ථානය	බන්ධනාගාර
බස්නාහිර	1426	688	1298	217
මධ්‍යම	644	124	214	8
උතුරු මැද	288	92	77	36
වයඹ	446	88	180	41
දකුණ	439	34	296	34
උතුර	237	67	55	20
සබරගමු	255	38	43	12
නැගෙනහිර	380	5	13	35
එකතුව	**4115**	**1136**	**2176**	**403**

දැනුවත් කිරීම හා පුහුණු වැඩසටහන

ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, ඇතුළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා අපගේ බාහිර සේවා ඒකකය විසින් පවත්වන ලද වැඩසටහන් වල තොරතුරු පහත පරිදි වේ.

වගුව 4

පළාත	රාජ්‍ය නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්		බන්ධනාගාර වැඩසටහන්		පාසල් සිසුන් දැනුවත් කිරීම	
	ප්‍රමාණය	සහභාගි වූ සංඛ්‍යාව	ප්‍රමාණය	සහභාගි වූ සංඛ්‍යාව	ප්‍රමාණය	සහභාගි වූ සංඛ්‍යාව
බස්නාහිර	175	6673	21	280	124	14067
මධ්‍යම	184	4592	2	90	66	5621
උතුරු මැද	22	1097	-	-	28	2011
වයඹ	50	3978	-	-	63	6839
දකුණ	232	2753	-	-	32	6658
උතුර	35	4763	-	-	113	3015
සබරගමු	49	3511	21	329	39	4678
නැගෙනහිර	18	647	-	-	30	2582
එකතුව	**765**	**28014**	**44**	**699**	**495**	**45471**

වගුව 5 **බාහිර සේවා අංශය විසින් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.**

පළාත	ප්‍රජා වැඩසටහන්		සමාජ සංවිධන		ඔසුසැල්	
	ප්‍රමාණය	සහභාගි වූ සංඛ්‍යාව	ප්‍රමාණය	සහභාගි වූ සංඛ්‍යාව	ප්‍රමාණය	සහභාගි වූ සංඛ්‍යාව
බස්නාහිර	156	7588	81	3060	152	1438
මධ්‍යම	163	2310	142	3135	43	3665
උතුරු මැද	37	830	17	820	12	251
වයඹ	188	1823	35	2633	15	322
දකුණ	41	1513	27	1500	33	1351
උතුර	38	1415	43	897	21	425
සබරගමු	41	1386	29	666	27	809
නැගෙනහිර	20	617	17	1150	19	682
එකතුව	**684**	**17482**	**391**	**13861**	**322**	**8943**

බාහිර සේවා අංශය මත්ද්‍රව්‍ය නිවාරණය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ විවිධ වූ වැඩසටහන් රාශියක් පවත්වනු ලැබීය. ඒ අතර දුම්වැටි විරෝධී දිනය වෙනුවෙන් යාපනය දිස්ත්‍රික්කයේ පා ගමනක් හා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත් වූ අතර ඒ සඳහා පාසල් සිසුන්, ගුරුභවතුන් හා දෙමව්පියන් විශාල පිරිසක් මේ සඳහා සහභාගි විය. මෙම වැඩසටහන යාපනයේ දිස්ත්‍රික් බාහිර සේවා කටයුතු වල නියැලි සිටින එඩ්වින් රොජර් මහතා විසින් සංවිධානය කරන ලදී.



මීට අමතරව විශේෂ වැඩසටහන් මාලාවක් මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්, පාසල් සිසුන්, ව්‍යත්තීය අධ්‍යාපනය හදාරන සිසුන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශවල නිළධාරීන් හා සාමාන්‍ය ජනතාව සඳහා විශේෂ වූ නිවාරන ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් බාහිර සේවා නිළධාරී ආරියරත්න මහතා විසින් පවත්වන ලදී. මීට අමතරව මහනුවර ඇසළ පෙරහැර වෙනුවෙන් ද දින කීපයක වැඩසටහන් මාලාවක් පවත්වන ලද අතර මේතුලින් මහනුවර දිස්ත්‍රික්කයේ සෑම කණ්ඩායමක් කෙරෙහි අවධානය යොමු වූ නිසා වැඩි ඵලදායිතාවයක් ලබා ගැනීමට හැකියාව ලැබුනි.



රත්නපුර සමන් දේවාලයේ පෙරහැර පැවැත් වූ දිනවලදි අපගේ මත්ද්‍රව්‍ය නිවාරනය පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රදර්ශන කුටියක් සමන් දේවාලයේ ගරු බස්නායක නිලමේතුමාගේ ආරාධනයෙන් සහකාර බාහිර සේවා නිළධාරිනි චානිකා අබේසිංහ විසින් සංවිධානය කරන ලදි.. එම වැඩසටහන මණ්ඩලයේ බාහිර සේවා නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් ඉතාමත් සාර්ථක පැවැත්වීමට හැකි විය.



ලෝක ළමා දින වැඩසටහන

ලෝක ළමා දිනය වෙනුවෙන් විශේෂ වැඩසටහනක් දෙහිවල ප්‍රදේශයේ සහකාර බාහිර සේවා නිළධාරිනි මොනිකා අමරසිංහ විසින් සංවිධානය කර පවත්වන ලද අතර එම වැඩසටහන මෙම ප්‍රදේශයට වඩාත් යෝග්‍ය විය. ළමා පරපුර ඉලක්ක කර ගනිමින් නොයෙක් ආකාරයේ ජාවාරම් මෙම ප්‍රදේශය තුල බහුලව ක්‍රියාත්මක වන අතර මෙම ව්‍යසනයෙන් දරුවන් ගලවා ගැනීමේ අරමුණින් දෙමව්පියන්, ළමයින් සහ ගුරුභවතුන් දැනුවත් කිරීම ළමා දිනය මුල් කර ගනිමින් සිදු කෙරිනි.



මීට අමතරව දෙහිවල ප්‍රදේශයේ ප්‍රජා මූලික වැඩසටහන් එනම් මොරටුව ලුනාව රෝහලේ පවත්වන උපදේශන සායනය, වෙරළ තීරයේ ජනතාව දැනුවත් කිරීම, ධීවර ජනතාව මෙන්ම පාසල් නොයන දරුවන් දැනුවත් කිරීම ආදි විවිධ වූ වැඩසටහන් දෙහිවල, රත්මලාන, මොරටුව, ගල්කිස්ස ප්‍රදේශවල පවත්වන ලද අතර ඒ තුලින් විශාල ජනතාවකට මහගු සේවයක් කිරීමට හැකියාව ලැබුනි. තවද මත්ද්‍රව්‍ය ජාවාරම හා භාවිතය වැඩි වශයෙන් දක්නට ලැබෙන ඉහත ප්‍රදේශ සදහා මෙම වැඩසටහන් තුලින් දැඩි බලපෑමක් ඇති කිරීමට හැකියාව ලැබුනු අතර මෙම වැඩසටහන් සිදු කිරීමේ දී එම ප්‍රදේශවල පොලිස් ස්ථාන, ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා ග්‍රාම නිළධාරි ආදි සෑම රාජ්‍ය නිළධාරියකුගේම ද සහය නිරන්තරයෙන් ලැබුනි.



බන්ධනාගාර නිළධාරින් දැනුවත් කිරීම

වැලිකඩ බන්ධනාගාරයේ නිළධාරින් සදහා මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සම්බන්ධ පුහුණු වැඩසටහනක් සහකාර අධ්‍යක්ෂ ඩබ් මාරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සහකාර බාහිර සේවා නිළධාරිනි තුෂාරා නිල්මිනි මහත්මිය විසින් සංවිධානය කර තිබුනි.



මත්ද්‍රව්‍ය නිවාරණ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම මෙම වැඩසටහන සෑම පළාතක්ම ආවරණය වන පරිදි මණ්ඩලයේ ප්‍රතිපාදන මත හා මාර්ග සංවර්ධන අධිකාරියේ, නගර සභාවල, රෝහල්වල, පොලිස් ස්ථාවල මෙන්ම අනෙකුත් රාජ්‍ය ආයතන වල අවසරයෙන් ප්‍රදර්ශනය කිරීමට හැකියාව ලැබුනි. මෙහි දී කොළඹ ප්‍රදේශයේ ගාල්ල මාතර හම්බන්තොට අනුරාධපුර පොලොන්නරුව රත්න්නපුර කෑගල්ල මහනුවර නුවරඑළිය යාපනය කළුතර මාතලේ යාපනය අම්පාර මඩකලපුව කුරුණෑගල පුත්තලම ආදි ප්‍රදේශ ආවරණය කරමින් නගරයේ මහජනයා වැඩිවශයෙන් ගැවසෙන ස්ථාන වල දැන්වීම් පුවරු 25 ක් ස්ථාපනය කිරීමට හැකියාව ලැබුනි.



කැළණි විහාරය අසල



රත්නපුර



යාපනය

රියදුරන්ගේ අවබෝධය වර්ධනය කිරීම

මෙහි තවත් පියවරක් ලෙස ත්‍රීරෝද රථ, පාසල් වෑන්, බස්රථ රියදුරන්,දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

වගුව 6

පළාත	ත්‍රී රෝද රථ රියදුරන්	බස්රථ රියදුරන්	වෑන් රථ රියදුරන්
බස්නාහිර	995	101	221
මධ්‍යම	2157	770	48
උතුරු මැද	567	159	135
වයඹ	402	99	81
දකුණ	208	-	-
උතුර	578	556	432
සබරගමු	227	85	15
නැගෙනහිර	358	256	227
එකතුව	**5492**	**2026**	**1159**

මත්ද්‍රව්‍ය නිවාරණ ජංගම වැඩසටහන්

වගුව 7

පළාත	ප්‍රමාණය	ආවරණය වූ සංඛ්‍යාව
බස්නාහිර	67	25735
මධ්‍යම	25	88450
උතුරු මැද	1	2500
වයඹ	11	19300
දකුණ	11	3225
උතුර	-	-
සබරගමු	16	9367
නැගෙනහිර	1	250
එකතුව	**132**	**148827**

මහා බෝධි උපදේශණ මධ්‍යස්ථානය

මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට අවශ්‍ය උපදේශණය ලබා දීම සඳහා උපදේශන සේවාවන්ද මෙම අංශයේ ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා මරදාන මහාබෝධි විහාරයේ උපදේශන මධ්‍යස්ථානයක්ද පවත්වාගෙන යනු ලැබේ.

2016 වර්ෂයේ එම මධ්‍යස්ථානයේ උපදේශනය ලැබූ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් සහ ඔවුන්ගේ පවුල්වල සංඛ්‍යාව 755කි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ස්ථාපිත කර ඇති මහජන තොරතුරු මධ්‍යස්ථානය (1984)

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් නීති විරෝධී මත්ද්‍රව්‍ය, මධ්‍යසාර බලපෑම් විමර්ශන තොරතුරු මධ්‍යස්ථානය 2014/04/09 දින ස්ථාපනය කරනු ලැබූ අතර එම මධ්‍යස්ථානය සඳහා මහජනතාවගෙන් තොරතුරු සහ පැමිණිලි ලබා ගැනීම සඳහා ක්ෂණික ඇමතුම් 1984 සහ 0112077778 දුරකථන අංකයන් විවෘත කරනු ලැබිණි.

ඉහත දුරකථන ඔස්සේ යොමු කරනු ලබන පැමිණිලි හා තොරතුරු ද, ලිපි මගින් යොමු කරන පැමිණිලි සහ තොරතුරු ද මධ්‍යස්ථානය වෙත පැමිණ ලබා දෙන පැමිණිලි ද විමර්ශනය සඳහා පොලිස් කොට්ඨාශ සහ සුරාබදු දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, වලාන දූෂණ මර්ධන ඒකකය, පොලිස් විශේෂ කාර්ය බලකාය සහ ඖෂධ නියාමන අධිකාරිය යන ආයතන වෙත යොමු කරනු ලබයි.

එම ආයතන වෙත තබා දෙන පැමිණිලි විමර්ශන කටයුතු සහ වැටලීම් සිදු කර අප වෙත ප්‍රතිපෝෂණය ලබා දෙන අතර පැමිණිලිකරුවන් ඒ සම්බන්ධව විමසීම් කිරීමේදී ඒ පිළිබඳ දැනුවත් කිරීම් තොරතුරු මධස්ථානය විසින් සිදු කරනු ලබයි.

මීට අමතරව මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වී සිටින පුද්ගලයන් සඳහා උපදේශනයත් පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට යොමු කිරීමත් මෙම තොරතුරු මධස්ථානය මගින් සිදු කරනු ලබයි.

ඒ අනුව 2016 වර්ෂයේ තොරතුරු මධ්‍යස්ථානය වෙත ලැබී ඇති පැමිණිලි වැටලීම් සඳහා යොමු කිරීම් පහත සඳහන් ආයතන වෙත විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා යොමු කර ඇත.

2016 වර්ෂය

වගුව 8

ලැබී ඇති පැමිණිලිවල ස්වභාවය	පැමිණිලි සංඛ්‍යාව	ලැබුණු පැමිණිලි විමර්ශනය සඳහා යොමු කළ ආයතන					
		ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය	විශේෂ කාර්ය බලකාය	සුරාබදු දෙපාර්තමේන්තුව	වලාන මත්ද්‍රව්‍ය දූෂණ මර්ධන ඒකකය	මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය	ඖෂධ නියාමන අධිකාරිය
හෙරොයින්/ ගංජා	618	618	62	00	09	04	00
නීති විරෝධී මධ්‍යසාර (කසිප්පු)	637	502	04	568	21	00	00
මත්පෙති/නීති විරෝධී ඖෂධ ශාලා	22	02	01	00	00	00	21

8.6 ජාතික මාදක රසායනාගාරය

ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව ඇති දුර්භාවිත ඖෂධයන් හඳුනා ගැනීම.

වීදි වල දක්නට ලැබෙන මත්ද්‍රව්‍යය ; හෙරොයින් වලට අදාළ පර්යේෂණ

නිරතුරුවම සිදු කරන විශ්ලේෂණයන්ට අමතරව පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අඛණ්ඩව සිදු කරනු ලබයි.

- වීදි වල දක්නට ලැබෙන හෙරොයින් වල මිල සහ පිරිසිදුභාවය අනාවරණය කොට එහි ඇති සම්බන්ධතාවය හඳුනා ගැනීම සඳහා සිදු කරනු ලබන පර්යේෂණ.
- හෙරොයින් සාම්පල වල මුලාරම්භය හා විකාශනය හඳුනා ගැනීම.
- වීදි හෙරොයින් සාම්පල වල ඇති නව තනුකකරණ ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා වන විශ්ලේෂණයන්.

මෙම ව්‍යාපෘතිය පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශයේ සහයෝගය ඇතිව සිදු කරනු ලබන අතර දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් මාසිකව එකතු කර ගන්නා සාම්පල රසායනාගාරය වෙත යොමු කරනු ලබයි.

2016 වසර තුළ දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් වීදි හෙරොයින් සාම්පල 133 ලැබී ඇති අතර ඒවායේ අඩංගු ඩයි ඇසටයිල් මෝර්ෆීන් (හෙරොයින්) ප්‍රතිශතය, එකතු කරන හා තනුකකරණ ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණ සිදු කොට ඇත.

වගු අංක 01 2016 වසරේදී විශ්ලේෂණ කරන ලද සාම්පල සංඛ්‍යාව.

මාසය	සාම්පල සංඛ්‍යාව
ජනවාරි	14
පෙබරවාරි	16
මාර්තු	17
අප්‍රේල්	
මැයි	
ජූනි	18
ජූලි	16
අගෝස්ත	
සැප්තැම්බර්	17
ඔක්තෝම්බර්	
නොවැම්බර්	20
දෙසැම්බර්	15
එකතුව	133

වීදි හෙරොයින් සාම්පල වල මිල සහ පිරිසිදු භාවය අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීම, භාවිතා කරන්නා හා වෙළඳ පොල අතර සම්බන්ධය අධීක්ෂණය සඳහා ඉතාමත් හොඳ දර්ශකයක් ලෙස සැළකීමෙන් සුලභතාවයෙහි ඇති වන්නා වූ වෙනස්කම් ඉතා පහසුවෙන් වටහා ගත හැකිය. මීට අමතරව මිල සහ පිරිසිදුභාවය අතර ඇති සබඳතා පැහැදිලි කර ගැනීමෙන් මත්ද්‍රව්‍ය සැපයුමේ විධික්‍රම හඳුනා ගැනීම තුළින් සැළසුම් සහගත ඉලක්ක භාවිතා කරගනිමින් ක්‍රියාත්මක වීම තුලින් ජාවාරම් කිරීම, ප්‍රවාහනය කිරීම හා අත්අඩංගුවට පත් වන හෙරොයින් වලට මෙන්ම භාවිතා කරන්නන් සඳහා ද වඩාත් හොඳින් නීතිය ක්‍රියාත්මක කළ හැක.

මෙම පර්යේෂණ ව්‍යාපෘතියට අනුව ශ්‍රී ලංකාව තුළ වීදි මට්ටමේ හෙරොයින් සාම්පල වල පිරිසිදුභාවය හා මිල අතර ඇති සබඳතාවය මෙන්ම ක්‍රමානුකූල අධ්‍යනයකින් ලබා ගන්නා තොරතුරු ප්‍රතිපත්ති සැකසුම් වලදීත්, නීතිය ක්‍රියත්මක කරන නිළධාරීන්ගේ කාර්යයභාරයේදීත් වැදගත් වන අතර අත්අඩංගුවට පත් වන මහා පරිමාණ මත්ද්‍රව්‍ය තොග, හෙරොයින් සාම්පල වල පිරිසිදුභාවය හා මිල අතර ඇති සබඳතාවය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි ද යන්න අනාවරණය කරගත හැක.

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යයංශය මඟින් අප්‍රේල්, මැයි, අගෝස්තු හා ඔක්තොබර් මාස වල මත්ද්‍රව්‍ය සාම්පල ලබා දී නොමැති අතර පර්යේෂණය සඳහා බඳුන් වන දිස්ත්‍රික්ක 11 ක් නියෝජනය කරන විවිධ නගර කිහිපයක මිල සහ පිරිසිදුභාවය සම්බන්ධ දත්ත පහත වගුවේ සටහන් වේ. දත්ත වලට අනුව හෙරොයින් වල පිරිසිදුභාවයේ සාමාන්‍ය අගය 21.34% වන අතර 2015 වර්ෂයට සාපේක්ෂව සාමාන්‍ය පිරිසිදුභාවය 5.79% කින් පහල යාමක් හඳුනා ගත හැක.

පිරිසිදුභාවයේ ඉහලම සාමාන්‍යය අගය 43.10% ජුලි මාසයේ දී වාර්තා වන අතර අඩුම සාමාන්‍ය අගය වන 5.34% පෙබරවාරි මාසයේ දී වාර්තා වේ.

වගු අංක 02 සාම්පල වල පිරිසිදුතාවය (ඩයි ඇසටයිල් මෝර්ෆීන් ප්‍රතිශතය)

ප්‍රදේශය	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජුනි	ජුලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
අනුරාධපුරය (අනුරාධපුරය)	-	-	1.59	-	-	-	-	-	33.55	-	-	-
අනුරාධපුරය (අනුරාධපුරය) 1	-	-	-	-	-	33.10	-	-	-	-	-	-
අනුරාධපුරය (අනුරාධපුරය) 2	-	-	-	-	-	0.00	-	-	-	-	-	-
කොළඹ (අවිස්සාවෙල්ල)	16.90	-	-	-	-	-	-	-	-	-	-	-
කොළඹ (කොළඹ)	-	2.35	29.78	-	-	-	-	-	0.00	-	13.75	39.86
කොළඹ (මරදාන) 1	-	-	-	-	-	31.78	-	-	-	-	-	-
කොළඹ (මරදාන) 2	-	-	-	-	-	2.96	-	-	-	-	-	-
කොළඹ (වැල්ලවත්ත)	-	-	-	-	-	-	50.16	-	-	-	-	-
ගාල්ල (ගාල්ල)	34.50	-	1.00	-	-	8.20	0.00	-	0.79	-	4.65	-
ගාල්ල (මිනියාගොඩ)	-	3.51	-	-	-	-	-	-	-	-	-	-
ගම්පහ (ගම්පහ)	0.60	13.51	-	-	-	35.47	49.07	-	45.12	-	21.61	27.09
ගම්පහ (මීගමුව)	15.80	-	-	-	-	-	-	-	-	-	48.58	1.55
ගම්පහ (කැලණිය) 1	-	-	-	-	-	-	-	-	-	-	0.65	-
ගම්පහ (කැලණිය) 2	-	-	-	-	-	-	-	-	-	-	18.70	-
කඵතර (කඵතර)	0.30	-	-	-	-	0.00	50.25	-	39.11	-	54.00	-
මහනුවර (මහනුවර)	-	16.85	-	-	-	-	52.47	-	23.79	-	-	43.08
කෑගල්ල (කෑගල්ල)	-	-	-	-	-	-	-	-	-	-	13.17	11.48
කෑගල්ල (කෑගල්ල) 1	-	-	-	-	-	-	-	-	-	-	-	-
කෑගල්ල (කෑගල්ල) 2	-	-	-	-	-	-	-	-	-	-	-	-
කෑගල්ල (මාවනැල්ල)	19.10	-	-	-	-	-	-	-	-	-	-	-
කුරුණෑගල (කුරුණෑගල)	-	-	-	-	-	0.00	44.04	-	21.15	-	21.22	40.90
කුරුණෑගල (මහව)	22.80	-	-	-	-	-	-	-	-	-	-	-
පොළොන්නරුව (පොළොන්නරුව)	-	-	-	-	-	-	-	-	-	-	49.79	-

පූත්තලම (හලාවත)	-	11.86	-	-	-	11.24	55.35	-	40.16	-	-	73.14
පූත්තලම (හලාවත) 1	-	-	26.01	-	-	-	-	-	-	-	-	-
පුත්තලම (හලාවත) 2	-	-	28.51	-	-	-	-	-	-	-	-	-
පුත්තලම (පුත්තලම)	-	-	-	-	-	31.73	34.73	-	32.58	-	-	-
රත්නපුර (ඇහැලියගොඩ)	-	-	-	-	-	-	51.86	-	-	-	-	-
රත්නපුර (රත්නපුර)	-	-	-	-	-	31.40	-	-	-	-	13.63	12.50
සාමාන්‍යය	**15.73**	**5.34**	**8.79**	-	-	**16.90**	**43.10**	-	**29.53**	-	**23.61**	**27.73**

ශුද්ධ හෙරොයින් මිලිග්‍රෑම් 1 ක සාමාන්‍ය මිල රු. 129.21 සිට රු. 2,206.57 දක්වා වෙනස් වී ඇත. ඉහළම මිල වාර්තා වී ඇත්තේ ඔක්තෝබර් මාසයේ ය. වගු අංක 3 මඟින් පිරිසිදු හෙරොයින් මිලිග්‍රෑම් 1 ක මිල විවිධ ප්‍රදේශයන්හි වෙනස් වන ආකාරය සඳහන් වේ.

වගු අංක 03 වීදි හෙරොයින් සාම්පල වල මිල සහ පිරිසිදුතාවය (ඩයි ඇසටයිල් මෝර්ෆීන් මිලිග්‍රැමයක් සඳහා වන මිල රුපියල් වලින්)

ප්‍රදේශය	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජුනි	ජුලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
අනුරාධපුරය (අනුරාධපුරය)	-	-	7,073.30	-	-	-	-	-	161.99	-	-	-
අනුරාධපුරය (අනුරාධපුරය) 1	-	-	-	-	-	194.22	-	-	-	-	-	-
අනුරාධපුරය (අනුරාධපුරය) 2	-	-	-	-	-	-	-	-	-	-	-	-
කොළඹ (අවිස්සාවෙල්ල)	490.24	-	-	-	-	-	-	-	-	-	-	-
කොළඹ (කොළඹ)	-	1,396.35	185.51	-	-	-	-	-	0.00	-	-	39.79
කොළඹ (මරදාන) 1	-	-	-	-	-	17.36	-	-	-	-	-	-
කොළඹ (මරදාන) 2	-	-	-	-	-	448.43	-	-	-	-	-	-
කොළඹ (වැල්ලවත්ත)	-	-	-	-	-	-	65.8	-	-	-	-	-
කොළඹ (කොළඹ)	-	-	-	-	-	-	-	-	-	-	149.60	-
ගාල්ල (ගාල්ල)	61.88	-	734.41	-	-	308.4	-	-	2036.18	-	817.02	-
ගාල්ල (මීතියාගොඩ)	-	313.68	-	-	-	-		-	-	-	-	-

ගම්පහ (ගම්පහ)	3,572.19	82.86	-	-	-	79.12	149.67	-	45.32	-	89.12	84.02
ගම්පහ (කැළණිය) 1	-	-	-	-	-	-	-	-	-	-	711.25	-
ගම්පහ (කැළණිය) 1	-	-	-	-	-	-	-	-	-	-	47.84	-
ගම්පහ (මිගමුව) 2	162.1	-	-	-	-	-	-	-	-	-	46.94	214.43
කළුතර (කළුතර)	10,875.63	-	-	-	-	-	138.44	-	52.80	-	35.09	-
මහනුවර (මහනුවර)	-	539.63	-	-	-	-	137.99	-	46.45	-	-	188.80
කෑගල්ල (කෑගල්ල)	-	-	-	-	-	-	-	-	-	-	309.90	583.34
කෑගල්ල (කෑගල්ල) 1	-	-	-	-	-	-	-	-	-	-	-	-
කෑගල්ල (කෑගල්ල) 2	-	-	-	-	-	-	-	-	-	-	-	-
කෑගල්ල (මාවනැල්ල)	211.64	-	-	-	-	-	-	-	-	-	-	-
කුරුණෑගල (මහව)	72.29	-	-	-	-	-	-	-	-	-	-	-
කුරුණෑගල (කුරුණෑගල)	-	-	-	-	-	-	213.77	-	47.63	-	69.81	87.70
පොළොන්නරුව (පොළොන්නරුව)	-	-	-	-	-	-	-	-	-	-	108.57	-
පුත්තලම (හලාවත)	-	38.91	-	-	-	246.02	30.97	-	72.93	-	-	15.22
පූත්තලම (හලාවත) 1	-	-	26.38	-	-	-	-	-	-	-	-	-
පූත්තලම (හලාවත) 2	-	-	23.43	-	-	-	-	-	-	-	-	-
පුත්තලම (පුත්තලම)	-	-	-	-	-	86.95	178.69	-	171.58	-	-	-
රත්නපුර (ඇහැලියගොඩ)	-	-	-	-	-	-	118.35	-	-	-	-	-
රත්නපුර (රත්නපුර)	-	-	-	-	-	55.2		-	-	-	222.00	429.80
සාමාන්‍යය	**2,206.57**	**474.28**	**767.58**	**-**	**-**	**130.52**	**129.21**		**329.36**	**-**	**237.01**	**182.57**

වීදි හෙරොයින් සාම්පල වල ඇති ඇල්කොලොයිඩ අපද්‍රව්‍ය, තනුකරණ ද්‍රව්‍ය / එකතු කරන වෙනත් ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා සිදුකරනු ලබන විශ්ලේෂණයන්.

වීදි හෙරොයින් සාම්පල විශ්ලේෂණ රාමුව තුළදී මත්ද්‍රව්‍යයේ ප්‍රමිතිය, එමෙන්ම ඒ අනුව ආරම්භක ප්‍රදේශ හා සාම්පල් එකිනෙක අතර ඇති සම්බන්ධතාවය අනාවරණය වේ.

කෙසේ වෙතත් වඩාත් අර්ථාන්විත නිගමන වලට එළඹීමට නොහැකි වී ඇත්තේ ප්‍රමාණවත් සම්පල ප්‍රමාණයක් නොලැබීම හා එකම ප්‍රදේශයේන් නිසි පරිදි සාම්පල නොලැබීම යන කාරණා හේතුවෙනි. මේ හේතුවෙන් බලාපොරොත්තු වන අභිමතාර්ථයන් සියල්ල සම්පූර්ණ කරගැනීමට නොහැකි වී ඇත.

ඉතා සුළු ප්‍රමාණ වලින් අඩංගු ප්‍රධාන ඇල්කොලොයිඩ හා අපිරිසිදු ද්‍රව්‍ය ගෑස්ක්‍රොමටග්‍රැපි මැස්ස්පෙක්ට්‍රකොපි (Gas Chromatography Mass Spectroscopy) තාක්ෂණය යටතේ හඳුනා ගෙන ඇති අතර ඒවා වගු අංක 04 හා 05 මඟින් පෙන්වා දී ඇත.

වගු අංක 04 වීථි හෙරොයින් සාම්පල දක්නට ඇල්කොලොයිඩ් ඝනයේ අපිරිසිදු ද්‍රව්‍යයන්.

ප්‍රදේශය	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
අනුරාධපුරය (අනුරාධපුරය)	-	-	MOR 6-AC 6-MAM	-	-	-	-	-	MOR-6-ol 6-MAM PAP	-	-	
අනුරාධපුරය (අනුරාධපුරය) 1	-	-	-	-	-	MOR ,6-MAM COD	-	-	-	-	-	
අනුරාධපුරය (අනුරාධපුරය) 2	-	-	-	-	-	MOR ,6-MAM COD	-	-	-	-	-	
කොළඹ (අවිස්සාවෙල්ල)	THE MOR 6-AC 6-MAM	-	-	-	-	-	-	-	-	-	-	
කොළඹ (කොළඹ)	-	-	MOR, 6-AC, 6-MAM	-	-	-	-	-	MOR COD 6-MAM 6-AC	-	6-MAM COD NOS	MEC MAM 6-AC PAP NOS

						MOR 6-MAM COD						
කොළඹ (මරදාන) 1	-	-	-	-	-		-	-	-	-	-	
කොළඹ (මරදාන) 2	-	-	-	-	-	6-AC 6-MAM	-	-	-	-	-	
කොළඹ (වැල්ලවත්ත)	-	-	-	-	-		PAP COD 6-MAM ATH	-	-	-	-	
හාල්ල (හාල්ල)	MOR 6-AC 6-MAM	-	6-AC, 6-MAM	-	-	COD 6-MAM	-	-	-	-	6-MAM COD	None
හාල්ල (මිතියාගොඩ)	-	-	-	-	-		-	-	-	-		
ගම්පහ (ගම්පහ)	6-AC	6-AC 6-MAM	-	-	-	6-AC 6-MAM	PAP COD 6-MAM ATH NOS	-	6-MAM MOR-6-ol	-	6-MAM COD	MEC MAM 6-AC NOS
ගම්පහ (කැළණිය) 1	-	-	-	-	-	-	-	-	-	-	-	
ගම්පහ (කැලණිය) 2	-	-	-	-	-	-	-	-	-	-	NOS COD	
ගම්පහ (මීගමුව)	6-AC 6-MAM	-	-	-	-	-	-	-	-	-	6-MAM COD NOS	MAM 6-AC

කළුතර (කළුතර)	-	-	6-AC 6-MAM	-	-	6-MAM COD	6-MAM ATH COD PAP	-	6-MAM 6-AC NOS	-	6-MAM COD	
මහනුවර (මහනුවර)	-	6-AC 6-MAM MOR	-	-	-	-	PAP COD 6-MAM ATH NOS	-	NOS 6-MAM MOR-6-ol	-	-	MAM 6-AC NOS
කෑගල්ල (කෑගල්ල)	-	-	-	-	-	-	-	-			NOS	MEC MAM 6-AC NOS
කෑගල්ල (කෑගල්ල) 1	-	-	-	-	-	-	-	-	-	-	-	
කෑගල්ල (කෑගල්ල) 2	-	-	-	-	-	-	-	-	-	-	-	
කෑගල්ල (මාටනැල්ල)	6-AC 6-MAM	-	-	-	-	-	-	-	-	-	-	
කුරුණෑගල්ල (කුරුණෑගල)	-	6-AC 6-MAM	-	-	-	COD 6-MAM	PAP COD 6-MAM ATH NOS	-	6-MAM 6-AC		6-MAM COD NOS	MAM 6-AC NOS
කුරුණෑගල (මහව)	THE MOR 6-AC 6-MA	-	-	-	-	-	-	-	-	-	-	

	M											
පොළොන්නරුව (පොළොන්නරුව)	-	-	-	-	-	-	-	-	-	-	6-MAM COD	
පුත්තලම (හලාවත)	-	6-AC 6-MAM	-	-	-	6-MAM	PAP COD 6-MAM ATH NOS	-	6-AC 6-MAM NOS	-	-	MAM 6-AC
පුත්තලම (හලාවත) 1	-	-	6-AC 6-MAM	-	-	-	-	-	-	-	-	
පුත්තලම (හලාවත) 2	-	-	6-AC 6-MAM NOS	-	-	-	-	-	-	-	-	
පුත්තලම (පුත්තලම)	-	-	-	-	-	COD 6-MAM	PAP COD 6-MAM ATH NOS	-	6-AC 6-MAM NOS	-	-	
රත්නපුර (අහැලියගොඩ)	-	-	-	-	-	-	COD 6-MAM ATH NOS	-	-	-	-	
රත්නපුර (රත්නපුර)	-	6-AC 6-MAM	-	-	-	6-MAM COD	-	-	-	-	6-MAM COD NOS	MAM 6-AC NOS

MOR *-Morphine ;* ***AC*** *– Acetylcodeine ;* ***MAM*** *– 6-Acetylmorphine;* ***ATH****-Acetylthebeol ;* ***THE*** *– Thebaine ;* ***PAP*** *– Paperverine ;*
NOS *– Noscapine,* ***COD*** *– Codeine,* ***PAP*** *– Papaverine,****HC*** *–Hydrocotarnine,* ***MEC*** *–Meconine,*
AHE*- Anhydroecgoninemethyl ester,* ***MEG*** *– Methyecgonine,* ***PEG****-Pseudoecgoninemethyl ester*

වගු අංක 05 වීදි හෙරොයින් සාම්පල වල හඳුනා ගත් එකතු කල ද්‍රව්‍ය හා තනුකාරක

ප්‍රදේශය	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
අනුරාධපුරය (අනුරාධපුරය)	-	-	CAF	-	-	-	-	-	CAF DIZ	-	-	-
අනුරාධපුරය (අනුරාධපුරය) 1	-	-	-	-	-	ACT	-	-	-	-	-	-
අනුරාධපුරය (අනුරාධපුරය) 2	-	-	-	-	-	CAF ACT	-	-	-	-	-	-
කොළඹ (අවිස්සාවෙල්ල)	CAF ACT	-	-	-	-	-	-	-	-	-	-	-
කොළඹ (කොළඹ)	-	-	CAF	-	-	-	-	-	CAF ACT	-	CAF DIZ ACT	CAF ACT
කොළඹ (මරදාන) 1	-	-	-	-	-	CAF	-	-	-	-	-	-
කොළඹ (මරදාන) 2	-	-	-	-	-	-	-	-	-	-	-	-
කොළඹ (වැල්ලවත්ත)	-	-	-	-	-	-	CAF ACT	-	-	-	-	-
ගාල්ල (ගාල්ල)	-	-	CAF	-	-	CAF DIZ	-	-	-	-	-	ACT
ගාල්ල (මීතියාගොඩ)	-	-	-	-	-	-	-	-	-	-	-	-
ගම්පහ (ගම්පහ)	CAF ACT	-	ACT	-	-	CAF	CAF ACT	-	CAF	-	CAF DIZ ACT	CAF ACT
ගම්පහ (මීගමුව)	CAFD IZ	-	-	-	-	-	-	-	-	-	CAF	CAF ACT
ගම්පහ (කැලණිය) 1	-	-	-	-	-	-	-	-	-	-	-	-
ගම්පහ (කැලණිය) 2	-	-	-	-	-	-	-	-	-	-	CAF	-
කළුතර (කළුතර)	ACT	-	CAF	-	-	CAF ACT	CAF	-	CAF DIZ ACT	-	-	-

මහනුවර (මහනුවර)	-	CAF	ACT	-	-	-	CAF	-	CAF ACT	-	-	CAF ACT
කෑගල්ල (කෑගල්ල)	-	-	-	-	-	-	-	-	-	-	CAF ACT	CAF ACT
කෑගල්ල (කෑගල්ල) 1	-	-	-	-	-	-	-	-	-	-	-	-
කෑගල්ල (කෑගල්ල) 2	-	CAF	-	-	-	-	-	-	-	-	-	-
කෑගල්ල (මාවනැල්ල)	CAFDIZ	-	-	-	-	-	-	-	-	-	-	-
කුරුණෑගල (මහව)	CAF	-	-	-	-	-	-	-	-	-	-	-
කුරුණෑගල (කුරුණෑගල)	-	CAF	CAF	-	-	CAF BZO	CAF DIZ	-	CAF DIZ	-	CAF DIZ ACT	CAF ACT
පොළොන්නරුව (පොළොන්නරුව)	-	-	-	-	-	-	-	-	-	-	CAF ACT	-
පුත්තලම (හලාවත)	-	-	-	-	-	CAFDIZ	CAF	-	CAF DIZ	-	-	-
පුත්තලම (හලාවත) 1	-	-	CAF DIZ	-	-	-	-	-	-	-	-	-
පුත්තලම (හලාවත) 2	-	-	CAF DIZ	-	-	-	-	-	-	-	-	-
පුත්තලම (පුත්තලම)	-	-	CAF	-	-	ACT	CAF DIZ	-	DIZ CAF	-	-	-
රත්නපුර(ඇහැලියගොඩ)	-	-	-	-	-	-	CAF	-	-	-	-	-
රත්නපුර (රත්නපුර)	-	CAF	-	-	-	CAF	-	-	-	-	CAF DIZ ACT	CAF ACT

***ACT** – Acetaminophen, **CAF**-Caffeine, **DIZ** – Diazepam*

1.2 අනෙකුත් පර්යේෂණ ව්‍යාපෘති

දැනට සිදුකරමින් පවතින මාදක සහ මනෝවර්ථක ද්‍රව්‍ය සම්බන්ධ පර්යේෂණ

සැක සහිත මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම පිණිස නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන සාම්පල මූලිකව පර්යේෂණ ගණනාවක් ජාතික මාදක රසායනාගාරය මඟින් සිදු කරනු ලබයි. ඇම්ෆෙටමින්, මෙත්ඇම්ෆෙටමින්, මෙතිලීන්ඩයොක්සි මෙත්ඇම්ෆෙටමින් (MDMA) සහ ලයිසර්ජික් ඇසිඩ් ඩයිඑතිල් ඇමයිඩ් (LSD) යන මත්ද්‍රව්‍ය මේ අතර තිබේ දැයි හඳුනා ගැනීම මෙහි විශේෂ අරමුණයි. මේවා තුලින් හඳුනා ගන්නා අනෙකුත් අපද්‍රව්‍යයන් හා රසායන වල කොටස් හඳුනා ගැනීමෙන් මේවා නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරන වෙනස් වූ රසායනික ක්‍රමවේදයන් හා භාවිතා කරන රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම ද විශේෂයෙන්ම ඉලක්ක කෙරේ.

ක්‍රීඩාවේදි භාවිතා කරන ක්‍රියාකාරිත්ව වර්ධක ඖෂධ (තහනම් උත්තේජක) සඳහා කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘති

තහනම් උත්තේජක භාවිතා කිරීම මගින් ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය සඳහා ඉතා ඉක්මනින් ප්‍රතිචාර දැක්වීම වැදගත් වන අතර ශ්‍රී ලංකාව මේ අර්බුදයට සාර්ථකව මුහුණ දීම පිණිස ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනය සමඟ එක්ව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උත්තේජක භාවිතාව සහ අවභාවිතාව මූලික කොට පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘතින් ජාතික මාදක රසායනාගාරය මඟින් දියත් කොට ඇත.

- මාදක ඖෂධ හා මනෝවර්ථක ද්‍රව්‍ය නීති විරෝධි ලෙස ජාවාරම් කිරීමට එරෙහි අංක 1 දරන 2008 පනතට අනුව පාලනයට නතු ද්‍රව්‍ය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ භාවිතාව සම්බන්ධ විශ්ලේෂණයන්.
- ලෝක තහනම් උත්තේජක විරෝධි ආයතනය මඟින් ලැයිස්තුගත කොට ඇති ද්‍රව්‍ය, ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් භාවිතා කිරීම පිළිබඳ විශ්ලේෂණයන්
- තහනම් උත්තේජක භාවිතය පිළිබඳ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීම සඳහා නිවාරණ අධ්‍යාපනය, නිවාරණ පිළිබඳ නව ක්‍රමෝපායයන් වර්ධනය කිරීම සහ පුහුණු වැඩසටහන් කිරීම.

මධ්‍යසාර පිළිබඳ පර්යේෂණ

ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් පරිභෝජනය කරන බියර් සාම්පල වල අඩංගු මද්‍යසාර ප්‍රතිශතයන් නිවැරදිව හඳුනා ගැනීම පිණිස ආරම්භ කර ඇති පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා සාම්පල විශ්ලේෂණයන් සිදු කරමින් තවදුරටත් මෙම ව්‍යාපෘතිය ඉදිරියට කර ගෙන යනු ලබයි.

කොකේන් , කොකේන් ව්‍යුත්පන්න සහසම්බන්ධ මත්ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ

කොකේන් සම්බන්ධ පර්යේෂණයන් කොකේන් හා එහි ව්‍යුත්පන්නයන් හඳුනා ගැනීම මූලික කොට සිදු කරනු ලබයි. එමෙන්ම මත්ද්‍රව්‍ය ගුණාංගී කරන අධ්‍යයනයන් නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලින් සපයන කොකේන් යැයි සැක කරන සාම්පල සඳහා සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකාවේ දි ප්‍රථම වරට සයිලොසීන් අඩංගු චොකලට් නිෂ්පාදන අනාවරණය කර ගැනීම සඳහා සිදු කල පර්යේෂණය

බුද්ධි මූලාශ්‍ර හරහා ශ්‍රී ලංකා පොලිස් විශේෂ ඒකකය මඟින් සැක සහිත චොකලට් සාම්පලයක් විශ්ලේෂණය සඳහා ඉදිරිපත් කළ අතර එහිදි සයිලොසීන් නම් මත්ද්‍රව්‍ය එහි අඩංගු බව හඳුනා ගන්නා ලදී. මෙය ශ්‍රී ලංකාවේ දී ප්‍රථම වරට හඳුනාගත් අතර ඒ සම්බන්ධ පර්යේෂණ මූලික වාර්ථාව 2016 අගෝස්තු 27 දින වෛද්‍ය නීති සංගමයේ වාර්ෂික සැසිවාරයේ දී “Detection of Psilocin in Chocolates ; Appearance for the First time in Sri Lanka” සංක්ෂිප්ත වාර්තාවක් ලෙස ප්‍රසිද්ධ කරන ලදී.

2. දුර්භාවිත මත්ද්‍රව්‍ය පාලනය සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන අදාළ අනෙකුත් අධිකාරීත්වයන් වෙත අවශ්‍ය විද්‍යාත්මක සහයන් ලබා දීම.

2.1 සැක සහිත මත්ද්‍රව්‍ය/ ඖෂධ විශ්ලේෂණය.

ජාතික මාදක රසායනාගාරය මඟින් 2016 වසර තුළ අවස්ථා 30 කදී නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලින් කරන ලද ඉල්ලීම්වලට අනුව මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල 78 ක් සඳහා විශ්ලේෂණයන් සිදු කොට ඇත.

ඉහත විශ්ලේෂණ ප්‍රතිඵල ජාතික හා අනෙකුත් වගකිව යුතු ආයතන සමඟ බෙදා ගනිමින් මත්ද්‍රව්‍ය ගැටළුව පිළිබඳ විවිධ මෙහෙයුම්, නව ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණ කිරීම, උපක්‍රමික විශ්ලේෂණ කිරීම, නීති ප්‍රතිපත්ති විශ්ලේෂණය හා සැකසුම් අවශ්‍යතා, නෛතික, සෞඛ්‍ය ගැටළු අවම කිරීම හා අරමුණු මුදුන්පත් කර ගැනීම යන කරුණු සඳහා භාවිතා කොට ඇත. මෙම තොරතුරු තුළ රටේ නීති බලගැන්වීම්, අපරාධ නිවාරණය හා සෞඛ්‍ය ප්‍රතිපත්ති සැකසීම් සඳහා අවශ්‍ය විද්‍යාත්මක අනාවරණයන් අන්තර්ගතය.

පහත ඇතුලත් කොට ඇත්තේ විෂ වර්ග අබිං සහ අන්තාරයකර ඖෂධ පාලන ආඥා පනත හා 2008 අංක 01 දරණ මාදක ඖෂධ සහ මනෝවර්ථක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත යටතේ ජාතික මාදක රසායනාගාරය මඟින් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන විසින් රසායනාගාරය වෙත යොමු කරන ලද මත්ද්‍රව්‍ය යැයි සැක සහිත සාම්පල පර්යේෂණ මූලිකව විශ්ලේෂණය කර නිකුත් කරන ලද වාර්තාවන්ය.

වගු අංක 6 ඃ 2016 වසර තුළදී විශ්ලේෂණය කරන ලද මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල සංඛ්‍යාවන්

		ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජුනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
ශ්‍රී ලංකා පොලිසිය / පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය	අවස්ථා සංඛ්‍යාව	01	01	01			01		02			01	
	සාම්පල සංඛ්‍යාව	02	01	03			01		02			02	
ශ්‍රී ලංකා නාවික හමුදාව	අවස්ථා සංඛ්‍යාව						01						
	සාම්පල සංඛ්‍යාව						01						
විශේෂ කාර්‍යය බලකාය	අවස්ථා සංඛ්‍යාව		01							01			
	සාම්පල සංඛ්‍යාව		01							02			
ශ්‍රී ලංකා රේගුව	අවස්ථා සංඛ්‍යාව			01		02			01	01	01		
	සාම්පල සංඛ්‍යාව			01		09			01	01	02		
ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව	අවස්ථා සංඛ්‍යාව									01			
	සාම්පල සංඛ්‍යාව									04			
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය	අවස්ථා සංඛ්‍යාව			01									
	සාම්පල සංඛ්‍යාව			01									
ශ්‍රී ලංකා සූරාබදු දෙපාර්තමේන්තුව	අවස්ථා සංඛ්‍යාව		01										
	සාම්පල සංඛ්‍යාව		07										
මහේස්ත්‍රාත් අධිකරණය මාලිඟාකන්ද	අවස්ථා සංඛ්‍යාව		01		01								
	සාම්පල සංඛ්‍යාව		01		06								
අ.ඖ.පා.ජ.ම	අවස්ථා සංඛ්‍යාව			01			03					02	
	සාම්පල සංඛ්‍යාව			01			03					02	
වෙනත්	අවස්ථා සංඛ්‍යාව										02	01	
	සාම්පල සංඛ්‍යාව										12	12	

එකතුව	අවස්ථා සංඛ්‍යාව	**01**	**04**	**04**	**01**	**02**	**05**	**03**	**03**	**03**	**04**
	සාම්පල සංඛ්‍යාව	**02**	**10**	**06**	**06**	**09**	**05**	**03**	**07**	**14**	**16**

මුළු පරීක්ෂණ සංඛ්‍යාව - *30*
මුළු සාම්පල සංඛ්‍යාව- *78*

2.2 මධ්‍යසාර සාම්පල විශ්ලේෂණය.

පහත දැක්වෙන්නේ ජාතික මාදක රසායනාගාරය මඟින් පර්යේෂණ මට්ටමෙන් සිදුකරණ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව හරහා එවනු ලබන මධ්‍යසාර විශ්ලේෂණය මඟින් ඒවායේ අඩංගු මෙතනොල් හා අනෙකුත් අපද්‍රව්‍ය පිළිබඳ වාර්ථා විස්තරයයි. මෙසේ සිදුකරණු ලැබූ අවස්ථා 16 ට අදාළව සාම්පල 67 ක විශ්ලේෂණයන් පහත දැක්වේ.

වගු අංක 7 2016 වසර තුළ දී විශ්ලේෂණය කරන ලද සාම්පල සංඛ්‍යාවන්

		ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජුනි	ජුලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	අවස්ථා සංඛ්‍යාව		02		03	02		01	01	01	01	01	02
	සාම්පල සංඛ්‍යාව		05		09	11		01	10	01	01	10	11
මධ්‍යම දුෂණ මර්ධන ඒකකය, වලාන, පානදුර	අවස්ථා සංඛ්‍යාව	01		01									
	සාම්පල සංඛ්‍යාව	01		07									
එකතුව	**පරීකෂණ සංඛ්‍යාව**	**01**	**02**	**01**	**03**	**02**		**01**	**01**	**01**	**01**	**01**	**02**
	සාම්පල සංඛ්‍යාව	**01**	**05**	**07**	**09**	**11**		**01**	**10**	**01**	**01**	**10**	**11**

මුළු අවස්ථා සංඛ්‍යාව*: 16*
මුළු සාම්පල සංඛ්‍යාව *: 67*

2.5 කේෂ්ත්‍ර පරීක්ෂණ කට්ටල වල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම හා නැවත සකස් කිරීම

කේෂ්ත්‍ර පරීක්ෂණ කට්ටල 7 ක්, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය සහ ශ්‍රී ලංකා රේගුව මඟින් ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා ආයතනයට යොමු කරන ලද අතර ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව රසායනික ප්‍රතිකාරක නැවත සකසා දෙන ලද අතර ඒවා පහත සඳහන් පරිදි වේ.

ආයතනය	කේෂ්ත්‍ර පරීක්ෂණ කට්ටල වර්ගය	සංඛ්‍යාව
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යයංශය	මාදක රසායන හඳුනා ගැනීමේ කට්ටල	02
ශ්‍රී ලංකා රේගුව	මාදක රසායන හඳුනා ගැනීමේ කට්ටල	03
	පුරෝගාමී රසායන හඳුනා ගැනීමේ කට්ටල	02

2.5 ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල වල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම හා නැවත සකස් කිරීම

මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු ඇසිම් අවසන් වූ පසු මත්ද්‍රව්‍ය තොග විනාශ කිරීම සඳහා අවසාන වශයෙන් විද්‍යාත්මක සනාථ කිරීම.
ජනවාරි මාසයේ මහාධිකරණ අංක 03 ගරු මහාධිකරණ විනිසුරුතුමාගේ දැනුම් දීම මත අදාල නඩු ඇසීම් අවසන් වූ පසු මත්ද්‍රව්‍ය තොග විනාශ කිරීම සඳහා අවසාන වශයෙන් විද්‍යාත්මක සනාථ කිරීම සහ මත්ද්‍රව්‍ය විනාශ කිරීමේ දී ජාතික මාදක රසායනාගාරයේ විද්‍යාත්මක කාර්ය මණ්ඩලයේ විද්‍යාත්මක සහය ලබා දෙන ලදී.

3. මත්ද්‍රව්‍ය පාලන කේෂ්ත්‍රය හා සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන් හා අදාල අනෙකුත් ආයතනයන් සඳහා කාර්යක්ෂමතා හා බුද්ධිමය වර්ධන වැඩසටහන.

පාලනයට යටත් ඖෂධ හා පුරෝගාමී රසායන ද්‍රව්‍ය අපනයනය, ආනයනය හා බෙදා හැරීම යන කාරණා වල දී මේ හා සම්බන්ධව කටයුතු කරන ආයතනයන්හි සේවය කරන නිළධාරීන්ගේ දැනුම හා පර්යේෂණ හැකියාව විද්‍යාත්මක පැතිකඩක් ඔස්සේ දැනුවත් කිරීමේ පුහුණු සැසි පැවැත්වීම ජාතික මාදක රසායනාගාරය විසින් සිදු කරනු ලැබේ. මෙහිදි දුර්භාවිත ඖෂධ හඳුනා ගැනීම හා නීතිය ක්‍රියත්මක කරන ආයතන නිළධාරීන්, විශේෂිතව පුහුණු කිරීම කරනු ලැබේ. මෙවැනි පුහුණු වැඩසටහන් / වැඩමුළු මත්ද්‍රව්‍ය පාලන කටයුතු සඳහා සම්බන්ධ අනෙකුත් ආයතන සඳහා ද ක්‍රියාත්මක කරන ලදි.

3.1 විද්‍යාත්මක පුහුණු වැඩසටහන් / වැඩමුළු

ශ්‍රී ලංකාවේ නීති විරෝධි මත්ද්‍රව්‍ය හඳුනා ගැනීමේ හා පුරෝගාමී රසායන ද්‍රව්‍ය පාලනය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම යන තේමාව යටතේ දෙදින විද්‍යාත්මක පුහුණු වැඩසටහන් ජාතික මාදක රසායනාගාරය විසින් සංවිධානය කරන ලද අතර මෙම පුහුණු වැඩමුළුවල අභිමතාර්ථ වුයේ,

1. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය නීති විරෝධි ලෙස ජාවාරම් කිරීම සම්බන්ධ මූලික දැනුම ලබා දීම.
2. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය සම්බන්ධ පුළුල් අවබෝධාත්මක දැනුම ලබා දීම.
3. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම සම්බන්ධ කේෂ්ත්‍ර පරීක්ෂණ කට්ටල භාවිතා කරමින් ප්‍රායෝගික දැනුම ලබා දීම.
4. මත්ද්‍රව්‍ය වල නූතන ආකාර සම්බන්ධව සහභාගි වන්නන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.

3.2 වෙනත් ආයතන සඳහා පුහුණු වැඩසටහන්

දිවයිනේ ඖෂධහල් වල අලෙවි කරනු ලබන මත් විය හැකි ඖෂධ අවභාවිතාව පිළිබඳ විද්‍යාත්මක විග්‍රහයක් හා විශ්ලේෂණයන් කාලීනව සිදුකිරීම ඉතා වැදගත්කමක් උසුලයි. මෙහිදි ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මනෝ වෛද්‍ය ඒකකයේ සිසුන් හට මේ පිළිබඳ පුහුණු වැඩසටහන් අඛණ්ඩව සිදුකරනු ලබයි. මීට අමතරව මත්ද්‍රව්‍ය කළමණාකරන ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලාව හදාරන සිසුන් සඳහා ද විශේෂිත දේශන හා පුහුණු සැසි පවත්වනු ලැබීය.

2016 වසරේදි සිදු කරනු ලැබූ මෙම වැඩමුළු වගු අංක 8 වගුවෙන් විස්තර කෙරේ.

		ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය	පුහුණු වැඩමුළු සංඛ්‍යාව		01	01	01	01	01		02	01		01	01
	සහභාගි වූ සංඛ්‍යාව		18	20	20	21	20		39	18		17	18
යාපනය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා පීඨය	පුහුණු වැඩමුළු සංඛ්‍යාව												01
	සහභාගි වූ සංඛ්‍යාව												31
ශ්‍රී ලංකා නාවික හමුදාව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව		02	04									
	සහභාගි වූ සංඛ්‍යාව		98	194									
ශ්‍රී ලංකා පොලිසිය	පුහුණු වැඩමුළු සංඛ්‍යාව				01		01		01	01	01		
	සහභාගි වූ සංඛ්‍යාව				44		56		41	29	53		
ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව		01	01		01	01						01
	සහභාගි වූ සංඛ්‍යාව		37	40		38	35						42
සුරා බදු දෙපාර්තමේන්තුව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව							01	01		01	02	02
	සහභාගි වූ සංඛ්‍යාව							79	92		41	83	69
ජාතික ශිෂ්‍යභට බලකාය (ශ්‍රී ලංකා)	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	01											
	සහභාගි වූ සංඛ්‍යාව	50											
මත්ද්‍රව්‍ය කළමණාකරන ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන්	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	01											
	සහභාගි වූ සංඛ්‍යාව	35											
මත්ද්‍රව්‍ය කළමණාකරන සහතික පත්‍ර පාඨමාලාව හදාරන සිසුන්	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	02		01		01		02	02			02	
	සහභාගි වූ සංඛ්‍යාව	49		26		37		87	70			66	
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය	පුහුණු වැඩමුළු සංඛ්‍යාව							01					
	සහභාගි වූ සංඛ්‍යාව							13					
බන්ධනාගාර දෙපාර්තමේන්තුව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව				01	01	01	01					
	සහභාගි වූ සංඛ්‍යාව				38	40	40	42					
දකුණු ආසියානු තාක්ෂණ හා වෛද්‍ය විද්‍යා ආයතනය	පුහුණු වැඩමුළු සංඛ්‍යාව						01						
	සහභාගි වූ සංඛ්‍යාව						04						
ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන වල හෙද හෙදියන්	පුහුණු වැඩමුළු සංඛ්‍යාව												
	සහභාගි වූ සංඛ්‍යාව												
මාධ්‍යවේදීන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ හා	පුහුණු වැඩමුළු සංඛ්‍යාව												01

පුහුණු	සහභාගි වූ සංඛ්‍යාව												50
එකතුව	පුහුණු වැඩමුළු සංඛ්‍යාව	04	04	07	03	04	05	05	06	02	02	05	06
	සහභාගි වූ සංඛ්‍යාව	134	153	280	102	136	155	221	242	47	94	166	210

මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව : *53*
සහභාගි වූ සංඛ්‍යාව : *1940*

3.3 මත්ද්‍රව්‍ය හා සම්බන්ධ නීති ක්‍රියාත්මක කරන ආයතන නිළධාරීන් සඳහා පවත්වනු ලබන පරිගණක පුහුණු වැඩසටහන්.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (NDDCB) එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යයාලයේ (UNODC) තාක්ෂණික සහාය සමඟින් මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවන් සවිමත් කිරීම සඳහා පරිගණක ආශ්‍රිත පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.

මෙම පුහුණු වැඩසටහන්වල අභිමතාර්ථය වූයේ පහත සඳහන් විෂයයන් සම්බන්ධ පුළුල් දැක්මක් ලබා දීම මඟින් නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම් වල ධාරිතාව සවිමත් කිරීමයි.

- සයුරේ, ගුවන හා භූමී මායිම් හරහා සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම් නැවැත්වීම.
- සොයා බැලීමේ ක්‍රමවේද.
- මත්ද්‍රව්‍ය පාලන තත්වයක් යටතෙ බෙදාහැරීමට ඉඩ දී එය පාලනය කිරීම.
- අවදානම් කළමණාකරනය.
- මත්ද්‍රව්‍ය හඳුනාගැනීම සහ පරීක්ෂණ කටයුතු

කෙසේ වුවද මෙම වැඩසටහන් නව සැකසුම් වලින් සමන්විත වූ අතර ඊ අධ්‍යාපන මොඩියුල සිංහළ මධ්‍යයෙන් 32ක් හා ඉංග්‍රිසි මධ්‍යයෙන් 86ක් වශයෙන් යාවත් කාලින කරන ලදී. මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරවීම සඳහා මෙම වැඩසටහන් අත්‍යවශ්‍ය වන අතර නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව ඉලක්ක ගත ක්‍රමවේද සහිත පුහුණු පාඨමාලාවන් හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතාව පිළිබඳ පාලන හා නිවාරණ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වැඩසටහන් මහත් පිටුවහලක් වනු ඇත.

ප්‍රමිතිගත කොට යාවත් කාලීන කරන ලද පුහුණු වැඩසටහන් මඟින් ඉතාමත් සර්ථක ක්‍රියාදාමයන් සහිත තාක්ෂණික උපක්‍රම යොදාගනිමින් එමෙන්ම බුද්ධිමය උපක්‍රම භාවිතා කරමින් මෙහෙයුම් කිරීම කලහැකි අතර එමඟින් ඉතාමත් සාර්ථකව නීතිය ක්‍රියාත්මක කලහැක. එමනිසා පරිගණක මූලික පුහුණු පාඨමාලාව තුල දැනුම වර්ධනය කිරීම අවබෝධය ඇති කිරීම සහ ඉලක්ක ගත කාරණා සඳහා වෙනස් වූ මොඩියුල මඟින් ඉතා ප්‍රතිඵල දායක සාර්ථක උපක්‍රමික විධික්‍රම සහිත පුහුණු වැඩසටහන් නීතිය ක්‍රියාත්මක කරන නිළධාරීන් හට ලබාදී ඇත. පහත වගුවෙන් පුහුණු වැඩසටහන් සම්බන්ධ විස්තර ඇතුලත් කොට ඇත.

වගු අංක 9 2016 වසරේ පරිගණක මූලාශ්‍ර පුහුණු පාඨමාලා සංඛ්‍යාව

		ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජුනි	ජුලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
ශ්‍රී ලංකා පොලීසිය	පූහුණු වැඩමුළු සංඛ්‍යාව			02	01		01	01					
	සහභාගි වූ සංඛ්‍යාව			18	09		09	08					
ශ්‍රී ලංකා නාවික හමුදාව	පූහුණු වැඩමුළු සංඛ්‍යාව						01			01	01	01	
	සහභාගි වූ සංඛ්‍යාව						09			09	09	09	
විශේෂ කාර්යාංශය බලකාය, ශ්‍රී ලංකා පොලීසිය	පූහුණු වැඩමුළු සංඛ්‍යාව							01	02				
	සහභාගි වූ සංඛ්‍යාව							03	05				
ශ්‍රී ලංකා රේගුව	පූහුණු වැඩමුළු සංඛ්‍යාව							01	02				
	සහභාගි වූ සංඛ්‍යාව							03	06				
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය	පූහුණු වැඩමුළු සංඛ්‍යාව							01	02				
	සහභාගි වූ සංඛ්‍යාව							03	06				
බන්ධනාගාර දෙපාර්තමේන්තුව	පූහුණු වැඩමුළු සංඛ්‍යාව							01	01				
	සහභාගි වූ සංඛ්‍යාව							09	08				
එකතුව	**පූහුණු වැඩමුළු සංඛ්‍යාව**			**02**	**01**		**02**	**05**	**07**	**01**	**01**	**01**	
	සහභාගි වූ සංඛ්‍යාව			**18**	**09**		**18**	**26**	**25**	**09**	**09**	**09**	

මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව : 20
සහභාගි වූ සංඛ්‍යාව : *123*

දුර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනාගැනීම සහ විශ්ලේෂණය.

මේ කර්තව්‍යයේදී ජීව විද්‍යාත්මක සාම්පල වල ඇති පාලනයට නතු ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය කොටස් හඳුනා ගැනීම සඳහා පුද්ගල හා ආයතන මට්ටමින් විශ්ලේෂණ කරනු ලබයි. විශ්ලේෂණයෙන් පසුව මත්ද්‍රව්‍ය වලින් නිදහස් බවට දෙනු ලබන සහතිකය රැකියා ලබා ගැනීම හා වෙනත් කටයුතු සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම රසායනාගාර වාර්තාව රෝග නිධාන හඳුනා ගැනීම ප්‍රතිකාර තීරණය කිරීම, මෙන්ම පුනරුත්ථාපනය කිරීම සඳහා පුද්ගලයන් යොමු කිරීම වැනි කාරණා වලදී ප්‍රයෝජනවත් වේ.

විෂ වර්ග අබිං සහ අන්තරායකර ඖෂධ පාලන ආඥා පනත හා 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත බලගැන්වීම උදෙසා ජාතික මාදක රසායනාගාරය විසින් විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පල වල විස්තරාත්මක ලේඛණයන් පහත වගු අංක 10 මඟින් ඉදිරිපත් කෙරේ.

වගු අංක 10 2016 වසරේදී විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක නියැදි සංඛ්‍යාව

		JAN	FEB	MAR	APR	MAY	JUN	JUL	AUG	SEP	OCT	NOV	DEC
රජයේ හා පෞද්ගලික රෝහල්	සාම්පල සංඛ්‍යාව	02	05	06	02	06	03	01	01	02	02	02	03
	පරීක්ෂණ සංඛ්‍යාව	03	06	15	04	11	08	02	02	04	06	03	06
ඩෙලිකා මෙඩිකෙයාර් මධ්‍යස්ථානය කොළඹ 08	සාම්පල සංඛ්‍යාව					01			01				
	පරීක්ෂණ සංඛ්‍යාව					05			05				
මහේස්ත්‍රාත් අධිකරණය	සාම්පල සංඛ්‍යාව	03	02	02	04		03	02		01	02		06
	පරීක්ෂණ සංඛ්‍යාව	03	04	02	04		05	04		02	02		10
අනෙකුත්	සාම්පල සංඛ්‍යාව	01											
	පරීක්ෂණ සංඛ්‍යාව	05											
එකතුව	**සාම්පල සංඛ්‍යාව**	**06**	**07**	**08**	**06**	**07**	**06**	**03**	**02**	**03**	**04**	**02**	**09**
	පරීක්ෂණ සංඛ්‍යාව	**11**	**10**	**17**	**08**	**16**	**13**	**06**	**07**	**06**	**08**	**03**	**16**

මුළු එකතුව සාම්පල සංඛ්‍යාව - 63
පරීක්ෂණ සංඛ්‍යාව - 121

ක්‍රියාකාරිත්ව වර්ධන ඖෂධ විශ්ලේෂණය, නව සංවර්ධන වැඩසටහන

අදවන විට රටට බරපතල ප්‍රශ්නයක් වී ඇති ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක / ඖෂධ භාවිතය සම්බන්ධයෙන් ගතහැකි ඉක්මන් පිළියමක් ලෙස, අනිසි ලෙස භාවිතා කරන ඖෂධ පාලනය, දුර්භාවිතය වැලැක්වීම පිළිබඳ වගකිවයුතු එකම රාජ්‍ය ආයතනය ලෙස අ.ඖ.පා.ජා.ම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක / ඖෂධ විශ්ලේෂණය ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහන ජාතික ක්‍රීඩා විද්‍යායතනය හා ඒකාබද්ධව පරීක්ෂණ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලදී.

5.1 රසායනාගාරයේ විශ්ලේෂණ හැකියාව ඉහළ මට්ටමකට ගෙන ඒම.

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දේහ තරල වල අඩංගු ක්‍රීඩාවේදී භාවිතා කරන තහනම් ද්‍රව්‍ය හා ඒවායේ පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා පහත දක්වා ඇති විශ්ලේෂණ හා තාක්ෂණික ක්‍රම භාවිතා කරන ලදී.

- විශ්ලේෂණ සහ පරීක්ෂණ ක්‍රමවේද සොයාගැනීම.
- පරීක්ෂණ ක්‍රමවේද වලංගු කිරීම.

5.2 ජීව විද්‍යාත්මක සාම්පල විශ්ලේෂණය.

ජාතික ක්‍රීඩා විද්‍යායතනය මඟින් ජීව විද්‍යාත්මක සාම්පල 01 ක් තහනම් ද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා යොමුකර ඇති අතර එය විශ්ලේෂණය කරන ලදී.

වගු අංක 11: අදාළ කාලය තුළදී විශ්ලේෂණ කළ ජීව විද්‍යාත්මක සාම්පල සංඛ්‍යාව

ආයතනය	සාම්පල සංඛ්‍යාව	**පරීක්ෂණ වර්ගය**	විශ්ලේෂණ කරන ලද ඖෂධ / පරිවෘත්තීය ද්‍රව්‍ය
ජාතික ක්‍රීඩා විද්‍යායතනය	03	Steroids	තහනම් ලැයිස්තුව WADA
එකතුව	03		

5.3 අතිරේක ආහාරමය නිෂ්පාදන වල අඩංගු තහනම් ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණ.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් භාවිතා කරන අතිරේක ආහාර නිෂ්පාදන වල ඇති තහනම් ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම රසායනාගාරය මඟින් සිදුකරන ලදී. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂෙත්‍රය තුළ මෙන්ම පාසැල් මට්ටමේද ක්‍රීඩක ක්‍රීඩිකාවන් භාවිතා කරන අතිරේක ආහාර නිෂ්පාදන තුළ තහනම් උත්තේජන ද්‍රව්‍ය අඩංගු බවට ලැබුණු තොරතුරු අනුව මෙවැනි ද්‍රව්‍ය විශ්ලේෂණ කොට එවැනි ද්‍රව්‍ය හඳුනා ගැනීම ක්‍රීඩාවේ ජීවගුණය පවත්වා ගැනීම හා ඉදිරියේ දී ඇතිවිය හැකි අපකීර්තිමය තත්වය නිසා රටට ඇතිවිය හැකි බලපෑම අවම කරනු වස් ජාතික කර්තව්‍යයක් ලෙස සලකා ජාතික මාදක රසායනාගාරය මෙම අතිරේක ආහාර නිෂ්පාදන විශ්ලේෂණ කටයුතු අරඹන ලදී. මෙහිදී ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනය / ශ්‍රී ලංකාවේ තහනම් උත්තේජක මර්ධන ආයතනය මඟින් ඉදිරිපත් කරනු ලැබූ සම්පල සඳහා විද්‍යාත්මක විශ්ලේෂණයන් පර්යේෂණ මට්ටමෙන් සිදු කරන ලදී. දිවයිනේ විවිධ අතිරේක ආහාර නිෂ්පාදන සමාගම් මඟින් ඉදිරිපත් කරන ලද සම්පල විශ්ලේෂණයන් වගු අංක 12 මඟින් දැක්වේ.

වගු අංක 12: අදාළ කාලය තුළ දී විශ්ලේෂණය කළ අතිරේක ආහාර නිෂ්පාදන සම්පල සංඛ්‍යාව.

ආයතනය	අවස්ථා සංඛ්‍යාව	සාම්පල සංඛ්‍යාව
NUTRISHOP, කොළඹ 06.	01	01
Mega Life Sciences (Pty) Ltd, කොළඹ 02.	01	01
Vitawell (Pvt) Ltd.	01	03
R & S Distributors (pvt) Ltd.	01	01
Total	**04**	**06**

දුර්භාවිත මත්ද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාර ප්‍රමිතිකරණය, පවත්වාගෙන යැම හා නඩත්තුකරණය.

6.1 ජාත්‍යන්තර කාර්යක්ෂමතා පරීක්ෂණ වැඩසටහන්.

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන මඟින් ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන නමින් පවත්වන ජාත්‍යන්තර රසායනාගාර කුසලතා පරීක්ෂණ වැඩසටහනට ජාතික මාදක රසායනාගාරය සහභාගී වේ. මෙම වැඩසටහනට සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල මත් ද්‍රව්‍ය විශ්ලේෂණයන් හා සම්බන්ධ රසායනාගාරයන් සහභාගී වේ.

මේ සඳහා අඛණ්ඩව සිදු කරන සහභාගීත්වය මඟින් ගෝලීය මට්ටමෙන් රසායනාගාරය සම්මතකරණය කර ගැනීම විශලේෂණ හැකියාවන් වර්ධනය කර ගැනීම, නිවැරදි තීන්දු ගැනීම පිළිබඳ වඩා නිවැරදි ප්‍රවිශ්ඨයක් ලබා ගනී. ස්ථාවර මෙන්ම ඒකාබද්ධ ප්‍රතිඵල හා වාර්තාකරණයන් සියලුම රසායනාගාර මඟින් ලබා ගැනීම මෙහිදී බලාපොරොත්තු වේ.

මේ සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලය මඟින් අවශ්‍ය නිර්දිෂ්ඨ සාම්පල සහ හඳුනා නොගත් සැක සහිත සාම්පල, සහ ජීව විද්‍යාත්මක සම්පල, හඳුනා ගැනීම සහ විශ්ලේෂණ කටයුතු සඳහා එවනු ලබයි.

<u>ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE)– 2015 සහ 2016</u>

මෙම කාලය තුළ ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන් 2015 අදියර 2 සහ 2016 අදියර 1 සඳහා රසායනාගාරය සහභාගී විය. මෙම සාම්පල සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණයන් සිදු කොට මාදක ද්‍රව්‍ය අඩංගු හෝ නැති බවට (සැක සහිත සාම්පල හා ජීව විද්‍යාත්මක සාම්පල) සඳහා අවශ්‍ය වාර්තා සපයන ලදී.

<u>ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) – 2015 අදියර 2</u>

ජාත්‍යන්තර සහායෝගීතා අභ්‍යාස වැඩසටහන් 2016 අදියර 1 ප්‍රතිඵල සමාලෝචනයට අනුව සුදුසු කම් ලබන රසායනාගාර ලැයිස්තු ගත කිරීම සඳහා රටවල් 60 ක රසායනාගාර 193 ක් සහභාගි වී ඇති අතර, වගු අංක 13 මඟින් ජාතික මාදක රසායනාගාරයේ ප්‍රතිඵල ඇගයීම පහත දැක්වේ.

***Table 13**: Evaluation results of Round 1 of ICE program 2016*

Test	Z Score
Methamphetamine	0.7
Cocaine	- 0.8

Satisfactory Limit of /Z / Score :< 2

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) – 2015 අදියර 1

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) – 2016අදියර 1 ප්‍රතිඵල සමාලෝචනයට අනුව සුදුසුකම් ලබන රසායනාගාර ලැයිස්තු ගත කිරීම මේ සඳහා රටවල් 68 ක රසායනාගාර 220 සහභාගි වී ඇති අතර වගු අංක 14 මඟින් ජාතික මාදක රසායනාගාරයේ ප්‍රතිඵල ඇගයීම දැක්වේ.

***Table 14**: Evaluation results of Round 1 of ICE program 2016*

Test	Z Score
Cocaine	1.2
Metheledioxymethamphetamine (MDMA)	- 0.7

Satisfactory Limit of /Z / Score :< 2

7.2 ISO 9001 තත්ත්ව කළමණාකරන සහතිකය

මේ සඳහා රසායනාගාරය සුදානම් කිරීම රසායනාගාරයෙහි විද්‍යාත්මක විශ්ලේෂණ කිරීමට ඇති හැකියාව වර්ධනය කිරීමෙන්ද ක්‍රීඩා සාම්පල විශ්ලේෂණය සිදු කිරීම උසස් මට්ටමක පවත්වා ගනිමින් ද කළමණාකරන කටයුතු විධිමත් කිරීමෙන්ද තහවුරු කොට ඇත.

මේ අනුව අවශ්‍ය පළමු විගණනය මේ වන විට සිදුකර ඇති අතර, මේ වන විට එම විගණනයට අනුව නිවැරදි කිරීම් සිදු කරමින් පවති.

වගු අංක 15 ජාතික මාදක රසායනාගාරයේ සේවා ලබා දෙමින් 2016 වසර සඳහා සිදු කළ ඉපයීම් සම්බන්ධ තොරතුරු පහත වගුවේ දැක්වේ.

විශ්ලේෂණ ආකාරයන්	*රු.*
මධ්‍යසාර සාම්පල විශ්ලේෂණය	*352,500.00*
දූර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ විශ්ලේෂණය	*66,000.00*
ක්‍රීඩාවේ දී භාවිතා කරන තහනම් උත්තේජක වල පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ විශ්ලේෂණය	*8,000.00*
අතිරේක ආහාරමය නිෂ්පාදන වල අඩංගු තහනම් ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණ	*150,000.00*
කේෂ්ත්‍ර පරීක්ෂණ කට්ටල වල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම හා නැවත සකස් කිරීම	*25,000.00*
එකතුව	***601,500.00***

8.7 පුරෝගාමී පාලන අධිකාරිය

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීම නිසි බලධාරියා ලෙස පුරෝගාමී පාලන අධිකාරිය විසින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයන අපනයන හා ව්‍යාප්තිය පාලනය කිරීම පිණිස පහත සඳහන් කාර්යන් වල නියැලෙනු ලබයි...
1.බලපත්‍ර නිකුත් කිරීම

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ ලයිස්තුගත කර ඇති වගු අංක 1 සහ 11 සඳහන් ද්‍රව්‍ය ආනයනය හෝ අපනයනය සඳහා සෑම පුද්ගලයෙකුම පුරෝගාමී පාලන අධිකාරියේ බලපත්‍ර ලබාගත යුතුය.

11. පරිශ්‍ර ලියාපදිංචිය

බලපත්‍ර ලාභී සෑම ආනයන අපනයන කරුවෙකු ම පනතේ ලයිස්තු ගත කර ඇති වගු අංක 1 සහ 11 සඳහන් ද්‍රව්‍යයන්ට අදාල කටයුතු සිදු කෙරෙන ගබඩා පරිශ්‍රයන් ලියාපදිංචි කළයුතුය.

111. අධීක්ෂණය සහ පිරීක්සුම

පනතේ ලයිස්තුගත කරඇති වගු අංක 1 සහ 11 සඳහන් ද්‍රව්‍යයන් ගබඩාකර ඇති පරිශ්‍රයන් සහ ඊට අදාළ කාර්යන් ත්‍රෛමාසිකව පරීක්ෂාවට ලක් කළයුතුය.

අධිකාරිය විසින් .....

- ❖ සමාගම් පරීක්ෂා කිරීම.
- ❖ සමාගම් ලියාපදිංචි කිරීම.
- ❖ මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය බලාත්මක කරන අධිකාරීන් සහ අනෙකුත් මත්ද්‍රව්‍ය/ පූර්වජ රසායන ද්‍රව්‍ය හා කටයුතු කරන නියෝජිත ආයතන වල ක්‍රියාකාරීත්වය ඉහළනැංවීම.
- ❖ පූර්වජ රසායන ද්‍රව්‍යයන් අපහරණ සඳහා විද්‍යාත්මක නිර්දේශ සැපයීම

සමාගම් පරීක්ෂා කිරීම

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති ලයිස්තු ගත කර ඇති වගු අංක 1 සහ 11 සඳහන් ද්‍රව්‍යයන් ගබඩා කර ඇති පරිශ්‍රයන් පුරෝගාමී පාලන අධිකාරිය විසින් පරීක්ෂාවට ලක්කරන ලදී. එසේම පූර්වජ රසායන අංශයේ ලියාපදිංචිය සම්පූර්ණ කරන ලද ආයතන වල වාර්තා සහ උපාංග ආදිය පරීක්ෂා කරනු ලැබේ. ඒ අනුව 2016 වර්ෂය තුලදී පහත සඳහන් අධීක්ෂණ කටයුතු සිදුකරන ලදී.

මාසය	පිරික්සුම
ජනවාරි පෙබරවාරි	01
මාර්තු	01
අප්‍රේල්	01
මැයි	00
ජුනි	09
ජුලි අගෝස්තු සැප්තැම්බර්	26
ඔක්තෝම්බර් නොවැම්බර්	08
දෙසැම්බර්	09
මුළු ගණන	54

සමාගම් ලියාපදිංචි කිරීම

ආනයනකරුවන්	106
අපනයනකරුන්	05
අවසන් භාවිතා කරන්නන්	651
වෙළෙන්දන්	102
පරිශ්‍ර	181
මුළු ගණන	1045

9. ආදායම් ප්‍රකාශය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

		2016 රු.	2015 ශත
ආදායම්	සටහන් අංක		
රාජ්‍ය පුනරාවර්ථන ප්‍රදාන	සටහන 1	201,401,000.00	170,633,833.00
වෙනත් ආදායම්	සටහන 2	10,080,128.92	8,069,703.79
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය	සටහන 3	539,282.80	
විදේශ ප්‍රදාන පුනරාවර්ථන		214,020.00	105,900.00
HONLEA සඳහා ලද ප්‍රදාන		12,720,000.00	
		224,954,431.72	178,809,436.79
වියදම්			
පුද්ගල හා පරිපාලන පිරිවැය	සටහන 4	141,182,640.37	110,700,459.23
මෙහෙයුම් පිරිවැය	සටහන 5	60,071,962.28	36,738,974.55
දේශීය / විදේශීය ආයතන දායකත්වය	සටහන6	610,000.00	466,000.00
නිවාරණ අධ්‍යාපන අංශය පිරිවැය	සටහන 7	3,484,539.81	4,185,199.44
ප්‍රතිකාර හා පුනරුත්ථාපන පිරිවැය	සටහන 8	16,932,895.54	15,634,079.65
පර්යේෂණ අධ්‍යන පිරිවැය	සටහන9	5,938,473.70	4,788,572.30
බාහිර සේවා පිරිවැය	සටහන10	5,309,283.12	3,872,679.40
රසායනාගාර පිරිවැය	සටහන 11	2,498,318.73	610,985.49
බන්ධනාගාර හා අනිකුත් මධ්‍යස්ථාන පිරිවැය	සටහන 12	109,359.30	161,235.00
මානව සම්පත් සංවර්ධන පිරිවැය	සටහන 13	593,221.00	732,235.83
මුල්‍ය පිරිවැය	සටහන 14	2,767,273.89	521,528.84
ක්ෂයවීම්	සටහන 15	22,639,477.99	14,508,322.69
මුළු මෙහෙයුම් පිරිවැය		262,137,445.73	192,920,272.42
අතිරික්තය හෝ හිඟය		(37.183,014.01)	(14,110,835.63)

10. ශේෂ පත්‍රය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

		2016		2015	
වත්කම්		**රු.**	**ශත**	**රු.**	**ශත**
ජංගම නොවන වත්කම්					
ස්ථාවර වත්කම්	සටහන 16		85,814,869.35		83,627,182.07
අයවිය යුතු ආපදා ණය හා උත්සව අත්තිකාරම්	සටහන 17		9,870,610.00		10,161,282.00
WIP නව ගොඩනැගිල්ල			556,142.20		
මෘදුකාංග			200,000.00		
ජංගම වත්කම්					
බැංකුවේ ඇති මුදල	සටහන 18	7,609,816.04		6,345,366.97	
තොග	සටහන 19	4,563,647.59		3,130,328.87	
ඉදිරියට කල ගෙවීම්	සටහන 20	2,663,796.35		2,461,846.52	
කොටසක් ගෙවීම්		-		11,449,488.44	
අත්තිකාරම්	සටහන 21	1,912,759.50		1,939,669.50	
තැම්පතු	සටහන 22	506,812.96		356,812.96	
			17,256,832.44		25,683,513.26
මුළු වත්කම්			**113,698,453.99**		119,471,977.33
හිමිකම් හා වගකීම්					
හිමිකම්					
රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානය	සටහන 23	20,000,000.00		17,233,000.00	
ප්‍රාග්ධන වෙන්කිරීම්	සටහන 24	65,503,710.68		63,343,346.09	
ප්‍රත්‍යාගණන වෙන්කිරීම්		25,184,005.17		25,184,005.17	
අවිනිශ්චිත ගිණුම		480,899.89		(480,899.89)	
අතිරික්තය / ඌනතාවය		(44,226,852.73)		(14,110,835.63)	
මුළු හිමිකම්			66,941,763.01		91,168,615.74
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික	සටහන 25		41,234,429.38		22,861,182.50
ජංගම වගකීම්					
ණයහිමියෝ	සටහන 26	67,000.00		51,000.00	
උපචිත වියදම්	සටහන 27	5,445,261.60		5,381,179.09	
රඳවාගත් මුදල්		10,000.00		10,000.00	
			5,522,261.60		5,442,179.09
මුළු හිමිකම් හා වගකීම්			**113,698,453.99**		119,471,977.33

ගිණුම්වලට අදාල ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මුල්‍ය ප්‍රකාශනයේ අත්‍යවශ්‍ය කොටසකි. අපි සහතික කරමු. ආයතනයෙහි මුල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරන්නේ දෙසැම්බර් 31 වන දිනට රාජ්‍ය කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දීමටයි. 2016 සහ එහි අතිරික්තය / (හිඟය) අවසන් වූ වර්ෂය සඳහා මෙම මුල්‍ය ප්‍රකාශයන් අනුකූලවේ. රජයේ නීති සහ රෙගුලාසි වලට අනුකූල වේ.

සහකාර අධ්‍යක්ෂ මුල්‍ය
අ.ඖ.පා.ජා.ම

සභාපති / අධ්‍යක්ෂ ජනරාල්
අ.ඖ.පා.ජා.ම

මෙම පිටු 1 සිට 3 දක්වා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙම මුල්‍ය ප්‍රකාශනවල අභ්‍යන්තර කොටස් සැදීමට පිටු පිළිබඳ සටහන්, මෙම මුල්‍ය වාර්ථා සැකසීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුයි. එම මුල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් සඳහා අත්සන් කරන ලදී.

මණ්ඩලික සමාජික
අ.ඖ.පා.ජා.ම

මණ්ඩලික සමාජික
අ.ඖ.පා.ජා.ම

11. ගිණුම්කරණ ප්‍රතිපත්ති

විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

1. සංස්ථාමය තොරතුරු
1.1 වසතිය සහ නීත්‍යානුකූලභාවය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන පනත ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම ආයතනය කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයෙ හි පිහිටා ඇත.

1.2. මණ්ඩලයේ බලතල

(අ) අන්තරායකර ඖෂධ අනිසි ලෙස භාවිතය වැළැක්වීම සහ පාලනයට සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක් නියාමනය කිරීම සහ සමාලෝචනය කිරීම සහ එවැනි ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් සහ නිර්දේශ ලබා දීම.

(ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස අවශ්‍ය වන විට පුද්ගලයන් සංවිධාන, රජයේ දෙපාර්මේන්තු සහ රජයේ සංස්ථා වලින් තොරතුරු සහ විස්තර කැඳවීම.

එසේ වුවද ,අධිකරණයෙන් ඉල්ලා සිටින විට හෝ පනතේ වෙනත් විධිවිධාන සමඟ අනුකූල වීම සඳහා හැරුණු විට මෙම වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ලබා ගත් කිසියම් තොරතුරක් හෝ විස්තර සාමාජිකයෙකු විසින් අනාවරණය නොකළ යුතුය.

(ඇ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය සහ විදේශීය මූලාශ්‍රයන්ගෙන් ආධාර සහ ප්‍රදාන ලබා ගැනීම.

(ඈ) අන්තරායකර මත්ද්‍රව්‍ය නිවාරණයෙහි සහ පාලනයෙහි යෙදී සිටින නියෝජිතායතනයන් හි ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

(ඉ) මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපන කාර්යන් ප්‍රවර්ධනය කිරීම සහ ළමුන් සහ වැඩිහිටියන් සඳහා ජාතික අන්තරායකර ඖෂධ අනිසි භාවිතය සහ නිවාරණය සම්බන්ධව අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම සහ.

(උ) අන්තරායකර ඖෂධ පාලන ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධිත ජාතික, කලාපීය සහ අන්තර්ජාතික සංවිධාන සහ නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම.
මණ්ඩලය සතු බලතල වේ.

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති
(සාමාන්‍ය)

2.1. සකස් කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන සඳහා බලපානු ලබන උද්ධමන සාධක සඳහා ගැලපුම් කර නොමැත. අදාළ තැන්හි භාවිත කළ විශේෂ ප්‍රතිපත්ති ඉදිරි සටහන් වල පැහැදිලි කර ඇත.

2.2. සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා පෙර වර්ෂයට අදාළ අවශ්‍ය සංසන්දනාත්මක සංඛ්‍යා ඉදිරිපත් කර තිබේ.

මූල්‍ය ප්‍රකාශනයන් හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ ප්‍රතිවර්ගීකරණය කිරීම සංශෝධනය කර ඇති විට, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් ලබා දීම පිණිස ප්‍රවර්ථන වර්ෂය සමඟ අනුකූල වන පරිදි සංසන්දනාත්මක අගයන් ද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

2.3. දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට හෝ සමුච්චිත ක්ෂය අගයට දක්වනු ලැබේ. සින්නක්කර ඉඩම් හැරුණු විට දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය අගය වෙන් කිරීම ඒවායේ ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ සමාන වාරික වලින් ලියා හැරීම පිණිස ඒවායේ ආගණනය කළ අගය මත පහත පරිදි ගණනය කරනු ලබයි.

	අනුපාතය (%)
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	5
ගෘහ භාණ්ඩ	10
කාර්යාල උපකරණ	20
සවිකිරීම්	20
පුස්තකාල පොත්	25
වාහන	25
මුළුතැන්ගෙයි උපකරණ	20
ගෙවතු වගා උපකරණ	20
එන්.එන්.එල් උපකරණ	20
වෙනත් පිරියත සහ උපකරණ	20

සරල මාර්ග ක්‍රමය මත වත්කම් මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීම සහ 2016 වර්ෂයට පෙර මිලදී ගත් වත්කම් සඳහා ඉවත් කරන දින වන තුරු ක්ෂය කිරීම් සිදු කරනු ලබන අතර 2016 වර්ෂයේ සිට ඉදිරියට මිලදී ගත් වත්කම් සඳහා මිලදී ගත් / ඉවත් කරන දිනය මත පදනම්ව ක්ෂය ගණනය කරනු ලැබේ.

මෝටර් වාහන ප්‍රත්‍යාගණන අගයන් මත දැක්වෙන අතර අනෙකුත් සියළුම වත්කම් වර්ගීකරණ පිරිවැයට දැක්වේ.

කල්බදු දේපළ	වටිනාකම රු.	කල්බදු කාලසීමාව
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය	4,350,000	අවුරුදු 99
පිටිපන ඉඩම	2,600,000	අවුරුදු 30
3 වන මහල, අංක 385C 3/1, රාජගිරිය	3,600,000	අවුරුදු 2
මහහේන වතුයාය	කල්බදු ගිවිසුම් අවසන් වී ඇති අතර තවත් අවුරුදු 30ක ඉදිරි කාල සීමාවක් සඳහා දීර්ඝ කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.	

2.4 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

සේවයේ පළමු වසරින් ආරම්භ වී අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සෑම නිළධාරියෙකුගේම මූල්‍ය වර්ෂයේ අවසන් මස වැටුපෙන් අඩක් මත පදනම්ව ගණනය කරන ලද අගයකට සමානව පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන මෙම මූල්‍ය ප්‍රකාශයන් මඟින් සලසා ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ අඛණ්ඩ වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත පමණක් නිළධාරියෙකුට පාරිතෝෂික ගෙවනු ලැබීමට හිමිකම් ලබනු ඇත.

2.5 වෙළඳ ලැබීම්

වෙළඳ ලැබීම් සටහන් කරනු ලබන්නේ අපේක්ෂිත ලැබිය හැකි වටිනාකමටය. වසර අවසාන වන විට පවතින සියළුම නොපියවූ මුදල් හි සමාලෝචනයක් මත පදනම්ව අඩමාන ලැබීම් සඳහා ඇස්තමේන්තුවක් සකස් කරනු ලබයි. හඳුනාගත් වර්ෂය තුළදී බොල් ණය කපා හැරේ.

2.6 මුදල් සහ මුදල් හා සමාන අයිතම

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අරමුණු සඳහා මුදල් හා සමාන අයිතම ලෙස අතැති මුදල් බැංකු තැන්පතු, බැංකු අයිරාවන් හි ශුද්ධ ලාභය අන්තර්ගත වේ. ශේෂ පත්‍රයේ ජංගම බැරකම් තුළ ණය ගැනීම යටතේ බැංකු අයිරාවන් ඇතුළත් කර ඇත.

2.7 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සියළුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශයෙහි අවශ්‍ය ගැළපීම් සහ හෙළි කිරීම් සිදු කරනු ලබයි.

2.8 බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දිනට හඳුනාගත් සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කරනු ලබන අතර පවතින බවට හඳුනාගන්නා ලද එහෙත් මුදල නිවැරදි නිශ්චය කළ නොහැකි බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසනු ලැබේ.

2.9 ඊ.පී.එෆ් සහ ඊ.ටී.එෆ් සඳහා ප්‍රතිපාදන

සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට දායකත්වය ලැබීමට සේවකයන් සුදුසුය. සේවකයන්ගේ දළ වැටුප මත මණ්ඩලය විසින් ඊ.පී.එෆ් සහ ඊ.ටී.එෆ් සඳහා පිළිවෙලින් 12% සහ 3% බැගින් දායකත්වය සපයනු ඇත.

2.10 ආදායම

2. 10. 1 පුනරාවර්ථන ස්වරූපයේ ප්‍රතිපාදන

පුනරාවර්ථන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලද ප්‍රතිපාදන ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර මණ්ඩලය විසින් උපයාගනු ලබන සියලු ආදායම් වෙනත් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශන වලට සෘජුවම හඳුනාගනී.

2.10.2 ප්‍රාග්ධන ස්වරූපයේ ප්‍රතිපාදන

ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලබා දෙන ප්‍රතිපාදන අදාළ වියදම් වාර්තා කිරීම මඟින් අඩුකොට ඇත.

2.11 වියදම්

වියදම ඉක්මවූ ආදායම ගණනය කිරීමේදී මණ්ඩලය පවත්වා ගෙන යාම වෙනුවෙන් දරන ලද පුනරාවර්ථන ස්වරූපයේ සියලුම වියදම අදායමට අය කරගෙන ඇත.

2.12 භාණ්ඩ තොග

භාණ්ඩ තොග පිරිවැයට හඳුනාගනී.

3. ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම.

3.1 ක්ෂය ප්‍රතිපත්තිය

2016 වර්ෂයේ සිට මිල දී ගත් වත්කම් සඳහා ක්ෂය ක්‍රමය මිල්දී ගත් වර්ෂයේ දී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීමේ ක්‍රමයේ සිට මිල්දී ගත් වර්ෂයේදී දින පදනම මත ක්ෂය කිරීමේ ක්‍රමයට වෙනස් වේ.

4. මුදල් ප්‍රවාහ ප්‍රකාශ

වක්‍ර ක්‍රමය උපයෝග කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර ඇත. මුදල් හා මුදල් සමාන අයිතම සඳහා මණ්ඩලයේ බැංකු ශේෂයන් අන්තර්ගත වේ.

12. විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } එල්ඔආර්/සී/එන්ඩීඩීසීබී/2016/17

මගෙ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2017 සැප්තැම්බර් 14 දින

NATIONAL DANGEROUS DRUGS CONTROL BOARD ★ CHAIRMAN ★ 28 SEP 2017

ATTENTION
AD F
CHAIRMAN

සභාපති,
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත් - 1.ලේකම් - නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය
2.ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. | එල්ඕආර්/බී/එන්ඩීඩීසීබී/2016/17 | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date | 2017 සැප්තැම්බර් 28 දින

ATTENTION
CHAIRMAN

NATIONAL DANGEROUS DRUGS CONTROL BOARD ★ CHAIRMAN ★ 28 SEP 2017

සභාපති,
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ඇදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනතේ 12 (4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රතිකාශයට පත් කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2017 ජුනි 15 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයේ 14 ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවය ඇති විට ඒවා වත්කම් ලෙස හඳුනාගත යුතු වුවත්, ආයතනය විසින් දැනට භාවිතා කරමින් පවතින ඉඩම් දෙකක වටිනාකම් තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 87 ඡේදය ප්‍රකාරව, ආයතනයේ ඉඩම් සම්බන්ධයෙන් පහත සඳහන් හෙළිදරව් කිරීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

- අයිතිය මත පැනවී ඇති සීමාවන් සහ වගකීම් සඳහා ආරක්ෂණයන් ලෙස ප්‍රතිඥා දී ඇති දේපළ, පිරියත හා උපකරණ පැවැත්ම හා අගයන්
- දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම සඳහා වූ ගිවිසුම් ගත බැඳීම් ප්‍රමාණය

(ඇ) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.39,282,116 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්

නවදැල්වත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඌ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය ආංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිඅගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් සඳහා ප්‍රමාණාත්මකව වෙන්කිරීම් කර නොතිබීම නිසා උපචිත වියදම් රු. 402,815කින් ඉක්මවා 2017 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී විදේශ සංචාරයක් වෙනුවෙන් වියදම් දැරීම සඳහා බැංකුව වෙත රු.1,045,992 ක ස්ථාවර නියෝගයක් ලබා දී තිබියදී එම මුදල උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රමාණය ලෙජරය අනුව රු.22,616,678 ක් වුවද ආදායම් ප්‍රකාශනය හා ස්ථාවර වත්කම්වලට අදාල උපලේඛනය අනුව රු.22,639,478 ක් වශයෙන් අගයන් දෙකක් දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල තුල්‍යතාවය පිළිබඳ ගැටළුකාරී විය.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය අවසානයට ගිණුම්වල දක්වා ඇති වත්කම්වල වටිනාකම් සඳහා ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛනවල වටිනාකම් අතර වත්කම් කාණ්ඩ හතරක රු. 497,071 ක් වැඩියෙන් හා වත්කම් කාණ්ඩ තුනක රු. 510,533 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ අවසාන ගිණුමේ දක්වා ඇති ක්ෂය වටිනාකම හා ආයතනය විසින් ක්ෂය ගණනය කිරීමේ උපලේඛනය අනුව දක්වා ඇති ක්ෂය වටිනාකම් අතර රු. 6,685,931 ක ශුද්ධ වෙනසක් පැවතුණි.

(ඇ) වත්කම් කාණ්ඩ පහක වත්කම් ලේඛනය සහ ලෙජරය අතර වටිනාකමේ රු. 1,928,853ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) ශේෂ පත්‍රයේ ලැබියයුතු ආපදා ණය හා විශේෂ අත්තිකාරම් ලෙස රු.9,870,610 ක් දක්වා තිබූ නමුත් එහි උපලේඛනය (සටහන් අංක 17) අනුව එම ශේෂ එකතුව රු.9,858,175 ක් වූයෙන් රු.12,435 ක වෙනසක් පැවතුණි.

2.2.4 අවිනිශ්චිත ගිණුම්

ඉකුත් වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.480,900 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

විෂයය	වටිනාකම	ඉදිරිපත් නොවූ විගණන සාක්ෂි
	(රු.)	
(අ) ඉඩම්	11,067,487	ඔප්පු සහ බදු ගිවිසුම්
(ආ) රසායන ද්‍රව්‍ය තොගය	2,535,326	තොග සත්‍යාපන වාර්තා

2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 10 කට වැඩි කාලයක් අය කර ගැනීමෙන් තොරව පැවති අත්තිකාරම් ශේෂ රු.1,782,060 ක් වූ අතර එම ශේෂයන් කුමන වර්ෂයේ සිට පැවතෙන්නේද යන්න නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

(ආ) බාහිර ආයතන 11 ක තැන්පත් කර තිබූ එකතුව රු.184,313 ක තැන්පතුවලට අදාල ලදුපත් මණ්ඩලය සතු නොවූ බැවින් එම තැන්පතු මුදල් අයකර ගැනීම පිළිබඳ අවදානමක් පැවතුනි.

2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම්
(අ) 2007 අංක 54 දරන ඖෂධ වලට ඇබ්බැහි කැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) කිරීම පිළිබඳ පනතේ 4(3) වගන්තිය	පුද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන විසින් සිදුකරනු ලබන ප්‍රතිකාර පිළිබඳ සාර්ථකභාවය සම්බන්ධයෙන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන අධ්‍යක්ෂක විසින් ඉදිරිපත් කළ යුතු කාලීන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 104(3)	වාහන අනතුරු සම්බන්ධයෙන් වූ වාර්තා විගණකාධිපති වෙත එවා නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 109 (1)(ආ)	වාහන අනතුරු සම්බන්ධයෙන් වූ පාඩු විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 569 III වැනි පංතිය	විවිධාකාර ස්වරූපයේ තැන්පතු "විවිධ තැන්පතු" නමින් පොදු ගිණුමක සටහන් කල යුතු වුවත් මණ්ඩලය විසින් රු. 506,813ක් වූ තැන්පතු වෙනුවෙන් එවැනි ගිණුමක් නඩත්තු කර නොතිබුණි.
(iv) මුදල් රෙගුලාසි 751	ලැබෙන සියළුම භාණ්ඩ වහාම භාණ්ඩ ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට මිලදී ගෙන තිබුණු රු.888,995 ක් වටිනා භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛන වල ඇතුළත් කර නොතිබුණි.

(v)	මුදල් රෙගුලාසි 754	සෑම මුදල් වර්ෂයක් අවසානයේදී බඩු ලේඛන පොත් තුලනය කළයුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.
(ඇ)	1978 දෙසැම්බර් 09 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	වටිනාකම රු. මිලියන 74 ක්වූ වත්කම් සඳහා ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 37,183,014ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 14,110,836 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 23,072,178 කින් වර්ධනය වී තිබුණි. මෙහෙයුම් වියදම් රු.69,217,174 කින් වැඩි වී තිබීම ඌනතාවයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී අඛණ්ඩ මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබූ අතර 2012 වර්ෂයේදී රු. 15,013,481 ක් වූ එය සමාලෝචිත වර්ෂය අවසානයට රු.37,183,014 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 36,922,418 ක් වූ මණ්ඩලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු. 81,587,124 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනතේ අරමුණු පහත දැක්වේ.

* අන්තරායකර ඖෂධ නිවාරණ හා පාලනය කිරීම සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම හා සමාලෝචනය කිරීම සහ එවැනි ප්‍රතිපත්ති පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම හා සමාලෝචනය කිරීම, එවැනි ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

* මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍ර වලින් පරිත්‍යාග හා ආධාර භාර ගැනීම.

* අන්තරායකර ඖෂධ නිවාරණ හා පාලනයේ නිරතව සිටින නියෝජිතායතනවල කටයුතු සම්බන්ධීකරණය.

* මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු වැඩි දියුණු කිරීම සහ ළමුන් හා වැඩිහිටි පුද්ගලයන් සඳහා ජාතික මත්ද්‍රව්‍ය භාවිතය හා නිවාරණය පිළිබඳ අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම.

* අන්තරායකර ඖෂධ භාවිතය ව්‍යාප්තිය, ඒ සඳහා හේතු හා අන්තරායකර ඖෂධ භාවිතයෙන් ඇති වන නෛතික, වෛද්‍ය, සාමාජීය, සංස්කෘතික හා ආර්ථික ගැටළු පිළිබඳ පර්යේෂණ අධ්‍යන පැවැත්වීම හා ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීමට භාර ගැනීම, ඖෂධ පාලන කටයුතු වල නියැලී සිටින ජාතික කලාපීය හා අන්තර් ජාතික සංවිධාන හා නියෝජිතායතන සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් ජාතික මාදක රසායනාගාරයේ 2016 දෙසැම්බර් 31 දිනට කාර්යසාධනය පහත දැක්වේ.

2016 දෙසැම්බර් 31 දිනට

අංකය		අපේක්ෂිත ඉලක්කය	ලභා කරගත් සංඛ්‍යාව	ප්‍රතිශතය %
1.	වීථි හෙරොයින් වල මිල සහ පාරිශුද්ධතාවය අතර සම්බන්ධතාවය හඳුනාගැනීමට අදාළ විශ්ලේෂණ සහ වීථි හෙරොයින් වල නව තනුකකාරක අඩංගු බවට සිදුකරන ලද විශ්ලේෂණය	360	133	36.9
2. (i)	අතිරේක ආහාරමය නිෂ්පාදන සාම්පල විශ්ලේෂණය	-	06	-
(ii)	ක්‍රීඩාවේදී භාවිතා කරන ක්‍රියාකාරීත්ව වර්ධක ඖෂධවල පරිවෘත්තීය ද්‍රව්‍ය අඩංගු බවට සිදුකරන ලද ජීව විද්‍යාත්මක සාම්පල විශ්ලේෂණය.	-	01	-
3.	ඇල්කොහොල් සාම්පල විශ්ලේෂණය	-	67	-
4.	මාදක සහ මනෝවර්ථකවල පරිවෘත්තීය ද්‍රව්‍ය අඩංගු බවට ජීව විද්‍යාත්මක සාම්පල සඳහා කරනු ලබන විශ්ලේෂණ			
	සාම්පල ගණන	180	63	35.0
	පරීක්ෂණ ගණන	-	121	

5.	එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ වැලැක්වීමේ කාර්යාලය මගින් ලබාදී තිබෙන ඊ - අධ්‍යාපන වැඩසටහන් ගණන	48	20	41.7
	සහභාගි වූ සංඛ්‍යාව	-	123	
6.	(i) මාදක ඖෂධ සහ මනෝචර්ථක ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල සකස් කර දීම	60	07	11.7
	(ii) අධිකරණ කටයුතු සඳහා අවශ්‍ය විද්‍යාත්මක සේවාවන් ලබා දීම	-	01	-
	(iii) ශ්‍රී ලංකා රේගුව සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම	-	-	-
7.	පර්යේෂණ ප්‍රකාශන	-	01	-
8.	රසායනාගාරය මගින් සිදුකරනු ලබන පරීක්ෂණ ප්‍රමිතිකරණයට අනුව පවත්වා ගෙන යාම	/z/≤2	2016 පළමු වටයේ ප්‍රතිඵල ලැබීමට නියමිතයි	100

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යසාධන ක්ෂේත්‍රයන් 8 අතුරින් අතිරේක ආහාරමය නිෂ්පාදන සාම්පල විශ්ලේෂණය, ක්‍රීඩාවේදී භාවිතා කරන ක්‍රියාකාරිත්ව වර්ධක ඖෂධවල පරිවෘත්තීය ද්‍රව්‍ය අඩංගු බවට සිදුකරන ලද ජීව විද්‍යාත්මක සාම්පල විශ්ලේෂණය, ඇල්කොහොල සාම්පල විශ්ලේෂණය, මාදක ඖෂධ සහ මනෝචර්ථක ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල සකස් කර ලබාදීම, අධිකරණ කටයුතු සඳහා අවශ්‍ය විද්‍යාත්මක සේවාවන් ලබා දීම, ශ්‍රී ලංකා රේගුව සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම හා පර්යේෂණ ප්‍රකාශන යන ක්ෂේත්‍රවල ඉලක්ක ගත

සාම්පල සංඛ්‍යාව සඳහන් කර නොතිබීම නිසා කාර්යසාධනයේ ප්‍රගතිය විගණනයට තහවුරු කර ගත නොහැකි විය. තවද ක්ෂේත්‍ර 4 ක කාර්යසාධනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුනි.

(ආ) රසායනාගාරය මගින් සිදුකරනු ලබන පරීක්ෂණ ප්‍රමිතිකරණයට අනුව පවත්වාගෙන යාමේ නිරවද්‍යතාවය පෙන්වන පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබීමට නියමිතව පවතින බව දක්වා තිබුණද එහි කාර්යසාධනය සියයට 100ක් ලෙස දක්වා තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

තත්කාර්ය අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිම වූ විගස පියවිය යුතු වුවත් අත්තිකාරම් පියවීම සඳහා දින 14 සිට දින 141 දක්වා කාලයක් ගත කර තිබූ අතර රු.78,850 ක අත්තිකාරම් 2017 මාර්තු 15 දින වන විටත් පියවා නොතිබුණි. තවද දෙනලද අත්තිකාරම් මුදලින් සියයට 50 කට වඩා අඩුවෙන් වියදම් කර තිබූ අවස්ථා පැවතුනු අතර වටිනාකම රු.107,595 ක් වූ අත්තිකාරම් අදාල කාර්යය සඳහා වියදම් නොකර දින 02 ත් දින 141 ත් අතර කාලයක් අත රඳවාගෙන ආපසු පියවා තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයට ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2016 පෙබරවාරි මාසයේ සැලසුම් කර තිබුණ ද රු.2,068,605 ක ලිපි ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණේ 2016 නොවැම්බර් මාසයේදී වූ හෙයින් අවශ්‍යතාවයක් නොතිබියදී ලිපි ද්‍රව්‍ය ඇස්තමේන්තු කර තිබුණි.

(ආ) ජාතික මාදක රසායනාගාරයේ තොගය රජයේ රස පරීක්ෂක විසින් ගණනය කිරීමේදී තොග වාර්තාවේ රසායනික ද්‍රව්‍ය 13 ක වටිනාකම් රු. 89,343 කින් අධිගණනය වී තිබූ අතර රසායනික ද්‍රව්‍ය 9 ක වටිනාකම් රු.45,888 කින් ඌන ගණනය වී තිබුණි.

AGDSL Auditor General's Department

(ඇ) 2016 වර්ෂයේදී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් විදේශ ගමන් වියදම් සඳහා රු.4,823,223 ක් වැය කර තිබූ අතර, එම මුදලින් රු.3,067,602 ක් එනම් සියයට 64 ක් මණ්ඩලයේ සභාපති සඳහා පමණක් වැය කර තිබුණි. මෙම මුළු වියදම 2015 වර්ෂය හා සාපේක්ෂව සියයට 77 ක වැඩිවීමකි.

(ඈ) ඉහත වියදමට අමතරව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ UNDCP 1995 ව්‍යාපෘතියේ අරමුණු විගණනයට පැහැදිළි නොකර එම ව්‍යාපෘති මුදලින් රු.1,957,830 ක් අධ්‍යක්ෂ ජනරාල්ගේ විදේශ ගමන් සඳහා වැය කර තිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ බැංකු ජංගම ගිණුම් 06 කට අදාල එකතුව රු.9,330,322 ක ශේෂ මාස 05 සිට මාස 12 දක්වා උපයෝජනය කිරීමකින් තොරව නිෂ්කාර්යව බැංකු ගිණුම්වල රඳවා තිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2014 අප්‍රේල් 30 දින රු.2,971,405 ක් වැයකර හෝමාගම ප්‍රදේශයේ පර්චස් 40 ක ඉඩමක් මිලදීගෙන තිබුණ ද එය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඵලදායී කාර්යයක් සඳහා යොදා ගෙන නොතිබුණි.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

